# වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2020

## අධ්‍යාපන අමාත්‍යාංශය
## වැය ශීර්ෂය - 126

## - පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රය -

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402 හි 2.4.1. ඡේදයට අනුව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරන ලදි.

2021 ජූලි


නියාමන හා කාර්යසාධන සමාලෝචන ශාඛාව
සැලසුම් හා කාර්යසාධන සමාලෝචන අංශය
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

## අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන අංශ, තනතුරු හා නිලධාරීන් (2020.12.31 දිනට)

### අධ්‍යාපන අමාත්‍ය

ගරු මහාචාර්ය ජී.එල්.පීරිස් මැතිතුමා

### අධ්‍යාපන ලේකම්

මහාචාර්ය කේ.කපිල සී.කේ.පෙරේරා මයා

**පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රයට අයත් ප්‍රධාන අංශ හා නිලධාරීන්**

අතිරේක ලේකම් (ප්‍රතිපත්ති සැලසුම් හා කාර්යසාධන සමාලෝචන) - ආචාර්ය මධුරා එම්. වෙහැල්ල මිය

අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන) - එච්.යූ.ප්‍රේමතිලක මයා

අතිරේක ලේකම් (අධ්‍යාපන සේවා ආයතන) - ඩබ්.එම්.එන්.ජේ.පුෂ්පකුමාර මයා

අතිරේක ලේකම් (ප්‍රසම්පාදන ඉදිකිරීම් හා පාසල් සැපයීම් ) - කේ.ඒ.ඩී.ආර්.එන්. ජයසිංහ මිය

අතිරේක ලේකම් (පාසල් කටයුතු ) - එල්.එම්.ඩී. ධර්මසේන මයා

අතිරේක ලේකම් (ආයතන ) - පී.කේ.එස්.සුභෝදිනී මිය

අතිරේක ලේකම් (පාලන) - පී.එල්.පත්මකුමාර මයා

අධ්‍යක්ෂ ජනරාල් (මූල්‍ය ) - ඩී.එල්.ඒ. විජේනායක මයා

අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම් ) - ඒ. එම්.පී.එම්.බී.අතපත්තු මයා

ප්‍රධාන මූල්‍ය නිලධාරී - වයි.එම්.එස්.ගුණසේකර මයා

ප්‍රධාන අභ්‍යන්තර විගණක - කේ.ජී.එස්.පී.වීරකෝන් මයා

# පටුන

## පරිච්ඡේද 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය


1.1 හැඳින්වීම 01
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු 01
1.3 ප්‍රධාන කාර්යයන් 02
1.4 සංවිධාන සටහන 04
1.5 අමාත්‍යාංශය යටතේ පවතින දෙපාර්තමේන්තු 05
1.6 අමාත්‍යාංශය යටතේ පවතින ආයතන 05
1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 06
1.8 අධ්‍යාපන පද්ධතිය පිළිබඳ සංඛ්‍යා දත්ත සැකෙවින් - 2019 07


## පරිච්ඡේද 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම


2.1 විශේෂ ජයග්‍රහණ හා ළඟා කර ගත් ප්‍රගතිය 11
2.2 පවත්නා අභියෝග 31
2.3 ඉදිරි ඉලක්ක 32


## පරිච්ඡේද 03 - මූල්‍ය කාර්ය සාධනය


3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 35
3.3 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය 36
3.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශ 37
3.5 මූල්‍ය ප්‍රකාශ සටහන් 39
3.6 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 40
3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 40
3.8 මු.රෙ.208 ප්‍රකාරව වෙනත් දෙපාර්තමේන්තු සඳහා ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 41
3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 46
3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව 47


## පරිච්ඡේද 04 - කාර්ය සාධන දර්ශක


4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 65


## පරිච්ඡේද 05 - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය


5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු 69
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 70


## 06. මානව සම්පත් පැතිකඩ


6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 71
6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම 71
6.3 මානව සම්පත් සංවර්ධනය 72


## 07. අනුකූලතා වාර්තාව


7.1 අනුකූලතා වාර්තාව 79

## 01. පරිච්ඡේදය
## ආයතනික පැතිකඩ

### 1.1 හැඳින්වීම

පෙර පාසල් අධ්‍යාපනයේ සිට පාසල් අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය හා තෘතීක හා වෘත්තීය අධ්‍යාපනය යන ක්ෂේත්‍ර ඔස්සේ ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තීන් සකස් කර ක්‍රියාත්මක කිරීමේ හා වෙනස්වන ලෝකයට සරිලන සේ අධ්‍යාපනය ප්‍රතිනිර්මාණය කරමින් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ පුරෝගාමී වගකීම අධ්‍යාපන අමාත්‍යාංශයට පැවරී ඇත. අධ්‍යාපන අමාත්‍යාංශය එහි රාජ්‍ය අමාත්‍යාංශ වන කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය, අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දූරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය හා දහම් පාසල්, භික්ෂු අධ්‍යාපන, පිරිවෙන් හා බෞද්ධ විශ්වවිද්‍යාල රාජ්‍ය අමාත්‍යාංශය හා ඒ හා බැඳුණු ආයතන සමූහය සමගින් ද පළාත් මට්ටමේ අදාළ සියලුම ආයතන සමගින් ද එක්ව ප්‍රතිපත්තීන් හා ප්‍රතිසංස්කරණයන් ක්‍රියාත්මක කිරීම සඳහා ඒකාබද්ධ පුළුල් සැලසුම් ක්‍රියාවලියක් තුළ ක්‍රමෝපායයන් ක්‍රියාවට නංවයි.

සුවිශේෂී වශයෙන් පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ ව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත පැවරී ඇති වගකීම් අතර අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ නීති හා අණපනත්වලින් පැනවෙන විධිවිධාන හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම, පළාත් අධ්‍යාපන අධිකාරීත්වයන් සමඟ සහයෝගයෙන් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා වැඩසටහන් සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා පසුවිපරම් කිරීම, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය මානව හා භෞතික සම්පත් සැපයීම හා අධ්‍යාපන පද්ධතිය තුළ ප්‍රමිතීන් සහතික කිරීමට විධිමත් ඇගයීම් ක්‍රියාවලියක් ක්‍රියාවට නැංවීම ප්‍රධාන වේ. මෙහිලා ගුරු අධ්‍යාපනය හා ගුරු සංවර්ධනය අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රමුඛ කාර්යභාර්යක් වේ. පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක බව සහතික කිරීමට අත්‍යවශ්‍යයෙන් ම ලබා දිය යුතු ගුරුවරුන් ඇතුළු ව මානව සම්පත් මෙන්ම භෞතික සම්පත් ප්‍රමාණවත් ව සැපයීම හා විධිමත් සුපරීක්ෂණ ක්‍රියාවලියක් දියත් කිරීම අධ්‍යාපන අමාත්‍යාංශයට පැවරෙන ප්‍රධාන වගකීම කි.

අධ්‍යාපන අමාත්‍යාංශය හා රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ජාතික අධ්‍යාපන ආයතනය, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව හා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව යන ආයතනවලට පැවරී ඇති පාසල් විෂයමාලා සම්පාදනය, පෙළපොත් සම්පාදනය, ඇගයීම හා තක්සේරුකරණය වැනි වගකීම් පිළිබඳ පසු විපරම් කිරීම හා ගුණාත්මක තහවුරු ව පවත්වාගෙන යාම ද අමාත්‍යාංශයේ වගකීම් භාරයට අයත් වේ.

2020.08.09 දිනැති ගැසට් නිවේදනය අනුව අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යභාරය හා අනුබද්ධ ආයතන පිළිබඳ විස්තර පහත ඡේදවලින් දැක්වේ.

### 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, විෂයපථය හා අරමුණු

**දැක්ම**

ශ්‍රී ලාංකීය අනන්‍යතාවෙහි හවුල්කරුවන් වන දක්ෂ පුරවැසි පිරිසක් මගින් විශ්ව සමාජයේ විශිෂ්ටත්වය කරා එළඹීම.

**මෙහෙවර**

පාර්ශ්වකරුවන් තෘප්තිමත්භාවයට පත් වන අයුරින් කාර්යක්ෂමතාව හා උසස් ගුණාත්මකභාවයට යොමුවන අධ්‍යාපනයේ නවීකරණය කරන ලද නව්‍ය ප්‍රවේශයක් තුළින් ජාත්‍යන්තර ප්‍රවණතාවන්ට සරිලන පරිදි දක්ෂ පුරවැසි පිරිසක් බිහිකිරීම.

**විෂය පථය**

දැනුම පදනම් කරගත් සමාජ ආර්ථිකයක් කරා ශ්‍රී ලාංකීය ජනතාව නගා සිටුවීම සඳහා තිරසර අධ්‍යාපන ක්‍රමෝපායයන් මගින් ළමා මිතුරු අධ්‍යාපන, නවෝත්පාදන පදනම් කරගත් දැනුම හා විශිෂ්ට උසස් අධ්‍යාපන ක්‍රමයට අවශ්‍ය ඉඩ ප්‍රස්ථා අනාගත පරපුර වෙත විවෘත කර දීම.

**ආයතනයේ අරමුණු හා කර්තව්‍යයන්**

- "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුකූලව සහ රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වෙනත් ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා "දැනුමෙන් පිරිපුන් සමාජයක්" බිහි කිරීම සඳහා අදාළ රාජ්‍ය අමාත්‍යාංශය සඳහා ප්‍රතිපත්තිමය මග පෙන්වීම සිදු කිරීම, නියමිත නීති සහ අණපනත්වලට අනුකූලව අධ්‍යාපන විෂයයට අදාළ ප්‍රතිපත්ති සම්පාදනය, ජාතික අයවැය, රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙළ යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
- අධ්‍යාපන ප්‍රතිසංස්කරණය සඳහා ජනාධිපති කාර්ය සාධන බලකාය විසින් සැලසුම් කරන ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ආයතනික ව්‍යුහය ස්ථාපිත කිරීම.

## 1.3 ප්‍රධාන කාර්යයන්

- පෙර පාසල් අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය සම්පූර්ණ කරන තෙක්ම පැහැදිලි මාර්ග සැලැස්මක් සකස් කිරීම සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම ලබා දීම.
- සැම දරුවකුටම අධ්‍යාපනය සඳහා ප්‍රවේශ අයිතිය සහිත ගුණාත්මක අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපනය කිරීමට අවශ්‍ය පුළුල් ප්‍රතිසංස්කරණයක් ඇති කිරීම සඳහා ප්‍රතිපත්තිමය රාමුවක් ස්ථාපනය කිරීම.
- පාසල් ගුරුවරුන්ගේ පරිපාලන ගැටළු ක්ෂණිකව විසඳීම සඳහා දැනට පවතින අදාළ චක්‍රලේඛ විධිවිධාන, රීති, රෙගුලාසි සමාලෝචනය කොට යාවත්කාලීන කිරීම සහ පවතින ආයතනික ව්‍යුහය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ අධීක්ෂණ ඒකකයක් හරහා කටයුතු කිරීම.
- පාසල් අවශ්‍යතාවය සම්බන්ධයෙන් නැවත සමීක්ෂණයක් සිදු කොට ඒ අනුව පාසල් පද්ධතිය ප්‍රතිස්ථානගත කිරීම.
- ගුරුවරු අවශ්‍යතාවය පරිදි ස්ථානගත කිරීම සඳහා ප්‍රතිපත්තිමය විසඳුමක් ලබා දීම.
- විෂය බාහිර ක්‍රියාකාරකම් පාසල් තුළ ප්‍රචලිත කිරීම සඳහා ක්‍රීඩා හා තරුණ කටයුතු අමාත්‍යාංශය සමග වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා ගතවන කාලය අවම කිරීම සඳහා ක්‍රමවේදයක් සැකසීම.
- විශ්වවිද්‍යාල තුළ සහ නේවාසිකාගාරයන්හි පහසුකම් ඉහළ නැංවීමට කටයුතු කිරීම.
- දේශීය හා විදේශීය රැකියා වෙළෙඳපල ඉලක්ක කර ගනිමින් උපාධිධාරීන් බිහි කිරීම සඳහා සමස්ත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තිය තුළ විෂයමාලා සංශෝධනය කිරීම.
- විශ්වවිද්‍යාල සඳහා තොරතුරු තාක්ෂණ පහසුකම් ලබා දීම.
- මහපොළ හා ශිෂ්‍යාධාර සඳහා විධිමත් ක්‍රමවේදයක් යටතේ තෝරා ගැනීම හා එහි පහසුකම් පුළුල් කිරීම.
- සාගර විශ්වවිද්‍යාලය හා කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය පුළුල් කිරීම සඳහා කටයුතු කිරීම.


- සියලුම රාජ්‍ය විශ්වවිද්‍යාල ලෝක ශ්‍රේණිගත කිරීම්වල ඉහළ ස්ථානයකට පත් කිරීම සඳහා පියවර ගැනීම.

- විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළ පර්යේෂණ හා නව නිපැයුම් දිරි ගැන්වීම සඳහා පහසුකම් ඇති කිරීම.

- නවක වද සංස්කෘතිය සියලු විශ්වවිද්‍යාලවලින් හා උසස් අධ්‍යාපන ආයතනවලින් තුරන් කිරීමට කටයුතු කිරීම.

- සුහුරු අධ්‍යාපන විශ්වවිද්‍යාල ඇති කිරීම සඳහා පියවර ගැනීම.

# 1.4 අධ්‍යාපන අමාත්‍යාංශයේ සංවිධාන ව්‍යුහය (2020.12.31 දිනට අනුමත)



## 1.5 අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු

- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

## 1.6 අධ්‍යාපන අමාත්‍යාංශයට අනුබද්ධ ආයතන, ව්‍යවස්ථාපිත මණ්ඩල හා රාජ්‍ය සංස්ථා

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ඇති සියලු රාජ්‍ය විශ්වවිද්‍යාල, පශ්චාත් උපාධි ආයතන හා අනෙකුත් ආයතන
- ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ
- ගුරු විද්‍යාල
- ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිසම
- ශ්‍රී ලංකා ග්‍රන්ථ සංවර්ධන මණ්ඩලය
- ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය
- රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව
- අධ්‍යාපන අධ්‍යක්ෂ කාර්යාල

## 1.7 විදේශාධාර ව්‍යාපෘති පිළිබඳ තොරතුරු

| ව්‍යාපෘතිය | ආධාර සපයන ආයතනය | ඇස්තමේන්තුගත සමස්ත ආයෝජනය | ව්‍යාපෘති කාල සීමාව |
|---|---|---|---|
| තාක්ෂණ විෂය සඳහා වන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය ඉදිකිරීම | කොරියානු ජනරජයට අනුබද්ධිත අන්තර්ජාතික කොරියානු සහායෝගීතා ඒජන්සිය (KOICA) | රු.මිලියන 1295 | 2018 - 2020 |
| විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති සිසුන්ගේ අධ්‍යාපනය බලගැන්වීම | අන්තර්ජාතික ජපන් සහයෝගීතා ඒජන්සිය (JICA) | යෙන් මිලියන 435 | 2019 - 2022 |
| කිලිනොච්චි දිස්ත්‍රික්කයේ පාසල් අධ්‍යාපනය නගා සිටුවීමේ ව්‍යාපෘතිය | කොයිකා (KOICA) | US $ මිලියන 7.5 | 2018 - 2022 |
| තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය | අන්තර්ජාතික සංවර්ධනය සඳහා OPEC අරමුදල (OFID) | US $ මිලියන 60.7 | 2018 - 2022 |
| සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය | ලෝක බැංකුව | US $ මිලියන 100 | 2018 - 2023 |
| ද්විතියික අධ්‍යාපනය සඳහා තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන (ICT Hubs) ස්ථාපනය | Korean Exim Bank | රු.මිලියන 4281 | 2019 - 2021 |
| වතුකරයේ පාසල් නගා සිටුවීම | ඉන්දීය රජය | රු.මිලියන  345 | 2020 - 2023 |
| අධ්‍යාපන වැඩසටහන් (යුනිසෙෆ් ආධාර) | යුනිසෙෆ් ආයතනය | රු.මිලියන 25.0 | වාර්ෂික (2020) |
| යුනෙස්කෝ ආධාර යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති | යුනෙස්කෝ  ආයතනය | රු.මිලියන 14.8 | වාර්ෂික (2020) |
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම (UNFPA ආධාර) | UNFPA | රු.මිලියන 2.0 | වාර්ෂික (2020) |
| බහු ආංශික ප්‍රවේශයක් හරහා දරුවන්ගේ පෝෂණය ඉහළ නැංවීම | FAO | රු.මිලියන 2.22 | වාර්ෂික (2020) |

## අධ්‍යාපන පද්ධතිය පිළිබඳ සංඛ්‍යා දත්ත හා තොරතුරු (2019)

### රජයේ මුළු පාසල් සංඛ්‍යාව, ගුරුවරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව

| පාසල් සංඛ්‍යාව | ගුරුවරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| 10,165 | 246,592 | 4,061,653 |

### පාසල් වර්ගීකරණය අනුව රජයේ පාසල් සංඛ්‍යාව, ගුරුවරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව

| පාසල් වර්ගය | පාසල් සංඛ්‍යාව | ගුරුවරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| **1AB** වර්ගය | **1,012** | 81,428 | 1,570,177 |
| **1C** වර්ගය | **1,899** | 65,462 | 1,055,562 |
| **2** වර්ගය | **3,225** | 61,138 | 760,957 |
| **3** වර්ගය | **4,029** | 38,564 | 674,957 |

### පරිපාලන ව්‍යුහය අනුව රජයේ පාසල් සංඛ්‍යාව, ගුරුවරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව

| පරිපාලන ව්‍යුහය | පාසල් සංඛ්‍යාව | ගුරුවරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| ජාතික පාසල් | 373 | 40,936 | 798,372 |
| පළාත් පාසල් | 9,792 | 205,656 | 3,263,281 |

### පාසලේ පන්ති පරාසය අනුව රජයේ පාසල් සංඛ්‍යාව, ගුරුවරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව

| පන්ති පරාසය | පාසල් සංඛ්‍යාව | ගුරුවරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| 1-5 | 3,891 | 36,939 | 654,465 |
| 1-8 | 138 | 1,625 | 20,492 |
| 1-11 | 3,207 | 60,921 | 758,583 |
| 1-13 | 1,925 | 93,028 | 1,687,321 |
| 6-11 | 18 | 217 | 2,374 |
| 6-13 | 986 | 53,862 | 938,418 |

මූලාශ්‍රය : පාසල් සංගණනය - 2019

**පාසලේ ශිෂ්‍ය සංඛ්‍යා පරාසය අනුව පාසල් සංඛ්‍යාව, ගුරුවරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව**

| පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව | පාසල් සංඛ්‍යාව | ගුරුවරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---:|---:|---:|
| 1-50 | 1,468 | 9,393 | 43,775 |
| 51-100 | 1,498 | 15,119 | 111,615 |
| 101-200 | 2,152 | 30,098 | 314,391 |
| 201-500 | 2,738 | 58,364 | 880,176 |
| 501-1000 | 1,378 | 51,328 | 957,585 |
| 1001-1500 | 407 | 24,146 | 491,512 |
| 1501-2000 | 209 | 17,147 | 357,837 |
| 2001-3000 | 209 | 23,326 | 501,772 |
| 3001- 4000 | 74 | 10,989 | 251,458 |
| 4000ට වැඩි | 32 | 6,682 | 151,532 |

**ඉගෙනුම් මාධ්‍ය අනුව රජයේ පාසල් සංඛ්‍යාව**

| ඉගෙනුම ලබන මාධ්‍ය | පාසල් සංඛ්‍යාව |
|---|---:|
| සිංහල **පමණක්** | 6,347 |
| දෙමළ **පමණක්** | 3,030 |
| සිංහල හා දෙමළ | 45 |
| සිංහල හා ඉංග්‍රීසි | 542 |
| දෙමළ හා ඉංග්‍රීසි | 168 |
| සිංහල, දෙමළ හා ඉංග්‍රීසි | 33 |

**අ.පො.ස.(උසස් පෙළ)එක් එක් විෂය ධාරාව සහිත රජයේ පාසල් සංඛ්‍යාව**

| විෂය ධාරාව | පාසල් සංඛ්‍යාව |
|---|---:|
| ජීව විද්‍යා | 979 |
| භෞතික විද්‍යා | 936 |
| කලා | 2,879 |
| වාණිජ | 1,850 |
| ජෛව තාක්ෂණය | 486 |
| ඉංජිනේරු තාක්ෂණය | 448 |
| වෘත්තීය | 168 |
| වෙනත් විෂයධාරා | 104 |

**පත්වීම් ස්වභාවය අනුව රජයේ පාසල්වල ගුරුවරු සංඛ්‍යාව**

| පත්වීම් ස්වභාවය | ගැහැණු | පිරිමි | එකතුව |
|---|---|---|---|
| උපාධිධාරී | 86,292 | 33,031 | 119,323 |
| පුහුණුව ලත් | 92,769 | 28,079 | 120,848 |
| පුහුණුවන | 3,834 | 925 | 4,759 |
| නුපුහුණු | 1,122 | 396 | 1,518 |
| වෙනත් | 108 | 36 | 144 |
| එකතුව | 184,125 | 62,467 | 246,592 |

**පෞද්ගලික පාසල් සංඛ්‍යාව, ගුරුවරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව**

| පාසල් සංඛ්‍යාව | ගුරුවරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| 89 | 7,490 | 135,600 |

**පිරිවෙන් සංඛ්‍යාව, ගුරුවරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව**

| පිරිවෙන් සංඛ්‍යාව | ගුරුවරු සංඛ්‍යාව | ගිහි හා පැවිදි ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| 801 | 7,200 | 68,319 |

| කලාප කාර්යාල සංඛ්‍යාව | කොට්ඨාස කාර්යාල සංඛ්‍යාව |
|---|---|
| 99 | 312 |

මූලාශ්‍රය : පාසල් සංගණනය - 2019







# 02. පරිච්ඡේදය
# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 විශේෂ ජයග්‍රහණ හා ළඟා කරගත් ප්‍රගතිය

2.1.1 එක් එක් විෂයය ක්ෂේත්‍රය යටතේ ළඟා කර ගත් ප්‍රගතිය

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| **ප්‍රාථමික හා ද්විතියීක අධ්‍යාපනය සඳහා ප්‍රවේශය හා සහභාගිත්වය ඉහළ නැංවීම** | |
| ජාතික පාසල් සංවර්ධනය සහ නව ජාතික පාසල් ඇති කිරීම | ♦ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ජාතික පාසල් 1000ක් ස්ථාපිත කිරීමේ වැඩසටහන සඳහා පළමු හා දෙවන අදියරේ පාසල් හඳුනා ගැනීම.<br>♦ ජාතික පාසල් කළමනාකරණය හා පරිපාලනය පිළිබඳව විදුහල්පතිවරු 270කගේ ධාරිතා සංවර්ධනය.<br>♦ ජාතික පාසල්වල ප්‍රාථමික අංශවල අලුත්වැඩියා 18ක් හා නව ඉදිකිරීම් 3ක් සිදු කිරීම.<br>♦ ජාතික පාසල්වල ද්විතීයික අංශවල අලුත්වැඩියා 134 ක් හා නව ඉදිකිරීම් 46 ක් සිදු කිරීම.<br>♦ ජාතික පාසලකට රු.100,000 බැගින් ජාතික පාසල් 100ක ද්විතියීක අංශ සඳහා ගුණාත්මක යෙදවුම් මිලදී ගැනීමට මූල්‍ය ප්‍රදාන ලබා දීම.<br>♦ සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියෙන් එක් පාසලකට මිලියනය බැගින් තෝරා ගත් ජාතික පාසල් 50ක් සඳහා SBLEG යටතේ මූල්‍ය ප්‍රධානය. |
| විශේෂ අධ්‍යාපනය, නොවිධිමත් අධ්‍යාපනය සහ අන්තර්කරණ අධ්‍යාපනය සවිබල ගැන්වීම | ♦ අනිවාර්ය අධ්‍යාපන නියෝග පිළිබඳ කලාප 99හි නිලධාරීන් දැනුම්වත් කිරීම.<br>♦ කලාප මට්ටමින් විශේෂ අධ්‍යාපන නිලධාරීන් 88ක් පුහුණු කිරීම.<br>♦ විශේෂ අවශ්‍යතා ඇති සිසුන් ආරම්භයේදීම හඳුනා ගැනීම සඳහා තක්සේරුකරණ උපකරණ සැකසීම.<br>♦ බුද්ධිමය ඌනතා ඇති සිසුන්ට ඉගැන්වීම සඳහා ගුරු උපදෙස් සංග්‍රහය සැකසීම.<br>♦ "ශිෂෝද්‍යා" විශේෂ අධ්‍යාපනය හා අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ ජාතික ආයතනයේ නව ඉදිකිරීම් හා උපකරණ සැපයීම.<br>♦ පළාත් 04ක විශේෂ අවශ්‍යතා ඇති පාසල් සිසුන් සඳහා ඇස් කණ්නාඩි 1,267ක් හා සවන් වහල් 162ක් මිලදී ගැනීමට ප්‍රතිපාදන ලබාදීම.<br>♦ ජාතික පාසල් 2ක විශේෂ අධ්‍යාපන ඒකක 2ක අලුත්වැඩියා සිදු කිරීම.<br>♦ නොවිධිමත් අධ්‍යාපනය පිළිබඳ පළාත් 04ක කලාප නිලධාරීන් 33ක් දැනුම්වත් කිරීම.<br>♦ විශේෂ අධ්‍යාපන ඒකක 16ක් සඳහා වර්ණ ඡායා පිටපත් යන්ත්‍ර, ක්‍රීඩා උපකරණ හා pen drive ලබා දීම. |

<table>
<tr><th>ක්ෂේත්‍රය</th><th>ළඟා කර ගත් ප්‍රගතිය</th></tr>
<tr><td>වතු පාසල් සංවර්ධනය සහ දෙමළ මාධ්‍ය පාසල් සංවර්ධනය</td><td>

- වතු පාසල් 9ක් වැඩිදියුණු කිරීම (ඉන්දියන් රජයේ ආධාර යටතේ) : ඉදිකිරීම්වලට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම.
- **වතු පාසල් සඳහා රජය සතු වතුවලින් ඉඩම් ලබා ගැනීම :** වතු පාසල් 354 ක් වැඩි දියුණු කිරීම සඳහා රාජ්‍ය වතුවලින් උපරිම අක්කර දෙකක් වන සේ ඉඩම් පවරා දීමට අමාත්‍ය මණ්ඩලය ගෙන ඇති තීරණයට අමතරව තවත් වතු පාසල් 491ක් සඳහා එලෙස ඉඩම් ලබා දීමට අමාත්‍ය මණ්ඩල යෝජනාවක් ඉදිරිපත් කිරීම.
- දෙමළ මාධ්‍ය පාසල්වල විදුහල්පතිවරුන්ගේ ධාරිතා සංවර්ධනය යටතේ නියෝජ්‍ය විදුහල්පතිවරුන් 19ක් හා සහකාර විදුහල්පතිවරුන් 21ක ගේ ධාරිතා සංවර්ධනය සඳහා වැඩමුළුවක් පැවැත්වීම.
- මුස්ලිම් පාසල්වල විදුහල්පතිවරු හා නියෝජ්‍ය විදුහල්පතිවරුන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා වැඩසටහන් 4ක් පවත්වා 216 දෙනෙක් පුහුණු කිරීම.

</td></tr>
<tr><td>පාසල් සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන</td><td>
<table>
<tr><th>වැඩසටහන</th><th>ප්‍රතිලාභී සිසුන්/පාසල් සංඛ්‍යාව</th></tr>
<tr><td>පාසල් ළමුන් සඳහා ආහාර ලබා දීම. (2020)</td><td>සිසුන් 1,082,136</td></tr>
<tr><td>පාසල් ළමුන් සඳහා නැවුම් කිරි ලබාදීම. (2020)</td><td>සිසුන් 399,321</td></tr>
<tr><td>පාසල්වල සනීපාරක්ෂක පහසුකම් දියුණු කිරීම. (2016 - 2020)<br>♦ ළඟම පාසල හොඳ ම පාසල යටතේ<br>♦ වෙනත් වැඩසටහන් යටතේ</td><td><br><br>පාසල් 3,595<br>පාසල් 126</td></tr>
<tr><td>පාසල්වල ජල පහසුකම් දියුණු කිරීම. (2016 - 2020)<br>♦ ළඟම පාසල හොඳ ම පාසල යටතේ<br>♦ වෙනත් වැඩසටහන් යටතේ</td><td><br><br>පාසල් 666<br>පාසල් 04</td></tr>
<tr><td>පාසල් සඳහා දන්ත සායන ලබාදීම. (2016 - 2020)<br>♦ නව ගොඩනැගිලි<br>♦ අලුත්වැඩියා</td><td><br><br>පාසල් 15<br>පාසල් 105</td></tr>
</table>
</td></tr>
</table>

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| පාසල් වෘත්තීය මාර්ගෝපදේශ හා උපදේශන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | ♦ අ.පො.ස (උ/පෙළ) සිසුන් සඳහා පවත්නා වෘත්තීය හා තෘතීක අධ්‍යාපන පහසුකම් හා අවස්ථා පිළිබඳ මාර්ගගත ප්‍රවේශය ඔස්සේ ළමුන් දැනුවත් කිරීමට ක්‍රමෝපායන් විවිධ රාජ්‍ය ආයතන රැසක දායකත්වය මත සැකසීම.<br>♦ ශිෂ්‍ය උපදේශනය :<br>මනෝ සමාජීය මෘදු කුසලතා සංවර්ධනය සඳහා ක්‍රියාකාරකම් 100ක් සහිත ගුරු අත්පොත කෙටුම්පත් කිරීම. |
| 13 වසරක අධ්‍යාපනය සහතික කිරීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම<br>(වෘත්තීය විෂය ධාරාව) | ♦ තෙවන අදියරේ (2019) ඇතුළත් කරගත් සිසුන් 5485ක් පුහුණුව කරා යොමු කිරීම.<br>♦ සිසුන් පුහුණු වීම් සඳහා යොමු කරන ලද ආයතන 11 සඳහා අවශ්‍ය රු.මි. 320.62 ක මුදල් ගෙවීම් සිදු කිරීම.<br>♦ වෘත්තීය පුහුණුව සඳහා ආයතන ගත වූ සිසුන් වෙත පැමිණීම මත පදනම්ව රු.500 බැගින් වූ දෛනික දීමනාව යටතේ වර්ෂය තුළ රු. මි. 150.17ක මුදලක් සිසුන් වෙත බෙදා දීම.<br>♦ වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ ආයතන හා සම්බන්ධීකරණය කරමින් සිසුන්ට වෘත්තීය පුහුණු අවස්ථා පුළුල් කිරීම, ව්‍යවසායකත්ව අවස්ථා ලබාදීම සහ රැකියා අවස්ථා ලබාදීම.<br>♦ විශේෂ අවශ්‍යතා සහිත සිසුන් වෙත ස්වාධීනත්වය සහ වෘත්තීය දිශානතිය පිළිබඳ මඟ පෙන්වීමක් ලබා දීමට "ආයති " මධ්‍යස්ථානය සමඟ සම්බන්ධ වෙමින් නියාමක වැඩසටහනක් දියත් කිරීම.<br>♦ පාසල් 182කට ක්‍රීඩා , සෞන්දර්ය, තොරතුරු තාක්ෂණය හා කෘෂි විද්‍යා උපකරණ සහ Wi-fi පහසුකම් ලබා දීම.<br>♦ පාසල් 289ක් සඳහා පාසල් පාදක ප්‍රදාන ලබා දීම. |
| **අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම** | |
| ගණිත අධ්‍යාපනය සංවර්ධනය | ♦ සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යටතේ ගණිතය ඉගෙනුම් ඵල වැඩි දියුණු කිරීමේ වැඩසටහන [Mathematics Learning Enhancement (MLE) programme] පාසල් 250ක ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් මට්ටමේ පුහුණුකරුවන් පුහුණු කිරීම.<br>♦ එම පාසල් 250 හි විදුහල්පතිවරු, ප්‍රාථමික අංශ ප්‍රධානීන් හා 6-11 විෂය ප්‍රධානීන් දැනුවත් කිරීම.<br>♦ එම පාසල් 250 හි සිසුන්ගේ ශිෂ්‍ය සාධන මට්ටම ඇගයීම සඳහා ගණිත විෂය සාධන මට්ටම ඇගයීම සඳහා පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍ර සකස් කිරීම. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| | ♦ එම පාසල්වලට බෙදාහැරීමට දැලිස වැඩපොත් (3,4,5 ශ්‍රේණි සඳහා), අත්‍යාවශ්‍ය ඉගෙනුම් සංකල්ප මත සැකසූ කාර්ය පැතිකඩ සංග්‍රහ (10,11 ශ්‍රේණි සඳහා) සකස් කිරීම.<br>♦ ආසියානු සංවර්ධන බැංකුවේ තාක්ෂණික සහායෙන් ක්‍රියාත්මක ගණිත අධ්‍යාපන සංවර්ධන වැඩසටහනේ නියමු අධ්‍යයනයේ ගුරු පාදම (Teacher base line) සැකසීම, මැදිහත්වීම (Coaching, Treatment and Innovation) අවසන් කිරීම.<br>♦ ගණිත ඔලිම්පියාඩ් වැඩසටහන සහ සමස්ත ලංකා ගණිත තරඟාවලිය සඳහා අයිතම බැංකුවක් සකස් කිරීම.<br>♦ ගණිත අධ්‍යාපනය සම්බන්ධ කාර්ය මූලික පර්යේෂණ වැඩසටහන් 02ක් පැවැත්වීම.<br>♦ ජාතික අධ්‍යාපන ආයතනය හා එක්ව ගුරු ගෙදර රූපවාහිණී වැඩසටහන් සඳහා 6-11 ගණිතය හා උසස් පෙළ සංයුක්ත ගණිත විෂයය පාඩම් සැකසීම, සංස්කරණය හා පටිගත කිරීම සඳහා සම්බන්ධ වීම.<br>♦ සුහුරු ගණිත පොත (Smart Maths Book) 6-11 ගණිත විෂයේ තෝරා ගත් විෂයය ඒකක සඳහා වීඩියෝ පාඩම් සැකසීම.<br>♦ පළාත් දෙපාර්තමේන්තු හා එක්ව සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් 6-11 ශ්‍රේණි සඳහා සිසු ස්වයං ඉගෙනුම් කට්ටල සැකසීම. |
| විද්‍යා අධ්‍යාපනය වැඩි දියුණු කිරීම | ♦ ගුරු ගෙදර රූපවාහිණී වැඩසටහන සම්බන්ධීකරණය කිරීම.<br>♦ අ.පො.ස (උ/පෙළ) විද්‍යා විෂයන්හි ප්‍රායෝගික පරීක්ෂණය වීඩියෝගත කිරීමේ (ඩයලොග් ආයතනයේ අනුග්‍රාහකත්වයෙන් නැණස වැඩසටහන සමඟ) මූලික කටයුතු සිදු කිරීම.<br>♦ අ.පො.ස (උ/පෙළ) ජීව විද්‍යා ප්‍රශ්න බැංකුවක් සකස් කර අමාත්‍යාංශ වෙබ් අඩවියේ ඇතුළත් කිරීම.<br>♦ ICYS, Sakura Science Program, NUS brain camp යන ජාත්‍යන්තර තරඟ සඳහා සහභාගී කරවීමට ශිෂ්‍යයින් තෝරා ගැනීම.<br>♦ අ.පො.ස (උ/පෙළ) සිසුන්ගේ විෂය දැනුම සංවර්ධනය සඳහා නෙස්ටමෝල්ට් අනුග්‍රහයෙන් බුද්ධි ප්‍රබෝධය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.<br>♦ 2019 අ.පො.ස (සා/පෙළ) අඩු සාධන මට්ටම් සහිත පාසල් සම්බන්ධයෙන් විශේෂ වැඩසටහන් සැලසුම් කිරීම. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| | ♦ 6-11 විද්‍යාව සහ අ.පො.ස (උ/පෙළ) භෞතික, රසායන හා ජීව විද්‍යා විෂයයන් සඳහා මාධ්‍ය තුනෙන්ම ස්වයං අධ්‍යයන පොත් කට්ටල සකස් කිරීම.<br>♦ Covid—19 තත්වය තුළ සියළුම කලාපවල විද්‍යා විෂයභාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරු, ගුරු උපදේශකවරු හා සම්පත් දායකයින් සහභාගීත්වයෙන් WhatsApp Group හරහා විද්‍යා විෂයයට අදාළ පාඩම් සටහන් හා ප්‍රශ්න පත්‍ර සිසුන්ට ලැබෙන පරිදි හුවමාරු කර ගැනීම. |
| ඉංග්‍රීසි හා විදේශ භාෂා අධ්‍යාපනය සංවර්ධනය | ♦ ඉංග්‍රීසි නාට්‍ය පිළිබඳ ව පළාත් මට්ටමින් තෝරාගත් ඉංග්‍රීසි ගුරුවරු 41 දෙනෙකු පුහුණු කිරීම.<br>♦ ඉංග්‍රීසි ගුරුවරුන්ගේ අඛණ්ඩ වෘත්තීය පුහුණු වැඩසටහන යටතේ ඉංග්‍රීසි ගුරු උපදේශක ,විද්‍යාපීඨ කථිකාචාර්ය හා ගුරු සම්පත්දායකයින් 418ක් පුහුණු කිරීම.<br>♦ සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යටතේ ඉංග්‍රීසි විෂයෙහි ඉගෙනුම් ඵල සංවර්ධනය කිරීම සඳහා වූ වැඩසටහන (English Language Learning Enhancement – ELLE programme) පළාත් 09 ම ආවරණය වන පරිදි පාසල් 250ක ක්‍රියාත්මක කිරීම.<br>♦ ඒ යටතේ ඉංග්‍රීසි භාෂාව ඉගෙනුම් සංවර්ධනය වැඩසටහන පිළිබඳ විදුහල්පතිවරු, ගුරු උපදේශකවරු, ප්‍රාදේශීය ඉංග්‍රීසි සම්පත් මධ්‍යස්ථාන කළමනාකරුවන් හා ඉංග්‍රීසි ගුරුවරු 443 දැනුම්වත් කිරීම.<br>♦ සිසුන්ගේ ඉංග්‍රීසි වචන මාලාව සංවර්ධනය සඳහා Scrabble අත්පොත් 3000 ක් මුද්‍රණය කිරීම.<br>♦ ඉංග්‍රීසි ශ්‍රවනය හා කථනය සංවර්ධනය සඳහා නිකුත් කරන ලද 2019 /40 චක්‍රලේඛය බලගැන්වීම හා ක්‍රියාත්මක කිරීම. |
| තාක්ෂණ අධ්‍යාපන සංවර්ධනය | ♦ 2013 වර්ෂයේ දී පාසල් 250 ක ආරම්භ කළ අ.පො.ස. (උ පෙළ) තාක්ෂණ විෂය ධාරාව 2020 වර්ෂය වන විට පාසල් 458ක් දක්වා වර්ධනය වී ඇත.<br>♦ මෙම විෂය ධාරාව ඉගැන්වීම සඳහා මේ වන විට ඉදිකර ඇති තාක්ෂණ පීඨ සංඛ්‍යාව 286කි.<br>♦ කෝවිඩ් වසංගතය හේතුවෙන් සමස්ත ලංකා පාසල් රොබෝ තාක්ෂණ නිර්මාණ තරඟාවලිය නොපැවැත්වුවද නිර්මාණකරණය දිරිගැන්වීම සඳහා දුරස්ථ මාර්ගගත ක්‍රමවේද යටතේ නිර්මාණ ඉදිරිපත් කිරීමට හා ඇගයීමට කටයුතු කිරීම.<br>♦ UNDP, UNICEF හා එක්ව Gen U නිර්මාණකරණ තරඟාවලිය පැවැත්වීමට කටයුතු කිරීම හා පාසල් නිර්මාණකරුවන් ජාත්‍යන්තර තරඟය සඳහා ඉදිරිපත් කිරීමට මග සැලසීම. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| | ♦ දරුවන්ගේ නවෝත්පාදන කුසලතා ප්‍රවර්ධනය සඳහා ජාතික මට්ටමේ නිර්මාණ ප්‍රදර්ශනය (Inno Tec) නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ සම්බන්ධීකරණය යටතේ පිටිපන මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ දී පැවැත්වීම.<br>♦ රොබෝ තාක්ෂණය පිළිබඳව අත්පොතක් සකස්කර අන්තර්ජාලයේ පල කිරීම.<br>♦ ජෛවපද්ධති තාක්ෂණවේදය පිළිබඳව විද්‍යාගාර පරිහරණය සඳහා සේවකයින් 80ක් ප්‍රායෝගිකව පුහුණුකිරීම.<br>♦ ජෛවපද්ධති තාක්ෂණවේදය විෂය නිර්දේශයේ ඇතුළත් ප්‍රායෝගික ක්‍රියාකාරකම් සිදුකිරීම පිළිබඳ ව ගුරුවරු 60ක් පුහුණු කිරීම.<br>♦ තාක්ෂණවේදය විෂයය ධාරාවට අයත් විෂයයන් සඳහා දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේද මගින් සම්පත්දායකයින් පුහුණු කිරීම. |
| ප්‍රාථමික අධ්‍යාපන සංවර්ධනය | ♦ ප්‍රාථමික පන්තිවල ගුණාත්මක ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ප්‍රාථමික ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානයේ කියවීම් කාමරය භාවිතය පිළිබඳව පළාත් සම්පත් දායකයින් 93ක් පුහුණු කිරීම.<br>♦ ප්‍රාථමික අංශ සහිත ජාතික පාසල් 172ක් සඳහා ගුණාත්මක යෙදවුම් මිලදී ගැනීමට ප්‍රතිපාදන සැපයීම.<br>♦ කෝවිඩ්-19 වසංගතයෙන් පසු පාසල්වල ප්‍රාථමික විෂය සමගාමී ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම පිළිබඳව උපදෙස් මාලාවක් සකස් කිරීම.<br>♦ කෝවිඩ්-19 වසංගත කාලය තුළ පාසල්වල ප්‍රාථමික අංශයේ අධ්‍යාපන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට Unicef ආයතනයේ අනුග්‍රහයෙන් 1 හා 2 ශ්‍රේණිවල ඉගෙනුම ලබන සිසුන් සඳහා ක්‍රියාකාරකම් පොත් බෙදා දීම.<br>♦ කෝවිඩ්-19 වසංගත කාලය තුළ දී සියලුම පාසල්වල ප්‍රාථමික අංශයේ ශ්‍රේණි සඳහා පාඩම් මාලා පළාත් ප්‍රාථමික අධ්‍යාපන විෂයභාර නිලධාරීන් මගින් යොමු කිරීම.<br>♦ 2020 තුන්වන වාරයට අදාළ විෂයය නිර්දේශ ආවරණය වන පරිදි ප්‍රාථමික අංශයේ සිසුන් සඳහා ස්වයං ඉගෙනුම් කට්ටල සකස් කිරීම. |
| ආගමික හා සාරධර්ම අධ්‍යාපනය | ♦ බුද්ධ ධර්මය, කතෝලික ධර්මය හා බෞද්ධ ශිෂ්ඨාචාරය යන විෂයයන්හි ශිෂ්‍ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා ගුරු පුහුණු වැඩසටහන් පැවැත්වීම. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අධ්‍යාපනය සංවර්ධනය කිරීම | ♦ සිංහල භාෂා හා දෙවන ජාතික භාෂා තරගාවලි පැවැත්වීම සඳහා ප්‍රශ්න පත්‍ර සකස් කිරීම.<br>♦ දෙමළ භාෂා විෂයමාලා සංශෝධනය පිළිබඳ ව පළාත් සම්බන්ධීකරණ නිලධාරීන් සමග සාකච්ඡා පැවැත්වීම.<br>♦ දෙමළ භාෂා විෂය ගුරුවරුන්ගේ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන පවත්වා වයඹ පළාතේ ගුරුවරු 80 දෙනෙකු පුහුණු කිරීම.<br>♦ සමාජ විද්‍යා විෂය ගුරු උපදේශකවරු සහ ගුරුවරුන්ගේ ධාරිතා සංවර්ධනය යටතේ වයඹ පළාතේ ගුරුවරු 95 දෙනෙකු පුහුණු කිරීම.<br>♦ 2020 කුර්මති සඟරාව පිටපත් 3,000ක් මුද්‍රණය කර බෙදා හැරීම.<br>♦ 2018 නුවණ සඟරාව පිටපත් 7,500ක් මුද්‍රණය කර බෙදා හැරීම. |
| ද්වි භාෂා අධ්‍යාපන පහසුකම් ඉහළ නැංවීම | ♦ ද්විභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා ගුරුවරු හා නිලධාරී 40කට ශිෂ්‍යත්ව පිරිනැමීම.<br>♦ විෂයානුබද්ධ ඉංග්‍රීසි භාෂාව ඉගෙනීම ප්‍රවර්ධනය සඳහා මාර්ගගත ක්‍රමවේද ඔස්සේ සැලැස්මක් සකස් කිරීම.<br>♦ ද්විභාෂා ඉගෙනුම් ද්‍රව්‍ය සකස් කර ඉ - තක්සලාවට ඇතුළත් කිරීම. |
| කෘෂිකර්ම හා පරිසර අධ්‍යයනය සහ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයය සංවර්ධනය | ♦ නාගරික කෘෂිකර්මය ද ඇතුළුව පාසල් ගොවිපළ පිහිටුවීම සඳහා නිර්ණායක සැකසීම.<br>♦ *පලතුරු වවමු* අත්පොත පිටපත් 35,000ක් පාසල් අතර බෙදා හැරීම.<br>♦ GLOBE පරිසර වැඩසටහන යටතේ පාංශු අධ්‍යයනය පිළිබඳ ගුරුවරු 25ක් පුහුණු කිරීම.<br>♦ අ.පො.ස. (උ.පෙළ) ජෛව පද්ධති තාක්ෂණවේදය හා කෘෂි විද්‍යා සහ අ.පො.ස. (සා.පෙළ) කෘෂි හා ආහාර තාක්ෂණ විෂය සඳහා ආදර්ශ ප්‍රශ්ණ පත්‍ර සකසා ගුරුවරුන් වෙත බෙදා දී ඇත.<br>♦ අ.පො.ස. (උ.පෙළ) කෘෂි විද්‍යාව සහ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයයන් සඳහා ගුරු ගෙදර අධ්‍යාපනික වැඩසටහන් ජාතික අධ්‍යාපන ආයතනය හා එක්ව ක්‍රියාත්මක කිරීම. |
| වාණිජ, ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය | ♦ අ.පො.ස (සා/පෙළ) ගුරු පුහුණුව යටතේ වාණිජ හා ව්‍යාපාර අධ්‍යයනය ගුරුවරු 64 දෙනෙක් පුහුණු කිරීම.<br>♦ අ.පො.ස (උ/පෙළ) ගුරු පුහුණුව යටතේ ගණකාධිකරණය උගන්වන ගුරුවරු 50 දෙනෙක් පුහුණු කිරීම.<br>♦ SLIM ආයතනය හා එක්ව වාණිජ විෂය ධාරාව සහිත පාසල් සඳහා ව්‍යවසායකත්ව සංගම් පිහිටුවීම පිළිබඳ ව නිලධාරී 103 දෙනෙකු දැනුම්වත් කිරීම. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| | ♦ අ.පො.ස (සා/පෙළ) හා අ.පො.ස (උ/පෙළ) වාණිජ විෂයයන් සඳහා ස්වයං ඉගෙනුම් කට්ටල පිළියෙල කිරීම.<br>♦ e-තක්සලාව හා ගුරු ගෙදර වැඩසටහන් හරහා විෂය ඉගැන්වීම් සඳහා සම්බන්ධීකරණ කටයුතු කිරීම. |
| පාසල් පුස්තකාල සංවර්ධනය | ♦ පාසල් පුස්තකාල සඳහා ග්‍රන්ථ අනුමත කිරීමට තෝරාගත් සමාලෝචකයින් සමග අදාළ ග්‍රන්ථ සමාලෝචනය සිදු කර අනුමත කිරීම.<br>♦ පාසල් පුස්තකාල ග්‍රන්ථ නාමාවලිය මුද්‍රණය සඳහා කටයුතු සිදු කිරීම.<br>♦ පාසල් ගුරු පුස්තකාලයාධිපති සේවා ව්‍යවස්ථාව සකස් කිරීම සඳහා වැඩමුළු පැවැත්වීම.<br>♦ පාසල් පුස්තකාල මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීමට කටයුතු කිරීම. |
| විෂය සමගාමී හා විෂය බාහිර ක්‍රියාකාරකම් සංවර්ධනය | ♦ පාසල් ශිෂ්‍ය නායකයින් පත් කිරීම හා සම්බන්ධ මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කිරීමේ කාර්ය 80% ක් නිම කිරීම.<br>♦ පාසල් ශිෂ්‍ය නායකත්ව පුහුණු වැඩසටහන් සඳහා විශේෂ පුහුණු මොඩියුලයක් සකස් කිරීම.<br>♦ පාසල් විෂය සමගාමී ක්‍රියාකාරකම් ශක්තිමත් කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම පිළිබඳව සාකච්ඡා පවත්වා අදහස් ලබා ගැනීම.<br>♦ ශිෂ්‍ය පාර්ලිමේන්තුව පිළිබඳ නව චක්‍රලේඛයක් නිකුත් කිරීම හා පළාත් සම්බන්ධීකරණ නිලධාරීන් පුහුණු කිරීම. |
| ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය | ♦ අධ්‍යාපන අමාත්‍යාංශය හා ග්‍රාමීය හා පාසල් ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය එක්ව පාසල් ක්‍රීඩා නැංවීම සඳහා ඒකාබද්ධ වැඩසටහනක් සකස් කිරීම.<br>♦ ක්‍රීඩා පාසල් 23කට තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ මූල්‍ය දායකත්වයෙන් ක්‍රීඩා උපකරණ ලබාදීම.<br>♦ සූරියවැව ඉදිකිරීමට යෝජිත නව ක්‍රිකට් ක්‍රීඩා පාසල පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම .<br>♦ ක්‍රීඩාවලට දක්ෂතා දක්වන දරුවන්ට ක්‍රීඩා පාසල්වලට ඇතුළත් වීමට තිබෙන ඉඩ ප්‍රස්තාව පුළුල් කිරීම සඳහා එම පාසල්වල 8වන ශ්‍රේණිය සඳහා නව පන්තියක් අනුමත කිරීම.<br>♦ ක්‍රීඩා පාසල්වල පහසුකම් වැඩිදියුණු කිරීම , ක්‍රීඩා පාසල් සංඛ්‍යාව වැඩි කිරීම සහ ක්‍රීඩා ශිෂ්‍යත්වධාරීන් සඳහා ලබා දෙන පෝෂණ දීමනාව වැඩි කිරීමට අදාළ ව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන මුදල් අමාත්‍යාංශයේ එකඟත්වය ලබා ගැනීමට ඉදිරිපත් කිරීම.<br>♦ පුහුණු සංචිත පිහිටුවීම යටතේ වොලිබෝල් ක්‍රීඩා සංචිතයට සිසුන් තෝරා ගැනීම. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
| --- | --- |
| | ♦ මලල ක්‍රීඩා, ශාරීරික යෝග්‍යතා, ජිම්නාස්ටික, රග්බි සහ පාපන්දු ක්‍රීඩා ක්‍රියාකාරකම් පිළිබඳව කලාප සම්බන්ධිකාරකවරුන් දැනුම්වත් කිරීම.<br>♦ ක්‍රීඩා 7ක් සඳහා ගුරු උපදෙස් සංග්‍රහ මුද්‍රණය කිරීම.<br>♦ රග්බි හා පාපන්දු පුහුණුකරුවන් සහ ගුරුවරුන් සඳහා සැසි පැවැත්වීම.<br>♦ ප්‍රාථමික ක්‍රීඩා ගුරු උපදෙස් සංග්‍රහය සකස් කිරීම.<br>♦ ක්‍රීඩා පාසල්වල සිසුන් සඳහා පෝෂණ දීමනාව ලෙස රු.මි. 19.25ක වෙන් කර ලබා දීම.<br>♦ ක්‍රීඩා විනිසුරුවන් පුහුණු කිරීමේ සැසි පැවැත්වීම. |
| සෞන්දර්යය අධ්‍යාපනය | ♦ ජාතික තරුණ වාදක මණ්ඩලයේ සිසුන් 150ක් අඛණ්ඩව පුහුණු කිරීම.<br>♦ නාට්‍ය හා රංගකලා විෂය සංවර්ධනය කිරීමේ වැඩසටහන් 2ක් පැවැත්වීම.<br>♦ පෙරදිග සංගීත නිලධාරීන් හා ගුරු උපදේශකවරු බලාත්මක කිරීමේ වැඩසටහන් පැවැත්වීම.<br>♦ සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙල පැවැත්වීම<br>♦ නර්තන විෂය හදාරණ පසුබට සිසුන් සඳහා ඉගෙනුම් ශිල්ප ක්‍රම හඳුන්වාදීම හා වැඩසටහන් පැවැත්වීම.<br>♦ අ.පො.ස (සා.පෙළ) නර්තන විෂය ප්‍රායෝගික පරීක්ෂණ පිළිබඳ වැඩසටහන් පැවැත්වීම.<br>♦ අ.පො.ස (සා.පෙළ) චිත්‍ර විෂයභාර නිලධාරීන් හා ගුරු උපදේශකවරු සඳහා විෂයානුබද්ධ පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br>♦ චිත්‍ර විෂය සඳහා e – learning වැඩසටහන් පැවැත්වීම.<br>♦ සෞන්දර්යය විෂයයන් සඳහා 3 වන වාරයට නියමිත පාඩම් වෙනුවෙන් සිසුන්ට ඉගෙනුම් කට්ටල සකස් කර ලබා දීම. |
| තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය සහ ඩිජිටල් මාධ්‍ය භාවිතයෙන් ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආකර්ෂණීය ලෙස සංවර්ධනය | ♦ විවෘත හා නිදහස් මෘදුකාංග (free and open source) ආශ්‍රයෙන් අධ්‍යාපන පද්ධතියට ගැලපෙන සේ සකස් කර ඇති Isuru Linux මෘදුකාංගයේ නව්‍ය සංස්කරණය සකස් කිරීමේ වැඩමුළු පැවැත්වීම.<br>♦ පාසල් පරිගණක මධ්‍යස්ථානවල ඇති පරිගණක හා ආශ්‍රිත උපාංග අළුත්වැඩියා වෙනුවෙන් කලාප මට්මින් පිහිටුවා ඇති දෘඩාංග හා ජාලකරණ විසඳුම් සංචිත (Hardware and Network Solution Team) සඳහා ඇතුළත් කර ගන්නා ලද නව සාමාජිකයන් 77 දෙනෙක් පුහුණු කිරීම.<br>♦ පාසල් 1401ක උසස් පෙළ සිසුන් සඳහා Tab පරිගණක ලබා දීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| | ♦ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් වූ “Inspirational Catalyst of New era (ICON) 70+” ප්‍රදර්ශනයට සම්බන්ධ වීම.<br>♦ අ.පො.ස.(උ/පෙළ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයට අදාළව ගුරු පුහුණු සඳහා පුහුණු මොඩියුලයක් සකස් කිරීම.<br>♦ පළාත් හා කලාප අධ්‍යාපන කාර්යාලවල සේවයේ නියුතු තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයභාර නිලධාරී 46ක් සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ අන්තර්ජාල සුරක්ෂිතතාව පිළිබඳ පුහුණුවීම් ලබා දීම.<br>♦ අ.පො.ස. (උ/පෙළ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය සඳහා උතුරු මැද පළාතේ ගුරුවරු 74 ක් පුහුණු කිරීම.<br>♦ 6 – 13 ශ්‍රේණි සඳහා වන විෂයානුබද්ධ අන්තර්ගත සකස් කිරීම හා එම අන්තර්ගත ඉ-ඉගෙනුම් අන්තර්ගත කළමනාකරණ පද්ධතිය වන ඉ-තක්සලාව වෙබ් අඩවියේ ඇතුළත් කිරීම. |
| **ගුරු සංවර්ධනය, ගුරු අධ්‍යාපනය හා ගුරු කළමනාකරණය** | |
| ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල තත්වය ඉහළ නැංවීම | ♦ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ 5ක් සඳහා සුහුරු පන්තිකාමර උපකරණ සැපයීම.<br>♦ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ 5ක් සඳහා ප්‍රාථමික ආදර්ශ පන්ති කාමර හා විද්‍යාපීඨ 2ක් සඳහා ඉංග්‍රීසි කියවීම් කාමරවලට අවශ්‍ය උපකරණ ද,විද්‍යාපීඨ 5ක් සඳහා සුහුරු පුස්තකාල පහසුකම් සැපයීම.<br>♦ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල අලුත්වැඩියා කටයුතු සිදු කිරීම හා වැසිකිළි පද්ධති ,නේවාසිකාගාර ගොඩනැගිලි , පන්ති කාමර ගොඩනැගිලි ඇතුළු නව ඉදි කිරීම් රැසක් ක්‍රියාත්මක කිරීම.<br>♦ විද්‍යාපීඨ අධීක්ෂණය යටතේ මහරගම, පස්දුන්රට, හාපිටිගම හා පුලතිසිපුර විද්‍යාපීඨ අධීක්ෂණය.<br>♦ සියලුම පීඨාධිපතිවරුන් හා උප පීඨාධිපතිවරුන් සමග අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩසටහන් පැවැත්වීම.<br>♦ අධ්‍යයන කාර්යමණ්ඩල 40ක් සඳහා තොරතුරු තාක්ෂණ පුහුණුව ලබා දීම. |
| ජාතික ගුරු සංවර්ධනය, ගුරු අධ්‍යාපනය සහ ගුරු කළමනාකරණය | ♦ ගුරුවරුන්ගේ උසස්වීම්වලට අදාළ ව ක්‍රියාත්මක කරන මොඩියුල 05ක් හෝ සෑම ගුරු මධ්‍යස්ථානයකම ක්‍රියාත්මක කිරීම.<br>♦ දුරස්ථ අධ්‍යාපනය යටතේ නුපුහුණු ගුරුවරු 747ක් මධ්‍යස්ථාන 8ක දී පුහුණු කිරීම.<br>♦ ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථානවල අලුත්වැඩියා කාර්යයන් 41ක් හා නව ඉදි කිරීම් 20ක් සිදු කිරීම. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන (SBPTD) | ♦ පාසල් පාදක ගුරු සංවර්ධන වැඩසටහනට අදාළ ව උපදෙස් සංග්‍රහය මුද්‍රණය කිරීම හා අත් පත්‍රිකා බෙදා හැරීම.<br>♦ නියාමක පාසල් 65ක විදුහල්පතිවරුන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා වැඩසටහන් පැවැත්වීම.<br>♦ ඉ - ඉගෙනුම් මොඩියුල සකස් කිරීම යටතේ මොඩියුල 10ක් සකස් කිරීම.<br>♦ වැඩසටහන් නියාමනය සඳහා උපකරණ කට්ටලයක් සකස් කර බෙදා හැරීම. |
| **පාසල් නගා සිටුවීමේ වැඩසටහන හරහා පාසල් බල ගැන්වීම.** | |
| පාසල් බලගැන්වීමේ වැඩසටහන ශක්තිමත් කිරීම | ♦ පාසල් බලගැන්වීමේ වැඩසටහන [Enhanced Programme for School Improvement (EPSI)] සම්බන්ධයෙන් සකසන ලද මාර්ගෝපදේශයන් සියලු පාසල් වෙත බෙදා හැරීම.<br>♦ පාසල් බලගැන්වීමේ වැඩසටහන සියලු රජයේ පාසල්වල ක්‍රියාත්මක කිරීම සඳහ නිලධාරීන් පුහුණු කිරීම. |
| **ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ ප්‍රමිතීන් හා ගුණාත්මකභාවය තහවුරු කිරීම** | |
| පාසල් හා අධ්‍යාපන ආයතන ඇගයීම් තුළින් ප්‍රමිතීන් හා ගුණාත්මකභාවය තහවුරු කිරිම | ♦ ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳව පළාත් 9 තුළ තෝරාගත් විදුහල්පතිවරු 1,000ක් දැනුම්වත් කිරීම.<br>♦ කලාප මට්ටමින් පසු ගිය වසරේ දී හඳුනාගත් විශිෂ්ට ව්‍යවහාර 50ක් සඳහා ප්‍රණාම ලබා දීම.<br>♦ පාසල් අභ්‍යන්තර හා බාහිර ඇගයීම් තොරතුරු අනාවරණ විශ්ලේෂණ ඇතුළත් කර 2020 වාර්ෂික වාර්තාව සකස් කිරීම හා මුද්‍රණය කිරීම.<br>♦ අධ්‍යාපන ගුණාත්මක තහවුරුව හඳුනාගත් ගැටලු පදනම් ව සිදුකළ පර්යේෂණ10ක් සමාලෝචනය කිරීම.<br>♦ අධ්‍යාපන ගුණාත්මක දර්ශකය 50%ට අඩු පාසල් 35ක විදුහල්පතිවරුන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම.<br>♦ ගුරුවරුන්ගේ කාර්යක්ෂමතාව හා කුසලතා සංවර්ධනය කිරීම සඳහා වූ ජාතික ගුරු නිපුණතා රාමුවේ අවසන් පිටපත සකස් කර අනුමැතිය ලබා ගැනීම. |
| **පාසල්, කලාප, පළාත් හා ජාතික මට්ටමේ අධ්‍යාපන කළමනාකරණ ක්‍රියාවලිය සවිබල ගැන්වීම** | |
| **තොරතුරු පද්ධතීන් යාවත්කාලීන කිරීම හා කාර්යමණ්ඩල අවශ්‍යතා නිර්ණය කිරීම** | ♦ ජාතික මට්ටමේ ශිෂ්‍ය තොරතුරු පද්ධතියේ ( SIS) නව අංග පිළිබඳව කලාප සම්බන්ධීකරණ නිලධාරීන් පුහුණු කිරීම පළාත් 7ක අවසන් කිරීම.<br>♦ ගුරු තොරතුරු පද්ධතියට පිවිසීම සඳහා ගුරුවරුන්ට දුරකතන මෘදුකාංගයක් හඳුන්වාදීම. |

| පාසල්, කලාප, පළාත් හා ජාතික මට්ටමේ අධ්‍යාපන කළමනාකරණ ක්‍රියාවලිය සවිබල ගැන්වීම | |
|---|---|
| | ♦ ජාතික මට්ටමේ මාර්ගගත ගුරු තොරතුරු පද්ධතිය (THRM) භාවිතය පිළිබඳ චක්‍රලේඛය හා උපදෙස් සංග්‍රහය නිකුත් කිරීම<br>♦ අධ්‍යාපන ආයතනවල අධ්‍යයන කාර්යමණ්ඩල පිළිබඳ තීරණ ගැනීම සඳහා කාර්යමණ්ඩල සමාලෝචන හා නිර්ණය කමිටුව පිහිටුවීම හා අදාළ කාර්යයන් සිදුකිරීම. |
| **මානව සම්පත් සංවර්ධනය** | ♦ සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය යටතේ අධ්‍යාපන පරිපාලන නිලධාරීන්, විෂයමාලා සංවර්ධකයින් සහ ගුරු අධ්‍යාපනඥයින් සඳහා විදේශීය පශ්චාත් උපාධි පාඨමාලා ලබා දීමේ වැඩසටහනට නිලධාරීන් 101 දෙනෙකු තෝරා ගනු ලැබූ අතර දැනට නිලධාරීන් 05 දෙනෙකු මාර්ගගත ක්‍රමවේදය යටතේ පාඨමාලාවන්ට ඇතුළත් වී ඇත.<br>♦ විදුහල්පති නිපුණතා රාමුවට අදාළ ව මූලික විදුහල්පති පුහුණු ( BPP) වැඩමුළු පවත්වා පැවරුම් පරීක්ෂා කිරීම.<br>♦ පිරිවෙන් මාණ්ඩලික නිලධාරී ( ගිහි / පැවිදි) 72 ක් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.<br>♦ උසස් විදුහල්පති පුහුණුව (APP)සඳහා පාඨමාලාව සැකසීම.<br>♦ ශ්‍රී.ලං.අ.ප.සේ. නිලධාරීන් හා අනධ්‍යයන නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම. |
| **අධ්‍යාපන සේවාවන්හි තනතුරු පුරප්පාඩු පිරවීම** | ♦ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ සේවා ව්‍යවස්ථා සංශෝධනය සිදු කිරීම.<br>♦ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ විශේෂ ශ්‍රේණියට 10 දෙනෙකු උසස් කිරීම.<br>♦ ජාතික පාසල් විදුහල්පති තනතුරු 166ක් සඳහා ශ්‍රේණිධාරී විදුහල්පතිවරු පත් කිරීම.<br>♦ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ ස්ථිර කිරීම් 820ක් සිදු කිරීම.<br>♦ ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් 1 පන්තියට 636ක් සහ 2 පන්තියට 422ක් ලෙස උසස්වීම් සිදු කිරීම.<br>♦ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ හා ගුරු විද්‍යාලවල පැවති පීඨාධිපති, උප පීඨාධිපති හා ගුරු විද්‍යාලවල විදුහල්පති යන තනතුරු පුරප්පාඩු 84කින් සුදුසුකම් ලද නිලධාරීන් ගණන අනුව පුරප්පාඩු 53ක් සම්පූර්ණ කිරීම. |
| **සාක්ෂි පදනම් කර ගත් අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම්කරණය,පර්යේෂණ සහ ප්‍රතිඵල පාදක නියාමනය හා ඇගයීම සවිබල ගැන්වීම.** | |
| සාක්ෂි පදනම් කරගත් අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදනය, සැලසුම්කරණය, පර්යේෂණ සහ ප්‍රතිඵල පාදක නියාමනය හා ඇගයීම සවිබල ගැන්වීම | ♦ 2020 -2025 කාලය සඳහා මධ්‍යකාලීන අයවැය රාමුව ද ඇතුළත් මධ්‍ය කාලීන පෙරලුම් සැලැස්ම කෙටුම්පත් කිරීම.<br>♦ 8වන ශ්‍රේණියේ සිසුන්ගේ ඉගෙනුම් සාධන මට්ටම් පිළිබඳ ජාතික තක්සේරුකරණ වැඩසටහනට අදාළ ව 2019 වර්ෂයේ එළි දක්වා ඇති ජාත්‍යන්තර ඇගයීම් සඳහා ශ්‍රී ලංකාවේ සිසුන්ගේ සූදානම පිළිබඳ අධ්‍යයනය වාර්තාව සමාලෝචනය කිරීම. |

| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| | ♦ විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධීකරණය යටතේ ආසියානු සංවර්ධන බැංකු ආධාර මත යෝජිත ද්විතීයික අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කිරීම<br>♦ අධ්‍යාපනය සඳහා කෝවිඩ් වසංගතයේ බලපෑම පිළිබඳ යුනිසෙෆ් ආයතනය විසින් සිදුකරන අධ්‍යයනය පිළිබඳ සාකච්ඡා කිරීම සහ අවශ්‍ය තොරතුරු සැපයීම .<br>♦ ජාතික පාසල් 1000 ව්‍යාපෘතිය සහ ත්‍රෛභාෂා පාසල් 20ක් පිහිටුවීම සම්බන්ධව සැලසුම් සකස් කිරීම හා අවශ්‍ය තාක්ෂණික කටයුතු සිදු කිරීම.<br>♦ අධ්‍යාපන ප්‍රතිපත්තීන් ක්‍රියාත්මක කිරීම හා ද්විපාර්ශ්වීය හා බහු පාර්ශ්වීය එකඟතා සමාලෝචනය සඳහා අදාළ ජාත්‍යන්තර ආයතන සමග සම්බන්ධීකරණය සිදු කිරීම.<br>♦ පාසල් ව්‍යුහ කටයුතු පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීම<br>♦ කෝවිඩ් වසංගත තත්වයට මුහුණදීම සඳහා සමස්ත අධ්‍යාපන ක්ෂේත්‍රය හා ලෝක බැංකු අධ්‍යාපන ව්‍යාපෘතිය සඳහා හදිසි ප්‍රතිචාර සැලැස්ම (Contingency Emergency Response Plan) සකස් කර ප්‍රතිපාදන ප්‍රමුඛතාකරණය කර ක්‍රියාත්මක කිරීම<br>♦ අධ්‍යාපනය පිළිබඳ කාර්යසාධක බලකාය 2019 දෙසැම්බර් 15 වන දින සිට අධ්‍යාපන අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක කර නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා සකස් කිරීම සහ එම යෝජනා පිළිබඳව අදාළ ආයතනවල නිලධාරීන් දැනුම්වත් කිරීම. |
| අධ්‍යාපන පර්යේෂණ තුළින් අධ්‍යාපන සංවර්ධනය | ♦ අධ්‍යාපන පර්යේෂණ ක්‍රමවේද පිළිබඳව පර්යේෂකයින් 40 දෙනෙකුගේ ධාරිතා සංවර්ධනය<br>♦ සාක්ෂි පදනම් කරගත් තීරණ ගැනීම (EBDM) පදනම් කර ගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ශිෂ්‍යයන් සඳහා වැඩසටහනක් පැවැත්වීම.<br>♦ අධ්‍යාපන පර්යේෂණ අනාවරණය සඳහා අධ්‍යාපන පර්යාවලෝක සඟරාව මුද්‍රණය කිරීම.<br>♦ සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය තුළ පර්යේෂණ සංස්කෘතිය ප්‍රවර්ධනය සඳහා පර්යේෂණ වාර්තා 9ක් සඳහා පර්යේෂණ ප්‍රදාන ලබා දීම. |

<table>
<tr><th>ක්ෂේත්‍රය</th><th>ළඟා කර ගත් ප්‍රගතිය</th></tr>
<tr><td colspan="2">නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්තිය සහතික කිරීම</td></tr>
<tr><td>පාසල් දරුවන් සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම</td><td>
<table>
<tr><th>ලබා දෙන ශිෂ්‍යත්වය</th><th>ප්‍රතිලාභීන් සංඛ්‍යාව</th><th>මුළු වියදම රු.මි.</th></tr>
<tr><td>සුභග ශිෂ්‍යත්වය</td><td>559</td><td>13.97</td></tr>
<tr><td>5 ශ්‍රේණි ශිෂ්‍යත්වධාරීන් සඳහා ශිෂ්‍යාධාර</td><td>135,000</td><td>1,169.20</td></tr>
<tr><td>තාක්ෂණවේදය ශිෂ්‍යත්වය</td><td>750</td><td>3.06</td></tr>
<tr><td>සුජාත දියණි ශිෂ්‍යත්වය</td><td>250</td><td>1.12</td></tr>
</table>
</td></tr>
</table>





| ක්ෂේත්‍රය | ළඟා කර ගත් ප්‍රගතිය |
|---|---|
| **පාසල් පද්ධතිය තුළ සුරක්ෂිත හා ආකර්ෂණීය ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීම (ළඟ ම පාසල හොඳ ම පාසල ව්‍යාපෘතිය)** | |

| | ලබාදුන් භෞතික සම්පත් | 2016 - 2020 | |
|---|---|---|---|
| මෑත කාලීනව කිසිදු ව්‍යාපෘතියකට අයත් නොවූ අ.පො.ස. (උ.පෙළ) සහිත පාසල් 1,360ක් පමණ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | නව ඉදිකිරීම් | ආරම්භ කළ සංඛ්‍යාව | අවසන් කළ සංඛ්‍යාව |
| | ආපනශාලා | 51 | 45 |
| | ක්‍රීඩා සංකීර්ණ | 5 | 3 |
| | කණිෂ්ඨ ද්විතියික විද්‍යාගාර | 218 | 176 |
| | ප්‍රාථමික ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථාන | 403 | 367 |
| | තාක්ෂණ ගොඩනැගිලි | 245 | 199 |
| | ගොඩනැගිලි අලුත්වැඩියා | | |
| | අලුත්වැඩියා කාර්යයන් | 872 | 841 |
| | ජාතික පාසල්වල ගොඩනැගිලි අලුත්වැඩියා හා ඉදිකිරීම් | 528 | 291 |
| | ඉහත ගොඩනැගිලි සඳහා අවශ්‍ය භාණ්ඩ හා උපකරණ සැපයීම | | |
| ද්විතීයික පාසල් 1000ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | පන්තිකාමර ගොඩනැගිලි | 388 | 289 |
| | ගුරු නේවාසිකාගාර | 100 | 86 |
| | විදුහල්පති නිල නිවාස | 156 | 145 |
| | සෞන්දර්ය ඒකක | 24 | 18 |
| | ගොඩනැගිලි අලුත්වැඩියා | 1029 | 966 |
| | ජාතික පාසල්වල අලුත්වැඩියා හා ඉදිකිරීම් | 1131 | 696 |
| | ඉහත ගොඩනැගිලි සඳහා අවශ්‍ය භාණ්ඩ හා උපකරණ සැපයීම | | |
| ප්‍රාථමික පාසල් 3,577ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | ප්‍රාථමික ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය | 391 | 349 |
| | ගොඩනැගිලි අලුත්වැඩියා | 2469 | 2444 |
| | ඉහත ගොඩනැගිලි සඳහා අවශ්‍ය භාණ්ඩ හා උපකරණ සැපයීම | | |
| සියලුම පාසල්වලට විදුලිබල පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය | විදුලිබල පහසුකම් සැපයීම හා වැඩි දියුණු කිරීම | 2633 | 2351 |
| සියලුම පාසල්වලට ජල පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය | ජල පහසුකම් සැපයීම හා වැඩි දියුණු කිරීම | 709 | 666 |
| සියලුම පාසල්වලට සනීපාරක්ෂක පහසුකම් සැපයීමේ ව්‍යාපෘතිය | සනීපාරක්ෂක පහසුකම් සැපයීම හා වැඩි දියුණු කිරීම | 3674 | 3595 |
| ග්‍රාමීය හා දුෂ්කර ප්‍රදේශවලට ප්‍රමුඛත්වය ගුරු නිල නිවාස, පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | නව ගුරු නිවාස ඉදිකිරීම | 240 | 233 |
| වතුකරයේ පාසල් 25ක් ද්විතීයික මට්ටමට උසස් කිරීමේ ව්‍යාපෘතිය | නව ගොඩනැගිලි ඉදිකිරීම | 35 | 31 |
| පාසල්වල දන්ත සෞඛ්‍ය පහසුකම් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය | නව දන්ත සායන ඉදිකිරීම් | 19 | 15 |
| | දන්ත සායන අලුත්වැඩියා | 116 | 105 |

## 2.1.2 ශිෂ්‍ය කාර්ය සාධනය


### (අ) පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ ශිෂ්‍ය සාධනය

**පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව සහ ශිෂ්‍ය සාධනය (2015 – 2020)**

| | 2015 | 2016 | 2017 | 2018 | 2019 | 2020 |
|---|---|---|---|---|---|---|
| පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 333,672 | 343,757 | 350,462 | 350,191 | 332,179 | 326,264 |
| ලකුණු 70ට වඩා ලැබූ ශිෂ්‍ය ප්‍රතිශතය (%) | 76.33 | 75.67 | 69.40 | 79.09 | 78.10 | 86.83 |
| මධ්‍යන්‍ය ලකුණ | 109.50 | 107.86 | 106.43 | 117.98 | 114.38 | 125.65 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ඇගයීම් වාර්තාවන්

**පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 70ට වඩා ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය (2015 – 2020)**





මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ඇගයීම් වාර්තාව

### (ආ) අ.පො.ස. (සා.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය

**අ.පො.ස. (සා/පෙළ) විභාගයෙන් අ.පො.ස. (උ/පෙළ) සඳහා සුදුසුකම්ලත් ශිෂ්‍ය සංඛ්‍යාව සහ ප්‍රතිශතය (2015 – 2019)**

| | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 273,224 | 286,251 | 296,812 | 296,029 | 305,427 |
| සමත් ශිෂ්‍ය සංඛ්‍යාව | 189,428 | 200,208 | 216,815 | 222,281 | 225,539 |
| සමත් ප්‍රතිශතය % | 69.3 | 69.9 | 73.0 | 75.1 | 73.84 |

මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ඇගයීම් වාර්තාව




මූලාශ්‍රය - ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව


## (ඇ) අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය


**අ.පො.ස. (උ.පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය (පාසල් අයදුම්කරුවන්) 2016-2020**


| | 2016 | 2017 | 2018 | 2019 (නව නිර්දේශය) | 2019 (පැරණි නිර්දේශය) | 2020 (නව නිර්දේශය) | 2020 (පැරණි නිර්දේශය) |
|---|---|---|---|---|---|---|---|
| පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 211,865 | 206,630 | 218,191 | 173,781 | 61,769 | 251,168 | 24146 |
| විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍ය සංඛ්‍යාව | 134,238 | 136,421 | 141,172 | 108,353 | 46,552 | 165,711 | 15,960 |
| විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍ය ප්‍රතිශතය (%) | 63.36 | 66.02 | 64.70 | 62.35 | 75.36 | 65.98 | 66.10 |


මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ඇගයීම් වාර්තාව


**එක් එක් විෂය ධාරාවෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය ප්‍රතිශතය**
**( පළමු වරට පෙනී සිටින 2016 - 2019)**









මූලාශ්‍රය : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ඇගයීම් වාර්තාව

## 2.1.3 කොවිඩ් -19 වසංගත තත්වය හමුවේ දරුවන්ගේ අධ්‍යාපනය පසුබෑමට ලක් නොවීම සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග

කොවිඩ් - 19 වසංගත තත්වය හමුවේ පාසල් දරුවන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව ප්‍රමුඛත්වයේ ලා සලකමින් 2020 මාර්තු 13 වන දින පාසල්වලට නිවාඩු ලබා දෙන ලදි. එහිදී දරුවන්ගේ අධ්‍යාපනය අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා දුරස්ථ අධ්‍යාපන ක්‍රමවේද හඳුන්වාදීමේ අභියෝගය හමුවේ අනෙකුත් රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන හා එක්ව අමාත්‍යාංශ මට්ටමින් පළාත්, කලාප හා පාසල් සම්බන්ධීකරණය කර ගනිමින් වැඩසටහන් රැසක් ක්‍රියාවට නංවන ලදි.

- අධ්‍යාපන අමාත්‍යාංශය හා ජාතික අධ්‍යාපන ආයතනය, ශ්‍රී ලංකා රූපවාහිණී සංස්ථාව හා එක්ව අධ්‍යාපනය සඳහා ම වෙන්ව වූ රූපවාහිණී නාලිකාවක් දියත් කරන ලද අතර සිංහල හා දෙමළ මාධ්‍යයෙන් විෂයානුබද්ධ වැඩසටහන් දවස පුරා විකාශනය කරනු ලැබේ.
- අධ්‍යාපන අමාත්‍යාංශයේ ජාතික ඉ - ඉගෙනුම පද්ධතිය වන ඉ-තක්සලාව වැඩිදියුණු කරමින් සිංහල හා දෙමළ මාධ්‍යයෙන් 1 ශ්‍රේණියේ සිට 5 ශ්‍රේණිය දක්වා පාඩම්, අභ්‍යාස, ප්‍රශ්න පත්‍ර හා ක්‍රියාකාරකම් ද, 6 ශ්‍රේණියේ සිට 13 වන ශ්‍රේණිය දක්වා සිංහල දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඩම්, අභ්‍යාස, ප්‍රශ්න පත්‍ර අන්තර්ජාලය ඔස්සේ ප්‍රවේශ වීමට ඉඩසලසා ඇත.
- 1 සහ 2 ශ්‍රේණිවල සිසුන් වෙනුවෙන් අන්තර්ජාල හෝ රූපවාහිනී පහසුකම් නොමැතිව වුවද, නිවසේ සිට භාෂාව, ගණිතය හා පරිසර අධ්‍යයනය යන විෂයයන් ක්‍රියාකාරකම් පාදකව අඛණ්ඩව කරගෙන යාම සඳහා ඕස්ට්‍රේලියානු රජය, UNICEF, Save the Children, Room to Read, Child Fund යන ආයතන සහ ජාතික අධ්‍යාපන ආයතනය සමග එක්ව ඉගෙනුම් ද්‍රව්‍ය පැකේජයක් සපයන ලදි.
- දරුවන්ට මඟ හැරුනු පාඩම් ආවරණය කර ගනිමින් විභාගවලට පෙනී සිටීමට කාලය ලබා දීමේ අරමුණින් අගෝස්තු මස පැවැත්වීමට නියමිතව තිබූ 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය හා අ.පො.ස (උ.පෙ.) විභාගය ඔක්තෝබර් දක්වා කල් දමන ලදි.
- පාසල් වසා තිබුණු කාලය තුළ පාසල් පෝෂණ වැඩසටහන ක්‍රියාත්මක කළ නොහැකි වුව ද ශිෂ්‍යයන්ගේ පෝෂණ මට්ටම පවත්වා ගැනීම සඳහා ලෝක ආධාර වැඩසටහනේ ද මූල්‍ය ආධාර ලබා ගනිමින් අදාළ පාසල්වල ශිෂ්‍යයන්ගේ නිවෙස්වලට වියළි ආහාර සලාකයක් ලබා දීමට පියවර ගන්නා ලදි.
- අධ්‍යාපන අමාත්‍යාංශය ඩයලොග් ආසියාටා සමාගම සමග එක්ව අන්තර්ජාල පහසුකම් සහිත හෝ රහිත ඕනෑම දුරකථනයක් භාවිතයෙන් ගාස්තු රහිතව නිවසේ සිටම පාසලේ ගුරුවරුන්ගෙන් එකවර සිසු දරුවන් 45ක් දක්වා වූ ප්‍රමාණයක් සම්බන්ධ කරගනිමින් අධ්‍යාපනය ලබාදීමට අවස්ථාව සලසන ලදී. ආරම්භක අදියරේ දී පළාත් නවයෙන් තෝරා ගත් පාසල් 100ක මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී.
- නිවසේ සිට අධ්‍යයන කටයුතුවල යෙදෙන සාමාන්‍ය පෙළ දරුවන්ට මතුවන විෂය ගැටලු විසඳාලීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මගින් **1377** අංකය යටතේ දුරකතන සේවාවක් ගාස්තු රහිත ව ඩයලොග් ආසියාටා සමාගමේ මූලිකත්වයෙන් සහ තැපැල් හා විදුලි සංදේශන කොමිෂන් සභාවේ සහයෝගයෙන්, ශ්‍රී ලංකා මොබිටෙල් සමාගම, එයාර්ටෙල් ආයතනය, හච් ආයතනය, ශ්‍රී ලංකා ටෙලිකොම් සහ ලංකාබෙල් යන දුරකථන සන්නිවේදන ආයතන එක්ව ක්‍රියාත්මක කරන ලදී.
- නිවෙස්වලට කොටුවී අධ්‍යාපනය ලබන දරුවන්ගේ මානසික සුවය සඳහාත් නිර්මාණශීලීත්වය එළිදැක්වීම සඳහාත් 'රටක් වටින පොතක්' වැඩසටහන හඳුන්වා දෙමින් පොත් ලිවීම සඳහා දරුවන් පොළඹවන ලදි.

**පාසල් නැවත විවෘත කිරීම හා සෞඛ්‍යාරක්ෂිතව පවත්වා ගැනීම**

සෞඛ්‍ය අංශවල උපදෙස්වලට අනුව වසංගත තත්වය අඩුවීමත් සමඟ 2020 ජූලි 6 වන දින සිට නැවත අදියර වශයෙන් පාසල් විවෘත කිරීමට කටයුතු කරන ලදි. ඒ සඳහා ගනු ලැබූ ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

- කොවිඩ් 19 පැතිරීම වැලැක්වීමට පාසල් හා අධ්‍යාපන ආයතන සූදානම් කිරීම හා සෞඛ්‍යාරක්ෂිතව පාසල් පවත්වා ගෙන යාම පිළිබඳව චක්‍රලේඛය සහ උපදෙස් සංග්‍රහය නිකුත් කිරීම සහ පාසල් සඳහා මාර්ගෝපදේශ ඇතුළත් "යහ පුරුද්දෙන් සුව පැවැත්මක්" නම් වූ සංයුක්ත තැටිය පාසල් වෙත බෙදා හැරීම.
- පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටුව හා කලාප පළාත් මට්ටමේ සෞඛ්‍ය ප්‍රවර්ධන කමිටු සක්‍රීයව පවත්වා ගනිමින් එම කමිටුවල තහවුරුවෙන් පසු පාසල් ආරම්භ කිරීමට ක්‍රියා කිරීම.
- පාසල් විෂබීජහරණය , අත් සේදීම සඳහා පහසුකම් සැපයීම, දුරස්ථභාවය ආරක්ෂා වන අයුරින් පන්ති කාමර සකස් කිරීම,විවේක ගැනීම් කාමර සකස් කිරීම යනාදී පියවර පිළිබඳ සියලුම පාසල් හා අදාළ බලධාරීන් දැනුම්වත් කර එම කාර්යයන් ඉටු කිරීම සඳහා ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් කරගෙන පාසල්වලට ප්‍රතිපාදන ලබාදීම.
- අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ පළාත්, කලාපවල නිලධාරීන් පාසල් විවෘත කිරීමට පෙර සෞඛ්‍ය අංශවල ද සහාය ලබා ගෙන පාසල් මට්ටමට ගොස් විවෘත කිරීමේ සූදානම පිළිබඳ ව සෘජු පරීක්ෂාවට ලක් කර අවශ්‍ය පහසුකම් සැලසීම.
- දරුවන්ගේ සෞඛ්‍ය ආරක්ෂාව පිළිබඳ ව පූර්ණ අවධානය යොමු කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ආරක්ෂක අංශවල සහ සෞඛ්‍ය අංශවල සහාය ලබා ගනිමින් 5වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය හා අ.පො.ස. (උ.පෙළ) විභාගය සාර්ථක ව පැවැත්වීම. එහි දී නිරෝධායනයට ලක්වන ප්‍රදේශවල දරුවන් වෙනුවෙන් විශේෂ විභාග මධ්‍යස්ථාන පැවැත්වීම, රෝහලේ ප්‍රතිකාර ලබන දරුවන් වෙනුවෙන් විශේෂ පහසුකම් යටතේ විභාග පැවැත්වීම, ප්‍රවාහන පහසුකම් සැලසීම, විභාග මධ්‍යස්ථානවල සෞඛ්‍ය ආරක්ෂාව තහවුරු කිරීම යන කාර්යයන් ඉටු කිරීම.
- කොවිඩ් 19 වසංගත තත්වයේ ව්‍යාප්තිය සැලකිල්ලට ගෙන නැවත 2020 ඔක්තෝබර් 05 වන දින සිට සියලුම පාසල් සඳහා නිවාඩු ලබා දෙන ලද අතර නොවැම්බර් 23 වන දින සිට බස්නාහිර පළාත හා අවදානම් සහිත ප්‍රදේශවල පාසල් හැර පාසල් 5100ක් පමණ 6-13 ශ්‍රේණි ආරම්භ කර පවත්වන ලදී.

## 2.2 පවත්නා අභියෝග

කොවිඩ් 19 වසංගත තත්ත්වය ලොව සෑම රටකම මෙන්ම අප රටෙහි අධ්‍යාපනයටද දැඩි බලපෑමක් එල්ල කර ඇත.දීර්ඝ කාලයක් පාසල් වසා තැබීමට සිදුවීම හා පාසල් ආරම්භ කළ ද වරින් වර එක් එක් ප්‍රදේශවල පාසල් වැසීමට සිදුවීම් තුළ දරුවන්ගේ අධ්‍යාපනය අභියෝගයට ලක්ව ඇත. මෙම අභියෝගයට මුහුණ දීම සඳහා නව දුරස්ථ ඉගැන්වීම් ප්‍රවේශයන් ක්‍රියාත්මක කිරීමට සෑම පාර්ශ්වයක්ම දිරිගැන්වී ඇත. ඒ අනුව මාර්ගගත ප්‍රවේශය ඔස්සේ ඉගැන්වීම, අධ්‍යාපන රූපවාහිනී නාලිකාවක් ක්‍රියාත්මක කිරීම, ඉගෙනුම් පැකේජ නිවෙස්වලට ලබාදීම වැනි පියවර ක්‍රියාත්මක කර ඇත.

එහිදී එම ඉගෙනුම් අවස්ථාවලට ප්‍රවේශවීම සඳහා දුෂ්කර ග්‍රාමීය ප්‍රදේශවල දරුවන්ට මෙන්ම අඩු ආර්ථික මට්ටමක් සහිත පවුල්වල දරුවන්ට පවතින බාධාවන් මග හැරිය යුතුව ඇත. එමෙන්ම එවැනි ඉගෙනුම් ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා පාසල් පද්ධතිය, විශේෂයෙන්ම ගුරුවරුන්, තාක්ෂණ මෙවලම් හා කුසලතා වලින් සන්නද්ධ විය යුතු අතර ඒ සඳහා ඔවුන් සූදානම් කිරීම වර්තමානයේ පවතින අභියෝගයකි.

දුරස්ථ අධ්‍යාපනය ක්‍රමවේදයන් හරහා විෂයානුබද්ධ ඉගෙනුම් ක්‍රියාවලිය සිදු කළ හැකි වුවද දරුවන්ගේ සමාජයීය, පෞරුෂ, මනෝ කායික වර්ධනය සඳහා දායක වන පාසල් ක්‍රියාකාරකම් මගහැරීයාම හේතුවෙන් දරුවන් තුළ ඇතිවිය හැකි පසුබෑම පිළිබඳ අවධානය යොමු කර ක්‍රියාමාර්ග ගත යුතුව ඇත.

විශේෂයෙන් ප්‍රාථමික ශ්‍රේණිවල දරුවන්ට පාසලෙන් ලබා දෙන මූලික කියවීමේ හා ලිවීමේ හැකියාව හා ගණික හැකියාවන් මඟ හැරී යාම තුළ ඔවුන්ගේ අනාගත අධ්‍යාපන ක්‍රියාවලියට දැඩි බලපෑමක් එල්ල විය හැකි බැවින් ඒ සඳහා අවධානය යොමු කළ යුතු ව ඇත.

විභාග කේන්ද්‍රීය විෂය මාලාවක් තුළ ශිෂ්‍යයාට අධ්‍යාපනය බරක් වීම දිගුකාලීනව පවතින ගැටළුවක් ලෙස හඳුනාගෙන ඇති අතර එම අභියෝගයන්ට මුහුණ දීම සඳහා නව විෂය මාලාවක් හා නව ඇගයීම් ක්‍රමයක් හඳුන්වාදීම සඳහා ක්‍රියාමාර්ග ගනිමින් පවතී.

ගුරු වෘත්තිය ආකර්ෂණීය වෘත්තියක් බවට පත් කිරීම, වැටුප් විෂමතා ඉවත් කිරීම, නව තාක්ෂණ කුසලතා ද සමගින් අඛණ්ඩව ගුරු අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගත යුතුව ඇත.එමෙන්ම දුෂ්කර ප්‍රදේශවල සමහර විෂයයන් සඳහා දිගින් දිගටම පවතින ගුරු හිඟය පියවීම විශාල අභියෝගයක්ව පවතී. එම ප්‍රදේශවලින් ගුරුවරුන් පද්ධතියට ඇතුල් නොවීම , ගුරුමාරු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ගැටළු, ගුරුවරුන් සඳහා නේවාසික හා ප්‍රවාහන පහසුකම් හිඟය යන ගැටළු පිළිබඳව අවධානය යොමු කළ යුතුව ඇත. එසේම කාන්තා ගුරු ප්‍රතිශතය වැඩිවීම හා ප්‍රසූත නිවාඩු හා අනෙකුත් නිවාඩු ලබාගන්නා ගුරු සංඛ්‍යාව ඉහළ යාම නිසා පන්ති කාමරයේ ඉගෙනුම් ක්‍රියාවලියට සිදුව ඇති බාධාවන්ද මඟ හැරීමට පියවර ගත යුතුව ඇත.

පාසල් පද්ධතියේ පවතින විෂමතා හේතුවෙන් දරුවන් පාසලට ඇතුළත් කිරීමට ඇතිවී තිබෙන තරඟකාරීත්වය හා ඊට සමගාමීව ඇතිවී තිබෙන ගැටළු රැසකි.සෑම දරුවෙකුටම දෙමාපියන් සෑහීමකට පත්වන අයුරින් හොඳ පාසලක් ලබාදීමේ අභියෝගය අප ඉදිරියේ ඇත.ඒ සඳහා ජාතික පාසල් 1000ක් හා ඒ වටා බැඳුණ පාසල් ජාලයක් දියුණු කිරීම සඳහා සැලසුම් කර ඇත.

## 2.3 ඉදිරි ඉලක්ක

### 2.3.1 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ

"සෞභාග්‍යයේ දැක්ම" රාජ්‍ය ප්‍රතිපත්තියේ "ඵලදායී පුරවැසියෙක් සහ සතුටින් ජීවත්වන පවුලක්" යටතේ ඇති සාමාන්‍ය අධ්‍යාපන පද්ධතියට අදාළ ප්‍රතිපත්තීන් යටතේ වූ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමට මේ වනවිටත් කටයුතු සැලසුම් කරමින් පවතී. ඒ අනුව මේ සඳහා දැනටමත් සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ පහත සඳහන් වැඩසටහන් ඉදිරි වසර තුළ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

1. නිදහස් අධ්‍යාපන අයිතීන් තවදුරටත් සුරක්ෂිත කිරීම.

   නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට වාර්ෂික ප්‍රතිපාදන යටතේ ප්‍රමුඛතාවයක් පිරිනැමීමට කටයුතු කිරීමට අපේක්ෂිතය (උදා: නොමිලේ අධ්‍යාපන අවස්ථා සැලසීම, නොමිලේ පෙළ පොත්, නිල ඇඳුම්, දිවා ආහාර සහ රක්ෂණ පහසුකම් ආදී)

2. ජාතික පාසල් 1000ක් දක්වා වැඩි කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරිම

   සියලුම භෞතික හා මානව පහසුකම්වලින් සම්පූර්ණ පාසල් 03 බැගින් සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම ඇතිවන පරිදි දැනට පවතින පළාත් සභා පාසල් ජාතික පාසල් ලෙස උසස් කර, ජාතික පාසල් සංඛ්‍යාව 1000 ක් දක්වා වැඩි කිරීම මූලික ප්‍රතිපත්තිමය හා සැලසුම් කාර්යයන් මේ වනවිට නිමකර ඇත.

   - මෙම වැඩසටහන අදියර දෙකකින් සමන්විත අතර, පළමු අදියරේ දී කිසිදු ජාතික පාසලක් නොමැති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 123 සඳහා එක් ජාතික පාසලක් බැගින් පාසල් 123 ක් ජාතික පාසල් ලෙස සංවර්ධනය කිරීමට සැලසුම් කර ඇත. මේ වනවිට අදාළ පාසල් 123 ම හඳුනා ගෙන ඇත.

   - දෙවන අදියරේ දී පාසල් 673ක්, පාසල් සිතියම්කරණ අභ්‍යාසයක් හරහා හඳුනාගෙන සංවර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත.

3. උක්ත ජාතික පාසල් 1,000ම ප්‍රමුඛ කොට, එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පිහිටි අනෙකුත් පාසල්වල දරුවන්ට එම පහසුකම් භුක්තිවිඳීමට හැකිවන පරිදි පාසල් ජාලයක්/පාසල් පොකුරක් (Cluster School system) ඇතිකිරීම.

3. ත්‍රෛභාෂා ද්විතියික, ජාතික පාසල් 20ක් දිස්ත්‍රික්ක 20ක් ආවරණය වන පරිදි ස්ථාපිත කිරීමට සැලසුම්කර ඇත.

3. විෂයමාලා සංවර්ධනය , ගුරු පුහුණුව සහ පාසල් සඳහා යටිතල පහසුකම් සහ උසස් අධ්‍යාපන ක්‍රියාවලියට අදාළ පහසුකම් සැලසීම.

   - විභාග කේන්ද්‍රීය ක්‍රමවේදයක් වෙනුවට ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන පද්ධතියක් සකස් කිරීම.
   - දරුවන්ගේ කුසලතා ඉහළ නැංවීම සඳහා සහ 21වන ශතවර්ෂයටත්, දැනුම් ආර්ථිකයටත් ගැළපෙන පරිදි හා තිරසර ලෙස විෂයමාලා රාමුව සකස් වී ඇති ද යන්න පිළිබඳව සමාලෝචනය හා විෂයමාලා රාමුව සකස් කිරීම.
   - ඒ අනුව, විෂයමාලා නවීකරණය හා සංවර්ධනය.
   - දරුවන් තුළ 21 වන ශතවර්ෂයේ කුසලතා ඔප් නැංවෙන පරිදි ශිෂ්‍ය පාදක ලෙස විෂයමාලාව සංශෝධනය කිරිම.
   - විෂයමාලා නවීකරණය හා විවිධාංගීකරණය.
   - අදාළ ගුරු භවතුන් විෂයමාලා නවීකරණය සංශෝධනය පිළිබඳව දැනුවත් කිරීම.

6. පූර්ව ප්‍රාථමික අධ්‍යාපනය සංවර්ධනය

- පෙර පාසල් විෂය මාලාවේ දැනට තිබෙන තත්ත්වය අධ්‍යයනය.
- පෙර පාසල් අධ්‍යාපනය දරුවන්ගේ සංවර්ධනයේ ප්‍රමුඛ අවධියක් වන බැවින් ඒ පිළිබඳ අදාළ මාර්ගෝපදේශ සකස් කිරීම.
- පෙර පාසල් විෂයමාලා රාමුවක් සකස් කිරීම.
- පෙර පාසල් ගුරුවරුන්ගේ සුදුසුකම් රාමුව පිළිබඳව මාර්ගෝපදේශයක් සංවර්ධනය කිරීම.
- පෙර පාසල්, ගුරු පුහුණුව පිළිබඳ ජාතික මට්ටමේ නිර්දේශ ලබාදීම.
- වයස අවුරුදු 3-4 වයසේ දරුවන් සඳහා පෙර පාසල් අධ්‍යාපනය ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රමෝපායන් නිර්දේශ කිරීම.

7. ප්‍රාථමික අධ්‍යාපනය

- දරුවන්ගේ වර්ධනය හා සංවර්ධන ප්‍රතිපත්ති / මූලධර්මවලට අදාළව : ප්‍රාථමික විෂයමාලාව නවීකරණය.
- තක්සේරුකරණය හා ඇගයීමේ ක්‍රමවේදය නවීකරණය.

8. ගුරු අධ්‍යාපනය හා වෘත්තීය සංවර්ධනය

- ගුරු අධ්‍යාපන විෂයමාලාව නවීකරණය කිරීම හා අඛණ්ඩ වෘත්තීය සංවර්ධනය සඳහා ගුරුවරුන්ට අවස්ථා ලබාදීම.
- පූර්ව සේවා ගුරු පුහුණුවේ දී, අධ්‍යාපනවේදී උපාධියක් ලබා ගත හැකි පරිදි ගුරු අධ්‍යාපන විද්‍යාපීඨ, විශ්වවිද්‍යාල ආයතන ලෙස උසස් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

9. තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය සහ මාධ්‍ය තාක්ෂණය, අධ්‍යාපනය සඳහා යොදා ගැනීමට පියවර ගැනීම

- සියලුම දරුවන් සඳහා තොරතුරු තාක්ෂණ ඥානය ලබාගත හැකි පරිදි ප්‍රතිපත්ති සකස්කිරීම හා අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා පියවර ගැනීමට කටයුතු කිරීම.

10. සෞඛ්‍ය, පෝෂණය, ශාරීරික අධ්‍යාපනය සහ ක්‍රීඩා සංවර්ධනය සඳහා අවශ්‍ය පියවර ගැනීම.

11. සෞන්දර්යය කුසලතා දරුවන් තුළ සංවර්ධනය සඳහා පියවර ගැනීම.

12. ඉංග්‍රීසි අධ්‍යාපනය සංවර්ධනය සඳහා පියවර ගැනීම.

- විශේෂයෙන්ම ඉංග්‍රීසි ඉගැන්වීමේ ක්‍රම නවීකරණය කිරීමට පියවර ගනු ලැබේ.

### 2.3.2 සාමාන්‍ය අධ්‍යාපනය මධ්‍යකාලීන සැලැස්ම තුළ අන්තර්ගත වැඩසටහන්

සෞභාග්‍යයේ දැක්ම රාජ්‍ය ප්‍රතිපත්තියේ යෝජිත නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණයන්ට අමතරව, සාමාන්‍ය
අධ්‍යාපන මධ්‍යකාලීන සැලසුම තුළ අන්තර්ගත පහත සඳහන් ප්‍රධාන වැඩසටහන් ද, ඉදිරි වසර 5ක කාලය තුළ සාමාන්‍ය අධ්‍යාපනයේ උන්නතිය වෙනුවෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

1. අධ්‍යාපනයේ සම සාධාරණත්වය ශක්තිමත් කරමින් සියලුම දරුවන් සඳහා සම සාධාරණ අධ්‍යාපන අවස්ථා ලබා දීම.

    - 13 වසරක සහතික කරන ලද අධ්‍යාපනය

      අ.පො.ස. (සා.පෙළ) විභාග ප්‍රතිඵල පිළිබඳ නොසලකා, සියලුම දරුවන්ට උසස් පෙළ සඳහා ඇතුළත් විය හැකි පරිදිත්, කිසිදු වෘත්තීය කුසලතාවයකින් තොරව පාසල් පද්ධතියෙන් ඇද හැලෙන දරුවන් සඳහා වෘත්තීය කුසලතා ලබා ගත හැකි පරිදි වෘත්තීය විෂයයන් 26කින් යුතු විෂයමාලාව උසස් පෙළ සඳහා හඳුන්වාදෙන ලදි. මෙම වැඩසටහන ශ්‍රී ලංකාවේ අනාගත ප්‍රතිපත්තීන් හා මෙම විෂයයන්ගේ වලංගුතාවයන් සලකා බලා විශ්ලේෂණය කර නවීකරණය තුළින් ඉදිරියට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ.

    - නිදහස්/නොමිලේ අධ්‍යාපනය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා පියවර ගැනීම.
    - ප්‍රාථමික හා ද්විතීයික අංශයේ දරුවන් සඳහා සම සාධාරණ ඉගෙනුම් ප්‍රවේශ ලබාදීම සඳහා අදාළ
      වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
    - ආරක්ෂිත හා ආකර්ශණීය ඉගෙනුම් පරිසරයක් පාසල් තුළ ඇතිකිරීම සඳහා පියවර ගැනීම.
    - වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශන වැඩසටහන් ශක්තිමත් කිරීම.

2. අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම

    - විෂයමාලා නවීකරණය හා විවිධාංගීකරණය.
    - විද්‍යා, තාක්ෂණ, ගණිතය හා ඉංග්‍රීසි යන විෂයයන් සංවර්ධනය සඳහා අදාළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
    - ඩිජිටල් පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම යොදා ගැනීම සංවර්ධනය කිරීම තුළින් ඉගෙනුම් ඉගැන්වීම සංවර්ධනය.
    - දරුවන්ගේ පරිවර්තීය කුසලතා (Transversal Skills), සංවේදී - සාමාජීය කුසලතා (Socio-emotional skills), අගනාකම් (Values), සහ ආචාරධර්ම (ethics) සංවර්ධනය කිරීම සඳහා මූලිකත්වය ලබාදීම.
    - ගුරු අධ්‍යාපනය, ගුරු සංවර්ධනය සහ ගුරු කළමනාකරණය වඩාත් ඵලදායීව සිදුකිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
    - ශිෂ්‍ය තක්සේරුකරණය සහ ඇගයීම් ක්‍රමවේද තවදුරටත් වැඩි දියුණු කිරීම.
    - වඩාත් ආකර්ශණීය සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට හිතකර ඉගෙනුම් ඉගැන්වීම් පරිසරයක් නිර්මාණය කිරීම තුළින් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ඉගෙනුම් ඵල තවදුරටත් ඉහළ නැංවීම.

3. අධ්‍යාපනයේ හිමිකාරීත්වය සහ සේවා සැපයීම ශක්තිමත් කිරීම

    - පාසල් අධීක්ෂණ ක්‍රියාවලිය සවිබල ගැන්වීම මඟින් ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම.
    - පාසල් පාදක කළමනාකරණය ශක්තිමත් කිරීම තුළින් පාසල් සවිබල ගැන්වීමේ ක්‍රියාවලිය සඳහා තවදුරටත් දායකත්වය ලබාදීම.
    - කලාප, කොට්ඨාශ, පළාත් සහ ජාතික මට්ටමේ අධ්‍යාපන පරිපාලනය සහ කළමනාකරණය ශක්තිමත් කිරීම.
    - වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

4. සාක්ෂි මත පදනම්ව අධ්‍යාපන ප්‍රතිපත්ති සැකසීම සහ අධ්‍යාපන සැලසුම්කරණය
    - අධ්‍යාපන පර්යේෂණ, ප්‍රතිඵල-පාදක නියාමනය සහ ඇගයීම් සහ අධ්‍යාපන ප්‍රතිපත්ති සැකසීම හා සැලසුම්කරණය ශක්තිමත් කිරීම.
    - අධ්‍යාපනික අත්පත් කරගැනීම් සම්බන්ධව මහජනතාව දැනුම්වත් කිරීම.

# 03. පරිච්ඡේදය
# 2020 වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

**3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය**

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා

මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය රු.

| අයවැය 2020 | | සටහන | තත්‍ය 2020 | තත්‍ය 2019 | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | අන්තර් ජාතික වෙළඳාම මත බදු | 3 | - | - | ACA-1 |
| - | බදු නොවන ආදායම් සහ වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිමය | | 71,256,548,034 | 65,644,855,470 | |
| - | තැන්පතු | | 1,990,656,506 | 706,313,135 | ACA-3 |
| 650,000,000 | අත්තිකාරම් ගිණුම | | 953,437,647 | 1,251,703,013 | ACA-4 |
| - | වෙනත් ලැබීම් | | 2,655,447,247 | 2,203,236,207 | ACA-5/5(a) / 5(b) |
| 650,000,000 | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **76,856,089,434** | **69,806,107,825** | |
| **650,000,000** | මුළු ආදායම් ලැබීම් හා ආදායම් නොවන ලැබීම් ඇ=(අ) + (ආ) | | **76,856,089,434** | **69,806,107,825** | |
| | **අඩුකළා: වියදම්** | | | | |
| | **පුනරාවර්තන වියදම්** | | - | - | |
| 39,280,505,000 | වේතන, වැටුප් හා අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 38,073,031,496 | 36,044,077,200 | |
| 716,240,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 693,566,937 | 1,074,360,308 | |
| 3,208,135,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 3,062,528,871 | 18,895,333,121 | ACA-2 (ii) |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | 90,701 | |
| **43,204,880,000** | **මුළු පුනරාවර්තන වියදම් (ඈ)** | | **41,829,127,304** | **56,013,861,330** | |
| | **<u>මූලධන වියදම්</u>** | | | | |
| 634,470,000 | මූලධන වත්කම් පුනරුත්තාපන හා වැඩි දියුණු කිරීම් | 10 | 543,883,280 | 2,861,225,783 | |
| 12,250,295,900 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 11,311,354,040 | 12,306,391,727 | |
| 826,224,150 | ප්‍රාග්ධන පැවරීම් | 12 | 754,474,953 | 59,250,000 | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම් | 13 | - | - | ACA-2 (ii) |
| 1,116,531,000 | ධාරිතා වර්ධනය | 14 | 1,095,680,701 | 730,034,178 | |
| 2,064,073,950 | වෙනත් මූලධන වියදම් | 15 | 2,033,659,274 | 1,443,354,871 | |
| **16,891,595,000** | මුළු මූලධන වියදම් (ඉ) | | **15,739,052,248** | **17,400,256,559** | |
| | | | | | |
| | ප්‍රධාන ලෙජර වියදම් (ඊ) | | 2,922,066,298 | 2,077,622,548 | |
| | තැන්පතු ගෙවීම් | | 2,050,166,611 | 874,989,190 | ACA-4 |
| 1,000,000,000 | අත්තිකාරම් ගෙවීම් | | 871,899,687 | 1,202,633,358 | ACA-5/5(a) / 5(b) |
| | මුළු වියදම් උ=(ඈ+ඉ+ඊ) | | 60,490,245,850 | 75,491,740,437 | |
| 1,000,000,000 | 2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ=(ඇ-උ) | | **16,365,843,584** | **(5,685,632,612)** | |

## 3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | සටහන | තත්‍ය | |
|---|---|---|---|
| | | 2020 (රු.) | 2019 ( රු.) |
| **<u>මූල්‍ය නොවන වත්කම්</u>** | | | |
| දේපල, පිරියත හා උපකරණ | ACA-6 | 164,778,036,194 | 159,525,816,813 |
| | | | |
| **<u>මූල්‍ය වත්කම්</u>** | | | |
| අත්තිකාරම් ගිණුම් | ACA-5/5(a) | 2,698,544,104 | 2,780,082,063 |
| මුදල් හා මුදල් සමාන දෑ | ACA-3 | 12,779,165 | 14,605,292 |
| | | | |
| **මුළු වත්කම්** | | **167,489,359,463** | **162,320,504,168** |
| | | | |
| **<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>** | | | |
| ශුද්ධ වත්කම් | | 1,740,721,329 | 1,928,518,760 |
| දේපළ, පිරියත හා උපකරණ සංචිතය | | 164,778,036,194 | 159,525,816,813 |
| කුලී වැඩ හා අත්තිකාරම් සංචිතය | ACA-5(b) | | - |
| | | | |
| **<u>ජංගම වගකීම්</u>** | | | |
| තැන්පතු ගිණුම් | ACA-4 | 957,822,775 | 851,563,303 |
| අග්‍රිම ශේෂය | ACA-3 | 12,779,165 | 14,605,292 |
| **මුළු වගකීම්** | | **167,489,359,463** | **162,320,504,168** |

පිටු අංක 001 සිට 150 දක්වා දැක්වෙන ඉහත AC1 සිට AC6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 152 සිට 178 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහි ම අන්තර් ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශයන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදු කර ඇති අතර මෙහි දී මූල්‍ය ප්‍රකාශයන් හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත.ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

..........................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම :
තනතුර :
දිනය : 2021.02.

මහාචාර්ය කේ. කපිල සී.කේ. පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය"
පැලවත්ත,
බත්තරමුල්ල

..........................
ගණන්දීමේ නිලධාරී
නම :
තනතුර :
දිනය : 2021.02.

..........................
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 2021.02.

ජී.එම්.ඩී. හිරන්ති එස්. ගමිලත්
ප්‍රධාන ගණකාධිකාරී
(මූල්‍ය කළමනාකරණ)
අධ්‍යාපන අමාත්‍යාංශය
"ඉසුරුපාය" බත්තරමුල්ල.

002

## 3.4 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

**2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන**
**මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | තත්‍ය | |
|---|---|---|
| | 2020 වර්ෂය<br>රු. | 2019 වර්ෂය<br>රු. |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම්* | 2,655,447,247 | 8,136,915,814 |
| වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 13,664,823,973 | - |
| අග්‍රිමය ලැබීම් | 71,256,548,034 | 65,644,855,470 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (අ)** | **87,576,819,254** | **73,781,771,284** |
| | | |
| අඩුකලා - මුදල් වැය කිරීම් | | |
| පුද්ගල පඩි නඩි හා මෙහෙයුම් වියදම් | 38,073,031,496 | 36,044,077,200 |
| සහනාධාර හා මාරු කිරීම් වියදම් | 3,756,095,808 | 19,969,784,130 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරණ ලද වියදම් | 30,017,888,392 | 233,441,703 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිමය | 12,779,165 | 14,605,292 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ආ)** | **71,859,794,862** | **56,261,908,325** |
| | | |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)** | **15,717,024,392** | **17,519,862,959** |
| | | |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන් | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපකරණ අය කර ගැනීම | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම | 953,437,647 | 1,251,703,013 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඈ)** | 953,437,647 | 1,251,703,013 |
| | | |
| අඩුකලා - මුදල් වැය කිරීම්: | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් | 15,739,052,248 | 17,400,256,559 |
| ආයෝජන අත්පත් කර ගැනීම් | 871,899,687 | 1,202,633,358 |
| අත්තිකාරම් ගෙවීම් | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | 16,610,951,935 | 18,602,889,917 |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)** | (15,657,514,288) | (17,351,186,904) |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ)+(ඊ)** | 59,510,104 | 168,676,055 |

| | තත්‍ය | |
|---|---|---|
| | 2020 වර්ෂය<br>රු. | 2019 වර්ෂය<br>රු. |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | 1,990,656,506 | 706,313,135 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **1,990,656,506** | **706,313,135** |
| | | |
| **අඩුකලා - මුදල් වැය කිරීම්:** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු ගෙවීම් | 2,050,166,611 | 874,989,190 |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | **2,050,166,611** | 874,989,190 |
| | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **(59,510,104)** | **(168,676,055)** |
| | | |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ)=(උ)-(ඒ) | - | - |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | - | - |
| | | |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | - | - |

## 3.5 මූල්‍ය ප්‍රකාශ සටහන්

**වාර්තා කිරීමේ පදනම්**

**1. වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2020 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

**2. මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

**3. ආදායම් හඳුනා ගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේ දී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

**4. දේපළ, පිරියත හා උපකරණ හඳුනා ගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනා ගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

**5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

**6. මුදල් හා මුදල් සමාන දෑ**

2020 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

## 3.6 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු. ,000

| ආදායම් කේතය | ආදායම් කේතයේ විස්තරය | ආදායම් ඇස්තමේන්තුව | | එකතු කරන ලද ආදායම | |
|---|---|---|---|---|---|
| | | මුල් ඇස්තමේන්තුව | අවසන් ඇස්තමේන්තුව | ප්‍රමාණය (රු) | අවසාන ආදායම් ඇස්තමේන්තුව% ලෙස |
| අදාළ නොවේ | | | | | |

## 3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

| ප්‍රතිපාදන වර්ගය | වෙන් කරන ලද ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදනයේ % ලෙස |
|---|---|---|---|---|
| | මුල් ප්‍රතිපාදන | අවසන් ප්‍රතිපාදන | | |
| පුනරාවර්තන | 43,204,880 | 43,204,880 | 41,829,127 | 97% |
| මූලධන | 15,681,595 | 16,891,595 | 15,739,052 | 93% |

## 3.8 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන (පුනරාවර්තන)

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | | | | | | ප්‍රතිපාදනයේ අරමුණු | ප්‍රතිපාදන | | තත්‍ය වියදම රු. ,000 | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | මුල් ප්‍රතිපාදන රු. ,000 | අවසන් ප්‍රතිපාදන රු. ,000 | | |
| | **20 -** මැතිවරණ කොමිසම | | | | | | මැතිවරණ රාජකාරී සඳහා | 9,946 | 9,946 | 9,946 | **100.00** |
| 1 | **20** | 1 | 1 | 0 | 1409 | (11) | වෙනත් | 6,480 | 6,480 | 6,480 | **100.00** |
| 2 | **20** | 1 | 1 | 4 | 1409 | (11) | වෙනත් | 3,466 | 3,466 | 3,466 | **100.00** |
| | **104 -** මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය | | | | | | අධ්‍යාපන අමාත්‍යාංශයට අනුයුක්ත උපාධිධාරි අභ්‍යාසලාභීන්ගේ දීමනා ගෙවීම සඳහා | 106,920 | 106,920 | 70,415 | **65.86** |
| 2 | 104 | 1 | 2 | 0 | 1003 | (11) | වෙනත් දීමනා | 106,920 | 106,920 | 70,415 | 65.86 |
| | **130 -** රාජ්‍ය සේවා , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | | | | | | අධ්‍යාපන අමාත්‍යාංශයට හා උසස් අධ්‍යාපන අංශයට අනුයුක්ත උපාධිධාරි අභ්‍යාසලාභීන්ගේ දීමනා ගෙවීම සඳහා | 48,860 | 48,860 | 45,125 | **92.36** |
| 3 | 130 | 1 | 14 | 0 | 1003 | (11) | වෙනත් දීමනා | 48,860 | 48,860 | 45,125 | 92.36 |
| | **155 -** රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු , පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | | | | | | **72** ජාතික නිදහස් උත්සවයේ ජාතික ගීය හා ජයමංගල ගීත ගායනයට සහභාගිවූ පාසල් සිසු සිසුවියන්ගේ හා ගුරු මණ්ඩලයේ වියදම් වෙනුවෙන් | 734 | 734 | 182 | **24.86** |
| 4 | 155 | 1 | 6 | 0 | 1409 | (11) | වෙනත් | 734 | 734 | 182 | 24.86 |
| | 212 - විභාග දෙපාර්තමේන්තුව | | | | | | විභාග රාජකාරි සඳහා | 79,651 | 79,651 | 79,651 | 100.00 |
| 5 | 212 | 2 | 1 | 1 | 1409 | (11) | වෙනත් | 79,651 | 79,651 | 79,651 | 100.00 |
| | **213 -** අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | | | | | | අධ්‍යාපන අමාත්‍යාංශ පරිශ්‍රය තුළ පිහිටි අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට අයත් කොටසේ විදුලි බිලිපත් පියවීමට | 2,600 | 2,600 | 2,000 | **76.92** |
| 6 | 213 | 1 | 2 | 0 | 1403 | (11) | විදුලිය හා ජලය | 2,600 | 2,600 | 2,000 | 76.92 |
| | 253 - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | | | | | | විශ්‍රාම වැටුප් පාරිතෝශිතයෙන් රජයට අයවිය යුතු ගෙවීම් සඳහා | 41,988 | 41,988 | 41,988 | 100.00 |
| 7 | 253 | 1 | 2 | 4 | 1502 | (11) | විදුලිය හා ජලය | 41,988 | 41,988 | 41,988 | 100.00 |
| | **403 -** කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය | | | | | | පාසල් ළමුන් වෙනුවෙන් ක්‍රියාත්මකවන සුභසාධන වැඩසටහන් සඳහා ප්‍රතිපාදන සැපයීම. | **14,509,250** | **14,509,250** | **10,441,849** | **71.97** |
| 8 | 403 | 1 | 5 | 1 | 1501 | (11) | පාසල් පෝෂණ වැඩසටහන | 3,250,000 | 3,250,000 | 2,224,734 | 68.45 |
| 9 | | | | | | (13) | පෝෂණ මල්ල | 74,500 | 74,500 | 74,500 | 100.00 |
| 10 | 403 | 1 | 5 | 2 | 1501 | (11) | පාසල් නිල ඇඳුම් සැපයීම | 3,200,000 | 3,200,000 | 2,876,714 | 89.90 |
| 11 | 403 | 1 | 5 | 3 | 1501 | (11) | පාසල් සිසුන් සඳහා පාවහන් සැපයීම | 500,000 | 500,000 | 491,711 | 98.34 |
| 12 | 403 | 1 | 5 | 4 | 1501 | (11) | නොමිලේ පෙළ පොත් සැපයීම | 4,550,000 | 4,550,000 | 2,044,695 | 44.94 |
| 13 | 403 | 1 | 5 | 5 | 1501 | (11) | කිරි වීදුරුවක් ලබා දීම | 400,000 | 400,000 | 297,180 | 74.29 |
| 14 | 403 | 1 | 5 | 6 | 1501 | (11) | 5 වසර ශිෂ්‍යාධාර | 937,500 | 937,500 | 871,621 | 92.97 |
| 15 | 403 | 1 | 5 | 7 | 1501 | (11) | "සුභග" ශිෂ්‍යාධාර වැඩසටහන | 50,000 | 50,000 | 28,999 | 58.00 |
| 16 | 403 | 1 | 5 | 8 | 1501 | (11) | සුරක්ෂා සිසු රක්ෂණ වැඩසටහන | 1,500,000 | 1,500,000 | 1,499,995 | 100.00 |
| 17 | 403 | 1 | 5 | 9 | 1501 | (11) | ' සුජාත දියණි" ශිෂ්‍යාධාර වැඩසටහන | 3,750 | 3,750 | 3,525 | 94.00 |

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | | | | | | ප්‍රතිපාදනයේ අරමුණු | ප්‍රතිපාදන | | තථ්‍ය වියදම රු. ,000 | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | මුල් ප්‍රතිපාදන රු. ,000 | අවසන් ප්‍රතිපාදන රු. ,000 | | |
| 18 | 403 | 1 | 5 | 10 | 1501 | (11) | "තාක්ෂණවේදය" ශිෂ්‍යාධාර වැඩසටහන | 10,500 | 10,500 | 8,985 | 85.57 |
| 19 | 403 | 1 | 5 | 11 | 1501 | (11) | ක්‍රීඩා පාසල් ශිෂ්‍යත්වධාරින් සඳහා පෝෂණ ආහාර | 33,000 | 33,000 | 19,190 | 58.15 |
| | **404** - අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්ව විද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | | | | | | **අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්ව විද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ පුනරාවර්තන වියදම් සඳහා** | 517,554 | 517,554 | 339,864 | 65.67 |
| 20 | 404 | 1 | 1 | 0 | 1001 | (11) | වැටුප් හා වේතන | 3,000 | 3,000 | 3,000 | 100.00 |
| 21 | 404 | 1 | 1 | 0 | 1002 | (11) | අතිකාල හා නිවාඩුදින වැටුප් | 1,050 | 1,050 | 733 | 69.80 |
| 22 | 404 | 1 | 1 | 0 | 1003 | (11) | වෙනත් දීමනා | 1,500 | 1,500 | 1,135 | 75.68 |
| 23 | 404 | 1 | 1 | 0 | 1101 | (11) | දේශීය ගමන් වියදම් | 950 | 950 | 808 | 85.09 |
| 24 | 404 | 1 | 1 | 0 | 1201 | (11) | ලිපි ද්‍රව්‍ය | 150 | 150 | 138 | 92.18 |
| 25 | 404 | 1 | 1 | 0 | 1202 | (11) | ඉන්ධන | 1,800 | 1,800 | 1,575 | 87.51 |
| 26 | 404 | 1 | 1 | 0 | 1301 | (11) | වාහන | 750 | 750 | 343 | 45.74 |
| 27 | 404 | 1 | 1 | 0 | 1302 | (11) | යන්ත්‍ර අළුත්වැඩියා | 50 | 50 | 0 | - |
| 28 | 404 | 1 | 1 | 0 | 1402 | (11) | තැපැල් හා සන්නිවේදන | 150 | 150 | 84 | 55.84 |
| 29 | 404 | 1 | 1 | 0 | 1403 | (11) | විදුලිය හා ජලය | 200 | 200 | 0 | - |
| 30 | 404 | 1 | 1 | 0 | 1409 | (11) | වෙනත් | 300 | 300 | 26 | 8.58 |
| 31 | 404 | 1 | 2 | 0 | 1001 | (11) | වැටුප් හා වේතන | 4,954 | 4,954 | 1,868 | 37.71 |
| 32 | 404 | 1 | 2 | 0 | 1002 | (11) | අතිකාල හා නිවාඩුදින වැටුප් | 700 | 700 | 684 | 97.78 |
| 33 | 404 | 1 | 2 | 0 | 1003 | (11) | වෙනත් දීමනා | 3,500 | 3,500 | 613 | 17.50 |
| 34 | 404 | 1 | 2 | 0 | 1101 | (11) | දේශීය ගමන් වියදම් | 75 | 75 | 75 | 100.00 |
| 35 | 404 | 1 | 2 | 0 | 1201 | (11) | ලිපි ද්‍රව්‍ය | 175 | 175 | 141 | 80.65 |
| 36 | 404 | 1 | 2 | 0 | 1202 | (11) | ඉන්ධන | 500 | 500 | 389 | 77.90 |
| 37 | 404 | 1 | 2 | 0 | 1301 | (11) | වාහන | 500 | 500 | 0 | - |
| 38 | 404 | 1 | 2 | 0 | 1302 | (11) | යන්ත්‍ර අළුත්වැඩියා | 100 | 100 | 0 | - |
| 39 | 404 | 1 | 2 | 0 | 1401 | (11) | ප්‍රවාහන | 200 | 200 | 0 | - |
| 40 | 404 | 1 | 2 | 0 | 1402 | (11) | තැපැල් හා සන්නිවේදන | 150 | 150 | 102 | 68.33 |
| 41 | 404 | 1 | 2 | 0 | 1403 | (11) | විදුලිය හා ජලය | 500 | 500 | 0 | - |
| 42 | 404 | 1 | 2 | 0 | 1409 | (11) | වෙනත් | 200 | 200 | 144 | 72.16 |
| 43 | 404 | 1 | 2 | 0 | 1506 | (11) | රාජ්‍ය සේවක දේපළ ණය පොලී | 100 | 100 | 4 | 3.63 |
| 44 | 404 | 1 | 2 | 0 | 1503 | (11) | | 496,000 | 496,000 | 328,000 | 66.13 |
| | **422** - දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය | | | | | | **දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශයේ පුනරාවර්තන වියදම් හා පිරිවෙන් ගුරු වැටුප්/දේපළ ණය පොළී/ පිරිවෙන් ශිෂ්‍ය දීමනා සඳහා** | **4,392,295** | **4,392,295** | **4,357,588** | **99.21** |
| 45 | 422 | 1 | 1 | 0 | 1001 | (11) | වැටුප් හා වේතන | 7,600 | 7,600 | 3,159 | 41.56 |
| 46 | 422 | 1 | 1 | 0 | 1002 | (11) | අතිකාල හා නිවාඩුදින වැටුප් | 2,350 | 2,350 | 1,458 | 62.02 |
| 47 | 422 | 1 | 1 | 0 | 1003 | (11) | වෙනත් දීමනා | 2,845 | 2,845 | 673 | 23.67 |
| 48 | 422 | 1 | 1 | 0 | 1101 | (11) | දේශීය ගමන් වියදම් | 1,280 | 1,280 | 845 | 66.04 |
| 49 | 422 | 1 | 1 | 0 | 1201 | (11) | ලිපි ද්‍රව්‍ය | 550 | 550 | 142 | 25.90 |
| 50 | 422 | 1 | 1 | 0 | 1202 | (11) | ඉන්ධන | 4,000 | 4,000 | 1,161 | 29.04 |

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | | | | | | ප්‍රතිපාදනයේ අරමුණු | ප්‍රතිපාදන | | තත්‍ය වියදම රු. ,000 | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | මුල් ප්‍රතිපාදන රු. ,000 | අවසන් ප්‍රතිපාදන රු. ,000 | | |
| 51 | 422 | 1 | 1 | 0 | 1301 | (11) | වාහන | 3,000 | 3,000 | 211 | 7.03 |
| 52 | 422 | 1 | 1 | 0 | 1302 | (11) | යන්ත්‍ර අළුත්වැඩියා | 120 | 120 | 89 | 73.80 |
| 53 | 422 | 1 | 1 | 0 | 1409 | (11) | වෙනත් | 350 | 350 | 236 | 67.52 |
| 54 | 422 | 1 | 2 | 0 | 1001 | (11) | වැටුප් හා වේතන | 6,800 | 6,800 | 6,708 | 98.65 |
| 55 | 422 | 1 | 2 | 0 | 1002 | (11) | අතිකාල හා නිවාඩුදින වැටුප් | 1,050 | 1,050 | 617 | 58.73 |
| 56 | 422 | 1 | 2 | 0 | 1003 | (11) | වෙනත් දීමනා | 3,500 | 3,500 | 2,437 | 69.62 |
| 57 | 422 | 1 | 2 | 0 | 1101 | (11) | දේශීය ගමන් වියදම් | 500 | 500 | 499 | 99.71 |
| 58 | 422 | 1 | 2 | 0 | 1202 | (11) | ඉන්ධන | 1,000 | 1,000 | 394 | 39.41 |
| 59 | 422 | 1 | 2 | 0 | 1205 | (11) | වෙනත් | 200 | 200 | 157 | 78.37 |
| 60 | 422 | 1 | 2 | 0 | 1301 | (11) | වාහන | 300 | 300 | 293 | 97.65 |
| 61 | 422 | 1 | 2 | 0 | 1302 | (11) | යන්ත්‍ර අළුත්වැඩියා | 150 | 150 | 107 | 71.00 |
| 62 | 422 | 1 | 2 | 0 | 1303 | (11) | ගොඩනැගිලි අළුත්වැඩියා | 500 | 500 | 0 | - |
| 63 | 422 | 1 | 2 | 0 | 1401 | (11) | ප්‍රවාහන | 200 | 200 | 0 | - |
| 64 | 422 | 1 | 2 | 0 | 1402 | (11) | තැපැල් හා සන්නිවේදන | 300 | 300 | 247 | 82.22 |
| 65 | 422 | 1 | 2 | 0 | 1403 | (11) | විදුලිය හා ජලය | 300 | 300 | 0 | - |
| 66 | 422 | 1 | 2 | 0 | 1409 | (11) | වෙනත් | 300 | 300 | 187 | 62.40 |
| 67 | 422 | 1 | 2 | 0 | 1506 | (11) | රාජ්‍ය සේවක දේපළ ණය පොලී | 100 | 100 | 78 | 78.41 |
| 68 | 422 | 1 | 3 | 3 | 1001 | (11) | වැටුප් හා වේතන (පිරිවෙන්) | 3,140,000 | 3,140,000 | 3,139,750 | 99.99 |
| 69 | 422 | 1 | 3 | 3 | 1003 | (11) | වෙනත් දීමනා (පිරිවෙන්) | 968,000 | 968,000 | 959,695 | 99.14 |
| 70 | 422 | 1 | 3 | 3 | 1506 | (11) | රාජ්‍ය සේවක දේපළ ණය පොලී (පිරිවෙන්) | 4,730 | 4,730 | 4,729 | 99.98 |
| 71 | 422 | 1 | 3 | 3 | 1508 | (11) | වෙනත් (පිරිවෙන්) | 242,270 | 242,270 | 233,716 | 96.47 |
| මුළු එකතුව | | | | | | | | 19,709,797 | 19,709,797 | 15,388,608 | 78.08 |

## 3.8 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට / දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට / පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන (ප්‍රාග්ධන)

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | | | | | | ප්‍රතිපාදනයේ අරමුණු | ප්‍රතිපාදන | | තථ්‍ය වියදම රු. ,000 | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | මුල් ප්‍රතිපාදන රු. ,000 | අවසන් ප්‍රතිපාදන රු. ,000 | | |
| | **403-** කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශය | | | | | | | | | | |
| 1 | 403 | 2 | 6 | 1 | 2001 | (11) | **ප්‍රාථමික අධ්‍යාපනය යටතේ පාසල් පහසුකම් වැඩිදියුණු කිරීම.** | 26,000 | 26,000 | 25,234 | **97** |
| 2 | 403 | 2 | 6 | 1 | 2102 | (11) | | 5,000 | 5,000 | 5,000 | **100** |
| 3 | 403 | 2 | 6 | 1 | 2104 | (11) | | 102,140 | 102,140 | 94,064 | **92** |
| 4 | 403 | 2 | 6 | 2 | 2001 | (11) | **ප්‍රාථමික අධ්‍යාපනය යටතේ පාසල් පහසුකම් වැඩිදියුණු කිරීම.** | 230,000 | 230,000 | 198,220 | 86 |
| 5 | 403 | 2 | 6 | 2 | 2102 | (11) | | 20,000 | 20,000 | 12,579 | 63 |
| 6 | 403 | 2 | 6 | 2 | 2104 | (11) | | 467,830 | 467,830 | 442,453 | 95 |
| 7 | 403 | 2 | 6 | 3 | 2104 | (11) | ආරක්ෂක සේවා පාසල් ඉදිකිරීම | 11,931 | 11,931 | 11,931 | 100 |
| 8 | 403 | 2 | 6 | 4 | 2506 | (11) | ජල හා සනීපාරක්ෂක පහසුකම් නඩත්තු කිරීම | 92,410 | 92,410 | 80,349 | 87 |
| 9 | 403 | 2 | 6 | 5 | 2001 | (11) | එක් එක් දිස්ත්‍රික්කයන්හි ක්‍රීඩා පාසල් සංවර්ධනය කිරීම | 78,470 | 78,470 | 78,470 | 100 |
| 10 | 403 | 2 | 6 | 6 | 2102 | (11) | උසස් පෙළ සිසුන් හා ගුරුවරුන් සඳහා ටැබ් පරිගනක ලබාදීම | 3,500,000 | 3,500,000 | 3,444,470 | 98 |
| 11 | 403 | 2 | 6 | 7 | 2104 | (11) | නානුඔය - නව ත්‍රෛභාෂා පාසලක් ඉදිකිරීම | 100 | 100 | 63 | 63 |
| 12 | 403 | 2 | 7 | 1 | 2506 | (11) | පාසල් වලට විදුලි පහසුකම් සැලසීම | 100,000 | 100,000 | 97,908 | 98 |
| 13 | 403 | 2 | 7 | 2 | 2001 | (11) | ද්විතීක මට්ටමේ වතුපාසල් නගාසිටුවීම | 67,000 | 67,000 | 67,000 | 100 |
| 14 | 403 | 2 | 7 | 2 | 2104 | (11) | | 135,000 | 135,000 | 135,000 | 100 |
| 15 | 403 | 2 | 7 | 3 | 2001 | (11) | පාසල් වලට දන්ත සෞඛ්‍ය පහසුකම් සැලසීම | 26,000 | 26,000 | 21,046 | 81 |
| 16 | 403 | 2 | 7 | 3 | 2104 | (11) | | 30,000 | 30,000 | 29,168 | 97 |
| 17 | 403 | 2 | 7 | 4 | 2104 | (11) | සියලුම පාසල් වලට ජල හා සනීපාරක්ෂක පහසුකම් සැලසීම | 263,000 | 263,000 | 260,367 | 99 |
| 18 | 403 | 2 | 7 | 4 | 2506 | (11) | | 170,000 | 170,000 | 167,626 | 99 |
| 19 | 403 | 2 | 7 | 5 | 2001 | (11) | සියලුම පාසල් වලට ජල හා සනීපාරක්ෂක පහසුකම් සැලසීම | 87,000 | 87,000 | 79,478 | 91 |
| 20 | 403 | 2 | 7 | 5 | 2102 | (11) | | 25,000 | 25,000 | 6,534 | 26 |
| 21 | 403 | 2 | 7 | 5 | 2104 | (11) | | 820,000 | 820,000 | 803,986 | 98 |
| 22 | 403 | 2 | 7 | 7 | 2104 | (11) | ග්‍රාමීය හා ප්‍රාදේශීය පාසල්වල ගුරු නිවාස සහ ගුරු නේවාසිකාගාර පහසුකම් සැලසීම | 108,000 | 108,000 | 108,000 | 100 |
| 23 | 403 | 2 | 7 | 8 | 2001 | (11) | ද්විතියික පාසල් 1000 ක පහසුකම් නගාසිටුවීම | 909,200 | 909,200 | 871,729 | 96 |
| 24 | 403 | 2 | 7 | 8 | 2102 | (11) | | 70,000 | 70,000 | 25,840 | **37** |
| 25 | 403 | 2 | 7 | 8 | 2104 | (11) | | 2,860,000 | 2,860,000 | 2,795,830 | 98 |
| 26 | 403 | 2 | 7 | 9 | 2001 | (11) | කිසිම ව්‍යාපෘතියකට ඇතුලත් නොවූ පාසල් 1360 ක පහසුකම් වැඩිදියුණු කිරීම | 321,000 | 321,000 | 299,405 | 93 |
| 27 | 403 | 2 | 7 | 9 | 2102 | (11) | | 100,000 | 100,000 | 62,705 | 63 |
| 28 | 403 | 2 | 7 | 9 | 2104 | (11) | | 2,482,000 | 2,482,000 | 2,478,972 | 100 |
| 29 | 403 | 2 | 7 | 9 | 2509 | (11) | | 296,000 | 296,000 | 252,563 | 85 |

| අනු අංකය | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව | | | | | | ප්‍රතිපාදනයේ අරමුණු | ප්‍රතිපාදන | | තථ්‍ය වියදම රු. ,000 | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | මුල් ප්‍රතිපාදන රු. ,000 | අවසන් ප්‍රතිපාදන රු. ,000 | | |
| | **404** - අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්ව විද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය | | | | | | | | | | |
| 30 | 404 | 1 | 1 | 0 | 2003 | (11) | | 800 | 800 | 588 | 73 |
| 31 | 404 | 1 | 1 | 0 | 2102 | (11) | | 700 | 700 | 602 | **86** |
| 32 | 404 | 1 | 1 | 0 | 2103 | (11) | | 500 | 500 | 494 | **99** |
| 33 | 404 | 1 | 2 | 0 | 2003 | (11) | | 800 | 800 | 11 | 1 |
| 34 | 404 | 1 | 2 | 1 | 2201 | (11) | | 115,000 | 115,000 | 35,000 | 30 |
| 35 | 404 | 1 | 2 | 1 | 2509 | (12) | | 120,000 | 120,000 | 120,000 | 100 |
| 36 | 404 | 1 | 2 | 0 | 2102 | (11) | අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වැඩසටහන සඳහා | 700 | 700 | 571 | 82 |
| 37 | 404 | 1 | 2 | 0 | 2103 | (11) | | 500 | 345 | 438 | 127 |
| 38 | 404 | 1 | 2 | 2 | 2001 | (11) | | 290,000 | 290,000 | 272,697 | 94 |
| 39 | 404 | 1 | 2 | 2 | 2102 | (11) | | 305,000 | 305,000 | 303,391 | 99 |
| 40 | 404 | 1 | 2 | 2 | 2103 | (11) | | 80 | 80 | 80 | 100 |
| 41 | 404 | 1 | 2 | 2 | 2104 | (11) | | 410,000 | 410,000 | 408,512 | 100 |
| 42 | 404 | 1 | 2 | 2 | 2401 | (11) | | 23,250 | 23,250 | 20,143 | 87 |
| 43 | 404 | 1 | 2 | 2 | 2509 | (11) | | 458,300 | 458,300 | 310,795 | 68 |
| | **422** - දහම් පාසල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය | | | | | | | | | | |
| 44 | 422 | 1 | 1 | 0 | 2003 | (11) | | 1,430 | 1,430 | 673 | 47 |
| 45 | 422 | 1 | 1 | 0 | 2103 | (11) | | 1,570 | 1,570 | 1,326 | 84 |
| 46 | 422 | 1 | 2 | 0 | 2003 | (11) | | 1,000 | 1,000 | 559 | 56 |
| 47 | 422 | 1 | 2 | 0 | 2102 | (11) | පිරිවෙන් අධ්‍යාපනය නඟා සිටුවීම | 1,000 | 1,000 | 997 | 100 |
| 48 | 422 | 1 | 2 | 0 | 2103 | (11) | | 1,000 | 1,000 | 997 | 100 |
| 49 | 422 | 2 | 3 | 3 | 2102 | (11) | | 17,500 | 17,500 | 17,323 | 99 |
| 50 | 422 | 2 | 3 | 3 | 2104 | (11) | | 138,000 | 138,000 | 137,615 | 100 |
| 51 | 422 | 2 | 3 | 3 | 2401 | (11) | | 1,000 | 1,000 | 380 | 38 |
| | 104 - මුදල් හා ආර් ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය | | | | | | | | | | |
| 52 | 104 | 2 | 6 | 4 | 2202 | (13) | ලෝක ආහාර වැඩ සටහන යටතේ තණමල්විල කලාපයේ පාසල්වල අත්සේදීමේ පහසුකම් සැලසීම | 12,250 | 12,250 | 12,250 | 100 |
| | මුදල් අමාත්‍යාංශය | | | | | | | | | | |
| 53 | 102 | 2 | 7 | 4 | 2202 | (13) | ලෝක ආහාර වැඩ සටහන යටතේ තණමල්විල කලාපයේ පාසල්වල අත්සේදීමේ පහසුකම් සැලසීම | 12,250 | 12,250 | 12,306 | 98 |
| | බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | | | | | | | | | | |
| 54 | 101 | 1 | 3 | 2 | 2001 | (11) | | 4,413 | 4,413 | 4,413 | 100 |
| 55 | 101 | 1 | 3 | 2 | 2102 | (11) | | 9,429 | 9,429 | 9,429 | 100 |
| 56 | 101 | 1 | 3 | 2 | 2104 | (11) | | 1,699 | 1,699 | 1,699 | 100 |
| | | | | | | | එකතුව | **15,331,502** | **15,331,347** | **14,629,279** | **95** |

**3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය**

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය රු. ,000 | 31.12.2020 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය රු. ,000 | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත රු. ,000 | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 45,418,382 | 45,761,924 | - | - |
| 9152 | යන්ත්‍රෝපකරණ | 8,742,305 | 9,375,043 | - | - |
| 9153 | ඉඩම් | 102,661,780 | 104,254,579 | - | - |
| 9154 | අස්පෘශ්‍ය වත්කම් | - | 1,580 | - | - |
| 9155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 9160 | කෙරීගෙන යන වැඩ | 2,703,350 | 5,384,908 | - | - |
| 9180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

| වත්කම් කේතය | කේත විස්තරය | 31.12.2020 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය රු. ,000 | 31.12.2020 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය රු. ,000 | ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත රු. ,000 | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 5151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | 45,761,924 | 45,761,924 | - | - |
| 5152 | යන්ත්‍රෝපකරණ | 9,375,043 | 9,375,043 | - | - |
| 5153 | ඉඩම් | 104,254,579 | 104,254,579 | - | - |
| 5154 | අස්පෘශ්‍ය වත්කම් | 1,580 | 1,580 | - | - |
| 5155 | ජීව විද්‍යාත්මක වත්කම් | - | - | - | - |
| 5160 | කෙරීගෙන යන වැඩ | 5,384,908 | 5,384,908 | - | - |
| 5180 | බදු දෙන ලද වත්කම් | - | - | - | - |

## 3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } EDU/A/MOE/20/SR/25   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2021 ජුනි 30 දින

ලේකම්

අධ්‍යාපන අමාත්‍යාංශය

අධ්‍යාපන අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

අධ්‍යාපන අමාත්‍යාංශයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී. ලං. වි. ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තව දුරටත් විස්තර කර ඇත.මාගේ මතය සඳහා පදනමක් සැපැයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| 2.4 (ii) | 2015 අගෝස්තු 21 දිනැති අංක 1928/28 අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාවට අනුව ලැයිස්තුගත ජාතික පාසැල් 64 ක් සඳහා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් විදුහල්පතිවරුන් වශයෙන් පත්කළ යුතුව තිබුණු නමුත් එම පත්කිරීම් සිදුකර නොතිබුණි. | ලැයිස්තුගත ජාතික පාසල් 64 සඳහා විදුහල්පතිවරුන් වශයෙන් ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් පත්කිරීමට කටයුතු කළයුතුව ඇත. |
| 2.4 (v) | 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට අනුව කාර්ය මණ්ඩලය යෙදවීමට සැලැසුම් ,මානව සම්පත් සංවර්ධන සැලැසුම් හා සුදුසු ධාරිතා සංවර්ධන වැඩසටහන්,ඒ සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණි. | අදාළ චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කරමින් ක්‍රියාකාරි සැලැස්ම ඵලදායි ලෙස ආයතනයේ ඉලක්ක සපුරා ගැනීම සඳහා ක්‍රියාත්මක කිරීමටත් ඒ සඳහා අවශ්‍ය මානව සම්පත් හඳුනාගැනීමට හා ඔවුන්ගේ ධාරිතාවන් සංවර්ධනය කිරීමටත් කටයුතු කළයුතුව ඇත . |
| 2.4 (vi) | 2008 පෙබරවාරි 06 දිනැති අංක 05/2008 දරණ පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වාදීමේ රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ සඳහන් මාර්ගෝපදේශ අනුව මහජන සේවා අවශ්‍යතා සහ ආයතනය සතු ධාරිතාවය සැලකිල්ලට ගනිමින් සේවා ප්‍රමිතීන් නියම කිරීම, මහජනතාවට නිවැරදි කරුණු හා තොරතුරු විවෘතව සැපයීමට සහතික වීම, ආචාරශීලිව, මිත්‍රශීලිව හා සාධාරණව සැලකීම, විශ්වාසනීය ප්‍රතිචාර දැක්වීම, යන මූලධර්ම සපුරා ගැනීම ප්‍රමාණවත් අයුරින් සිදුකර නොතිබුණි. | මහජන අවශ්‍යතා කඩිනමින් ඉටුකිරීම තුලින් මහජනතාව අමාත්‍යාංශය වෙත පැමිණෙන වාර ගණන අවම කිරීමටත් ඔවුන් වෙත නිවැරදි හා සාධාරන විසඳුම් ලබාදීමට කටයුතු කිරීමත් ඔවුන්ට ආචාරශීලි ආකාරයට ප්‍රතිචාර දැක්වීමටත් අවශ්‍ය පරිසරය සැකසිය යුතුය |

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

1.6.1.1 ආදායම් නොවන ලැබීම්

i. භාණ්ඩාගාර අග්‍රිම ලැබීම්

අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂය සඳහා අනුමත අග්‍රිම සීමාව රු.103,695,711,000 ක් වූ අතර මුදලින් ලැබී තිබුණු මුළු අග්‍රිම වටිනාකම රු. 71,256,548,034 ක් වූ බැවින්, අනුමත සීමාවෙන් 33,216,716,161 ක් හෙවත් සියයට 33 ක ප්‍රමාණයක් ලැබී නොතිබුණි.

ii. තැන්පතු ලැබීම්

මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව තැන්පත් කල දින සිට වර්ෂ 2 ඉක්ම වූ තැන්පතු රාජ්‍ය ආදායමට බැරකල යුතු වුවද, වර්ෂ 2 ක් ඉක්ම වූ නමුත්, රාජ්‍ය ආදායමට බැර නොකල තැන්පතු ගිණුම් 6 ක වටිනාකම රු. 392,352,040 ක් වූ අතර, එම වටිනාකම තුල වර්ෂ 5 ක් ඉක්මවූ රු.15,362,919 ක ශේෂයක් ද ඇතුලත් වී තිබුණි.

1.6.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

1.6.2.1 මූල්‍ය නොවන වත්කම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය විසින් 2020 වර්ෂය තුලදී මූල්‍ය නොවන වත්කම් මිලදී ගැනීම් වශයෙන් ACA 6 හි දක්වා තිබු වටිනාකම් හා ACA 2 (i) දක්වා තිබු වටිනාකම් අතර, රු.23,306,870,589 ක වෙනසක් පැවතුණ අතර එම වෙනස්කම් සඳහා හේතු ගිණුමේ සටහන් වල ඇතුලත් කර නොතිබුණි.

(ආ) මූල්‍ය නොවන වත්කම් අයිතමයන් 8 ක ඉකුත් වර්ෂයේ අවසාන ශේෂ සමාලෝචිත වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස ඉදිරියට ගෙන ඒමේදී රු.6,713,956,365 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) අමාත්‍යාංශය සතු වාහන 40 ක් රාජ්‍ය අමාත්‍යාංශය වෙත තාවකාලිකව පවරා දී තිබුණද, රාජ්‍ය අමාත්‍යාංශ වෙත ලබාදීමට යෝජිත අනෙකුත් මූල්‍ය නොවන වත්කම් තවදුරටත් හඳුනා ගනිමින් පැවතීම නිසා එම වත්කම් විගණන දිනය වන විටත් පවරා දී නොතිබුණි.

1.6.2.2 අග්‍රිම ගිණුමේ ශේෂය

2020 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකරන ලද අග්‍රිම ගිණුමෙහි ශේෂයය රු.765,547 ක් විය.

1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව වටිනාකම රු. 265,919 ක් වූ වාහන අනතුරක් හා පුස්තකාල පොත් ඌණතාවයක් හානි පිළිබඳ ලේඛනයට ඇතුලත් කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

වැය විෂයයන් 6 ක් වෙනුවෙන් ලැබී තිබුණු රු.528,175,050 ක් වූ අයවැය ගත ප්‍රාග්ධන ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණු අතර, එහි මූල්‍ය කාර්යසසාධනය ශුන්‍ය මට්ටමක පැවතුණි. එසේම වැය විෂයයන් 07 ක් වෙනුවෙන් ලැබී තිබුණු රු.223,170,000 ක අයවැයගත ප්‍රාග්ධන ප්‍රතිපාදන සියයට 52 සිට සියයට 86 දක්වා පරාසයක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. එහි මූල්‍ය කාර්යසාධනයද ඉතා අවම මට්ටමක පැවතුණි.

2.2 රාජ්‍ය නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) 2020 වර්ෂයේ විසර්ජන පනත මගින් ශීර්ෂ අංක 12601 යටතේ අධ්‍යාපන අමාත්‍යාංශයේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් "බී" ගිණුමට අදාළව උපරිම හර ශේෂ සීමාව රු. 2,540,000,000 ක් ලබාදී තිබුණු අතර, එකී සීමාව 2020 සැප්තැම්බර් මාසය වන විට ඉක්මවා ඇති බැවින්, එම සීමාව රු. 3,100,000,000 දක්වා වෙනස් කිරීමට අධ්‍යාපන අමාත්‍යවරයාගේ අංක ED/5/78/4/23/2020 හා 2020.12.30 දිනැති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා ඇමතු සංදේශය මගින් ඉල්ලා තිබුණි. එකී සංදේශය ප්‍රකාරව ජාතික අයවැය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක BD/AA/LR/01/2021 හා 2020 දෙසැම්බර් 31 දිනැති අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් ඇමතු ලිපිය මගින් යථෝක්ත අනුමත සීමාවන් සංශෝධනය සඳහා වූ නිර්දේශය ලබාදීමට කටයුතු කරන බව සඳහන් කර තිබුණි. නමුත්, මුදල් රෙගුලාසි 503 (2) ප්‍රකාරව මෙම සීමාවන් සංශෝධනය කිරීම පාර්ලිමේන්තුවේ යෝජනා සම්මුතියක් මගින් සම්මත වූ බව තහවුරු කරගැනීමට 2021 අප්‍රේල් 30 දින ලිපියෙන් අමාත්‍යාංශ ලේකම්ගෙන් ඉල්ලුම්කලද, එම තොරතුරු ලබාදී නොතිබුණි. ඒ අනුව

උපරිම හර ශේෂ සීමාව ඉක්මවීම රු. 158,544,103 කින් ඉක්මවා තිබුණි. 2020 අංක 07 දරණ විසර්ජන පනතේ 08 වගන්තිය අනුව අනුමත සීමා ඉක්ම වීම් සඳහා 2021 මැයි 31 දිනට පෙර පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගත යුතු වුවත් 2021 ජුනි 08 දින පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගෙන තිබුණි.

(ආ) අමාත්‍යාංශයේ සිට අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට ස්ථානමාරු වී ගිය නිලධාරීන්ගේ ණය ශේෂයන් මාස 3 ක් ඇතුලත ගිණුම් සාරාංශ මගින් නිරවුල් කිරීමට කටයුතු කලයුතු වුවත්, රජයේ අමාත්‍යාංශ / දෙපාර්තමේන්තුවලට ස්ථානමාරු වී ගිය නිලධාරීන්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට අයවීමට තිබූ මුළු ශේෂය රු. 69,333,807 ක් වූ අතර, ඉන් රු. 44,303,604 ක් වර්ෂ 5 කට වැඩි කාලයක් සිටද, රු. 13,182,009 ක් වර්ෂ 1 ත් 5ත් අතර, කාලයක සිටද අය නොවී පැවතුණි.

(ඇ) වෙනත් අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තුවල සිට අමාත්‍යාංශයට ස්ථානමාරු වී පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂයන් මාස දෙකක් ඇතුලත ගිණුම් සාරාංශ මගින් නිරවුල් කිරීමට කටයුතු කලයුතු වුවත්, 2020 දෙසැම්බර් 31 දිනට වූ ඒකාබද්ධ ගිණුම් සැසඳුම් ප්‍රකාශය අනුව වර්ෂ 5 ට වැඩි ණය ශේෂය රු. 22,606,328 ක් වූ අතර, මාස 3 ත් අවුරුදු 05 ත් අතර ණය ශේෂය රු. 11,182,059 ක් විය.

(ඈ) පළාත් සහා ආයතනවලට ස්ථානමාරු වී ගිය නිලධාරීන්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට අයවීමට තිබූ මුළු ණය ශේෂය රු. 29,444,084 ක් වූ අතර, ඉන් රු.13,062,879 ක් වර්ෂ 5 කට වැඩි කාලයක සිටද, රු. 6,691,444 ක් වර්ෂ 1 ත් වර්ෂ 5 ත් අතර කාලයක සිටද අය නොවී පැවතුණි. මෙම ණය ශේෂ හැකි ඉක්මනින් අදාල ආයතනයෙන් ගෙන්වා ගැනීමට හා එසේ නොවන අවස්ථාවලදී මාසික වාරිකය පොලිය සමඟ ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) පළාත් සභා ආයතනවල සිට අමාත්‍යාංශයට ස්ථානමාරු වී පැමිණි නිලධාරීන්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට ණය ශේෂය ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශය අනුව රු.24,795,792 ක් වූ අතර, ඉන් රු. 3,962,317 ක් වර්ෂ 5 ට වැඩි ණය සහ රු.18,528,340 ක් වර්ෂ 1 ත් 5 ත් අතර ණය ශේෂ විය. පළාත් සභා ආයතනවල සිට ස්ථානමාරු වී පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ වාර්ෂික විසර්ජන පනතේ ලැබී ඇති වියදමේ උපරිම සීමාව තුල පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.සමාලෝචිත වර්ෂයේදී විසර්ජන පනතට අනුව රු.1000,000,000 ක් වූ වියදමේ උපරිම සීමාවෙන් රු. 871,899,687 ක් පමණක් වැය කර තිබුණි.

(ඊ) 2020 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශය අනුව මියගිය නිලධාරීන්ගෙන් ලැබිය යුතු ණය ශේෂය රු. 5,417,115 ක් වූ අතර රු.746,512 ක් වර්ෂ 5 කට වැඩි සහ

රු. 1,961,758 ක් වර්ෂ 1 ත් 5 ත් අතර, ණය ශේෂයන් විය. මෙම ණය ශේෂ මරණ පාරිතෝෂිකයෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

එසේම විශ්‍රාම ගිය නිලධාරීන්ගේ විශ්‍රාම පාරිතෝෂිකයෙන් අයකර නොගත් ණය ශේෂය රු.40,763,608 ක් වූ අතර ඉන් රු.1,622,188 ක් වර්ෂ 5 ට වැඩි සහ රු.14,536,441 ක් වර්ෂ 1 ත් 5 ත් අතර ණය ශේෂයන් විය. 2017 දෙසැම්බර් 29 දිනැති අංක 262/2017 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ ඡේද අංක 4 ප්‍රකාරව විශ්‍රාම / මරණ පාරිතෝෂික ලබාදී ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු කිසිදු ණය ශේෂයක් තම ආයතනවල අත්තිකාරම් "බී" ගිණුමේ ඇතුලත් නොවීමට ආයතන ප්‍රධානීන් වග බලා ගතයුතු වූවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(උ) 2020 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශනයට අනුව වැඩ තහනම් කර ඇති නිලධාරීන්ගේ ණය ශේෂය රු. 3,566,737 ක් වූ අතර රු. 884,484 ක් වර්ෂ 5 ට වැඩි සහ රු.2,472,872 ක් වර්ෂ 1 ත් 5 ත් අතර ශේෂයන් විය. වැඩ තහනමකට ලක්කර ඇති නිලධාරීන්ගේ විනය ක්‍රියාමාර්ග කඩිනමින් අවසන් කර අදාළ නිලධාරීන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) 2020 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශයට අනුව සේවය අතහැර ගොස් ඇති නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු.10,427,935 ක් වූ අතර රු.5,450,050 ක් වර්ෂ 5 ට වැඩි සහ රු.2,576,307 ක් වර්ෂ 1 ත් 5 ත් අතර ශේෂයන් විය. මෙම ණය ශේෂය අදාළ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(එ) 2020 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ ගිණුම් ප්‍රකාශයට අනුව සේවයෙන් මුදාහල / විදේශ ගත / වැටුප් රහිත ආදි ගණයට අයත් නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු.9,046,649 කි. එම ශේෂයෙන් රු.5,383,817 ක් වර්ෂ 5 කට වැඩි හා මාස 3 සිට වර්ෂ 5 දක්වා වූ කාල පරිච්ඡේදයට අදාල ශේෂය රු.3,662,832කි. එම නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂ අයකර ගෙන මුදා හැරීමට කටයුතු කලයුතු වුවත්, එලෙස කටයුතු කර නොතිබුණි.

(ඒ) විගණනයට ඉදිරිපත් කර තිබෙන සැසඳුම් ප්‍රකාශ අනුව කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා පාලන ගිණුමේ අවසාන ශේෂය වර්ෂ ගණනාවක සිට නොසැසඳී පැවතුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට රු.26,487,385 න් නොසැසඳුණි.එම ශේෂය හඳුනා ගෙන නිවරදි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

2.4 බැඳීම් හා බැරකම්
-------------------
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු පුනරාවර්තන හා ප්‍රාග්ධන වැය විෂයයන් සම්බන්ධ බැඳීම් හා බැරකම් ප්‍රකාශයෙහි මුදල් රෙගුලාසි 94 (2) සහ (3) ප්‍රකාරව එළඹෙන ලද බැඳීම් ප්‍රකාශය යටතේ දැක්විය යුතු රු. 887,215,619 ක බැරකම් දක්වා තිබුණි. මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබුණු මුදල් රෙගුලාසි 94 (2) සහ (3) ප්‍රකාරව එළඹෙන ලද බැඳීම් ප්‍රකාශයෙහි මුදල් රෙගුලාසි 94 (2) හා (3) යටතට නොගැනෙන රු.98,828,274 ක බැරකම් දක්වා තිබුණි.

(ආ) 2019 වර්ෂයේ උතුරු පළාතේ පැවැත්වූ අධ්‍යාපන වැඩසටහන් සඳහා ගෙවිය යුතු රු.3,312,524 ක් සමාලෝචිත වර්ෂයේ බැඳීම් හා බැරකම් යටතේ දක්වා නොතිබුණි.

(ඇ) 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 (අ) ඡේදය ප්‍රකාරව පුද්ගලික පඩිනඩි හා දීමනා හැර අනෙකුත් ගෙවීම් සඳහා පමණක් බැඳීම් හා බැරකම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත්, ඊට පටහැනිව පුද්ගලික පඩිනඩි හා දීමනා සම්බන්ධව රු. 133,402,405 ක් වූ බැඳීම්ද, රු. 298,220,510 ක් වූ බැරකම්ද, මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 2 (ඈ) ඡේදය අනුව යම් මුදල් වර්ෂයකට අදාළ සියළුම බැරකම් එම වර්ෂය තුළදී මුදල් ගෙවා නිදහස් කළයුතු අතර, කිසිදු බැරකමක් ඊළඟ වර්ෂය තුළදී නිරවුල් කිරීමේ අරමුණ ඇතිව ඉදිරියට ගෙන නොයා යුතුය.එසේ වුවද, අධ්‍යාපන අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රු.4,623.823,814 ක බැරකම්ද, රු. 4,746,913,047 ක බැඳීම්ද ඇති කරගෙන තිබුණි.

(ඉ) මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් බැරකම් උපලේඛන අනුව 2018 හා 2019 වර්ෂවල නිරවුල් කරන ලද රු. 4,222,967,796 ක බැරකම් සමාලෝචිත වර්ෂයේ බැරකම්වල ඇතුලත් කර තිබුණි.

(ඊ) මෙහෙයුම් වැඩසටහනෙහි බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ වෙනත් පෞද්ගලික අංශය ආයතන සමඟ ඇතිකරගෙන තිබුණු බැඳීම්වල වර්ෂ අවසාන ශේෂය සහ බැරකම් වටිනාකම පිළිවෙලින් රු.145,983 ක් හා රු.25,721,667 ක් වුවද, බැඳීම් ශේෂය රු.605,206 ක් හා බැරකම් වටිනාකම රු. 26,273,783 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමෙන් බැඳීම් ශේෂය රු.459,223 කින් හා බැරකම් ශේෂය රු.552,116 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ද) සංවර්ධන වැඩසටහනෙහි බැඳීම් ශේෂය රු. 6,056,861 කින් ද, බැරකම් වටිනාකම රු. 29,182,335 කින් ද, බැරකම් නිදහස් කිරීම රු. 4,174,343 කින් ද, හා බැරකම් ශේෂය රු. 25,077,933 කින් ද අඩුවෙන් දක්වා තිබුණි.

2.5 ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් සිදුකල යුතු සහතික වීම්

විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් සහතික විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ විගණන කටයුතුවලට අදාළව නිකුත් කරන ලද විගණන විමසුම් 07 ක් සඳහා වාර්තාවේ දින වන විටත් පිළිතුරු ලබාදී නොතිබුණි.

2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීතිරීති රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1986 අංක 30 දරණ අධ්‍යාපනික විද්‍යායතන පනත 3, 4 හා 5 වගන්ති | "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන අධ්‍යාපනික විද්‍යායතන මණ්ඩලයක් විය යුතු අතර, එම මණ්ඩලය වෙත බලතල, කාර්ය හා කර්තව්‍යයන් 18 ක් නියම කර තිබුණි. කෙසේ නමුත්, එවැනි මණ්ඩලයක් 2008 වර්ෂයේ සිට මෙම වාර්තාවේ දින දක්වා ක්‍රියාත්මකව පැවති බවට සාක්ෂි විගණනයේදී නිරීක්ෂණය නොවිය. |
| 7 වන වගන්තිය | මණ්ඩලයේ ප්‍රධාන පරිපාලන නිලධරයා වන ප්‍රධාන කොමසාරිස්වරයා විසින් විද්‍යායතනවල පරිපාලන කටයුතු අධීක්ෂණය කිරීම, මණ්ඩලයේ කාර්ය මණ්ඩලය පාලනය කිරීම සහ බලතල, කාර්ය හා කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීමත් සිදු කළයුතුව තිබුණු නමුත්, පනතේ සඳහන් ආකාරයට අදාල මණ්ඩල පිහිටුවීම මෙන්ම මෙම කටයුතු ක්‍රියාත්මක කිරීමද ප්‍රශස්ථ අයුරින් සිදුවී නොතිබුණි. |
| (ආ) 1961 අංක 8 දරන උපකෘත පාසැල් හා අභ්‍යාස විද්‍යාල (අතිරේක විධිවිධාන) පනතේ 25 වන වගන්තිය | පෞද්ගලික අංශයට වයස අවුරුදු 5 සිට 14 දක්වා සිසුන් වෙත සාමාන්‍ය අධ්‍යාපනය ලබාදීම සඳහා පාසැල් ආරම්භ කළ නොහැකි වුවද ඊට පටහැනිව සමාගම් පනත යටතේ ව්‍යාපාර ලෙස පෞද්ගලික අංශය විසින් පාසැල් ආරම්භකර තිබුණි. |

| | |
|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 104 (3) හා 104 (4) දරන මුදල් රෙගුලාසි | අමාත්‍යාංශයේ සිදුවූ වාහන අනතුරු 39 ක් සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කිරීමට දින 11 සිට දින 310 දක්වාද, වාහන අනතුරු 36 ක් සම්බන්ධයෙන් පරිපූර්ණ වාර්තා ඉදිරිපත් කිරීමට දින 88 සිට දින 3,498 ක් දක්වාද භාණ්ඩ සොරකම් කිරීම හා අලාභ හානි 3 ක් සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා දින 2,675 දක්වාද, පරිපූරණ වාර්තා දින 7,869 දක්වාද ප්‍රමාද කිරීම නිසා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමද ප්‍රමාද වී තිබුණි. |

(ඈ) චක්‍රලේඛ

| | |
|---|---|
| (i) 2009 නොවැම්බර් 17 දිනැති අංක 2009/35 දරණ අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 3වන ඡේදය | රජයේ අනුමත පෞද්ගලික පාසල් විසින් අදාළ චක්‍රලේඛ උපදෙස් හා විධිවිධාන පිළිපදින්නේද යන්න සොයා බැලීම සඳහා විධිමත් හා අඛණ්ඩ නියාමනයක් ක්‍රියාත්මකව නොතිබුණි. |
| (ii) 2016 ජනවාරි 07 දිනැති අංක 01/2016 දරන අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 7.3 ඡේදය | පළාත් පාසැල් සඳහා අවශ්‍ය අධ්‍යයන කාර්ය මණ්ඩලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරගෙන නොතිබීම හේතුවෙන් පළාත් අධ්‍යාපන ගුරු පුරප්පාඩු ලේඛනයට අනුව නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ඒකකවල ගුරු පුරප්පාඩු සංඛ්‍යාව 651 ක් විය . |
| (iii) අධ්‍යාපන ලේකම්ගේ 2020 දෙසැම්බර් 03 දිනැති අංක 37/2020 දරණ චක්‍රලේඛයේ හා උපදෙස් සංග්‍රහයේ 12 වැනි පරිච්ඡේදය | විශේෂ අධ්‍යාපන අවශ්‍යතා හා විශේෂ අවශ්‍යතා සහිත ළමයින් සඳහා අධ්‍යාපන පහසුකම් සැලසීම ඇතුළු සියළුම ළමයින් වෙනුවෙන් අන්තර්කරණ අධ්‍යාපනය ලබාදීම සඳහා විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා ගුරු පත්වීම ලැබූ ගුරුභවතුන් එම ක්ෂේත්‍රයෙහි පූර්ණ කාලීනව සේවයේ යෙදිය යුතු වුවද විශේෂ අධ්‍යාපන ක්ෂේත්‍රය සඳහා ගුරු පත්වීම් ලබා තිබුණු ගුරුවරුන් 207 දෙනෙකු එම ක්ෂේත්‍රයේ ඉගැන්වීම් කටයුතුවල නොයෙදෙන බව නිරීක්ෂණය විය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

(අ) අමාත්‍යාංශ කාර්යභාරය අනුව ලෝක තරඟකාරීත්වයට ආත්ම විශ්වාසයකින් හා සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතුව ප්‍රවේශ වීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කල යුතුය. ඒ සඳහා 1991 අප්‍රේල් 19 දිනැති 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතේ විධිවිධාන අනුව ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තීන් සකස් කිරීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් 1992, 2003 සහ 2016 වර්ෂවලදී නිර්දේශ ඉදිරිපත් කර තිබුණු නමුත් 2020 වර්ෂය අවසාන වන විටද ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි.

(ආ) 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ III වන පරිශිෂ්ඨයේ අධ්‍යාපනයට අදාලව 2 වන ව්‍යවස්ථාව අනුව පෙර පාසල් අධීක්ෂණය හා කළමනාකරණය කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශය පවරා තිබූ අතර, අධ්‍යාපන අමාත්‍යාංශයේ ප්‍රධාන කාර්යයක් වශයෙන් හඳුනාගෙන තිබුණ පෙර පාසල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම සිදු කර නොතිබුණි.

#### 3.1.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උසස් පෙළ) පන්තිවල තාක්ෂණ විෂය උගන්වන ගුරුවරුන්ගේ ඌණතාවය අවම කිරීම, තාක්ෂණ විෂය හදාරන සිසුන්ට ශ්‍රීරු තාක්ෂණලාභීන් ලෙස උසස් අධ්‍යාපනය ලැබීමට අවස්ථාව සැලසීම, තාක්ෂණ විෂය උගන්වන ගුරුවරුන්ට තම වෘත්තිය සංවර්ධනය සඳහා තාක්ෂණ විෂයට අදාළව ගුරු පුහුණුව ලබාදීම ආදී කරුණු පදනම් කරගනිමින් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක් ඉදිකිරීම සඳහා 2017 ජනවාරි 18 දිනැති අංක අමප/16/2647/742/036-1 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවෙන් අනුමැතිය ලබාදී තිබුණි. 2017 අප්‍රේල් 19 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පල කරනු ලැබූ 2017 අංක 93 දරණ ආඥාවේ සඳහන් දැන්වීම මගින් අදාළ ඉදිකිරීම සඳහා කුලියාපිටිය බටහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් නාරංගොල්ල ප්‍රදේශයේ ඉඩමක භුක්තිය අධ්‍යාපන ලේකම්වරයා වෙත පවරා තිබුණි. කොරියානු රජයේ ආධාර මත ඉදිකිරීමට සැලසුම් කරන ලද මෙම ව්‍යාපෘතිය සඳහා 2019 සහ 2020 වර්ෂයන්වල මුල්ගල් තැබීම ඇතුළු වියදම් සඳහා ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය මගින් රු. 15,366,316 ක මුදලක් වැයකර තිබුණද, ව්‍යාපෘතියේ වැඩ කටයුතු නවතා දමා තිබුණි.

3.2 විදේශ ආධාර ව්‍යාපෘති

-----------------------

සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය සඳහා සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘතියේ අදියර i හා ii සඳහා අයවැය ප්‍රතිපාදන රු.964,158,478 ක් ලැබී තිබුණු අතර එහි මූල්‍ය හා භෞතික කාර්යසාධනය පරීක්ෂාවේ දී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට අප්‍රේල් දක්වා පාසැල් 100 කට සහ සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා පාසැල් 44 කට රුපියල් මිලියනය බැගින් ලබාදීමට ඉලක්ක කර තිබුණද, එම පාසැල් සඳහා කිසිදු මුදලක් ලබාදී නොතිබුණි.

(ii) රුපියල් මිලියන 1.2 ක් වැය කර ගුරු පුහුණු වැඩසටහන් 5 ක් හා මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් 14ක් පැවැත්වීමට ඉලක්ක කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී ගුරු පුහුණු වැඩසටහන් හෝ මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් කිසිවක් පවත්වා නොතිබුණි.

(iii) දිවයිනේ පාසැල් 10,175 කට උෂ්ණත්වමාන මිලදී ගැනීමට සහ රු.මිලියන 335 ක ප්‍රතිපාදන මත මුහුණු ආවරණ ලබාදීමට ඉලක්ක කර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දී මුහුණු ආවරණ මිලදී ගැනීමට රු.මිලියන 71 ක් පමණක් වැයකර තිබුණු අතර උෂ්ණත්වමාන මිලදී ගෙන නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

3.3.1 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට අයත් වාහන 11 ක් අමාත්‍යාංශය භාවිතයට ගෙන තිබුණු අතර, අමාත්‍යාංශයට අයත් වාහන 22 ක් වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වෙත පවරා තිබුණි. මෝටර් රථ ලියාපදිංචි සහතික මුල් පිටපත නොමැතිව අමාත්‍යාංශය භාවිතයට ගන්නා වාහන 11 ක් පවරා ගැනීමට හෝ නීත්‍යානුකූල අයිතිය හිමි ආයතන වෙත ලබාදීමට හෝ කටයුතු කර නොතිබුණි.

3.3.2 2020 දෙසැම්බර් 08 අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද වාහන පිරිවැය වාර්තාව තුළ අමාත්‍යාංශයට අයත් නොවන වාහන 23 ක්, අපහරණය කරන ලද වාහන 07ක්, වෙනත් ආයතන වෙත පවරා දෙනු ලැබූ වාහන 03ක් හා පවරා දීමකින් තොරව වෙනත් ආයතන වෙත ලබා දී තිබූ වාහන 08 ක් ඇතුළත් කර තිබුණි.

3.4 ප්‍රසම්පාදනයන්

-----------------

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සහ ගුරු මධ්‍යස්ථාන සඳහා සුහුරු පන්ති කාමර උපකරණ ප්‍රසම්පාදන සඳහා සැපයුම්කරු සමඟ එළඹි ගිවිසුම අනුව 2020 මාර්තු 10 දිනට පෙර උපකරණ අදාළ ගුරු මධ්‍යස්ථාන හා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ වෙත සපයා අවසන් කලයුතු වුවත්, සැපයුම්කරු භාණ්ඩ සැපයීම සඳහා සති 20 කට අධික කාලයක් ප්‍රමාද කර තිබුණි. එසේ වුවද කොන්ත්‍රාත් වටිනාකමෙන් සියයට 10 ක ප්‍රමාද ගාස්තු වන රු.3,844,872 ක් අයකර නොගෙන සැපයුම්කරුට ගෙවීම් කර තිබුණි.

3.5 අනාර්ථික ගණුදෙනු

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා ටොයොටා හයිලක්ස් වර්ගයේ ඩබල් කැබ් රථ 20 ක් 2017 දෙසැම්බර් 11 දින කුලී පදනම මත ලබාගෙන තිබුණු අතර, එදින සිට 2020 නොවැම්බර් 24 දක්වා රු. 137,219,886 ක මුදලක් කුලී වශයෙන් ගෙවා තිබුණද, එයින් වාහන 14 ක් කුලී ගිවිසුම් ප්‍රකාරව 2018 හා 2019 වර්ෂවල මාසිකව අවම වශයෙන් කිලෝමීටර් 3,000 ක ප්‍රමාණය ධාවනය කර නොතිබුණි.

(ආ) 2017, 2018 හා 2019 වර්ෂවල අමාත්‍යාංශය සතු වාහන සඳහා ඉන්ධන, අළුත්වැඩියා සහ රියදුරු අතිකාල ඇතුලත්ව එක් වාහනයක දළ වාර්ෂික වියදම පිළිවෙලින් රු. 639,480 ක් රු. 703,045 ක් සහ රු. 625,770 ක් විය. වශයෙන් කුලී පදනම මත වාහන 07 ක් අවස්ථා දෙකකදී එක් වාහනයක් හා වාහන 06 ක් වශයෙන් ලබාගෙන තිබුණු අතර, පලමු වාහනයේ වාර්ෂික වියදම රු.5,844,300 ක් හා අනෙක් වාහන 6 න් එක් වාහනයක වාර්ෂික වියදම රු. 2,649,600 වී තිබුණි. වාහනයක කුලී වියදම අමාත්‍යාංශය සතු වාහන නඩත්තු පිරිවැය මෙන් සියයට 400 ක් වී තිබුණු අතර, කුලී පදනම මත වාහන ලබාගැනීම ආර්ථිකමය වශයෙන් ඵලදායී නොවූ ගණුදෙනුවක් ලෙස නිරීක්ෂණය විය.

3.6 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

------------------------------------------

සමාලෝචිත වර්ෂයේදී ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කල විගණන විමසුම් 07 ක් සඳහා පිලිතුරු ලබා දී නොතිබුණු අතර මාස 5 ඉක්මවූ විමසුම් 02ක්, මාස 03 ඉක්මවූ විමසුම් 01ක්, මාස 02 ඉක්ම වූ විමසුම් 02ක් හා මාස 01 ඉක්මවූ විමසුම් 02ක් ඊට ඇතුලත් වී තිබුණි.

3.7 කළමනාකරණ දුර්වලතා

-------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 1986 අංක 30 දරණ අධ්‍යාපනික විද්‍යායතන පනතේ 5.3 වගන්තිය අනුව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පද්ධතියේ ප්‍රමාණාත්මක හා ගුණාත්මක සංවර්ධනය සඳහා තීරණ ගැනීම, සැලසුම්කරණය හා මූල්‍ය කළමනාකරණය ආදියේදී විද්‍යාපීඨවල පාරදෘශ්‍යභාවය හා වගවීම වඩාත් තහවුරු වන පරිදි කටයුතු කිරීම සඳහාත් විනිවිදභාවයකින් යුක්ත වූ කාර්යක්ෂමව හා නිවැරදිව ප්‍රයෝගිකව ක්‍රියාත්මක කිරීම මගින් සම්පත් උපයෝජනයේ ප්‍රශස්ථභාවය සඳහා විධිමත් මාර්ගෝපදේශයක් වශයෙන් විද්‍යාපීඨ සංග්‍රහයක් නිකුත් විය යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටද විධිමත් නීතිමය විද්‍යාපීඨ සංග්‍රහයක් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සකස් කර නොතිබුණි.

(ආ) 2008 සැප්තැම්බර් 24 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ අංක අමප/08/1742/316/086 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව පිහිටුවා තිබුණද, ඊට අදාළ කෙටුම්පත් පනත 2008 ඔක්තෝබර් 29 දින නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණු නමුත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටද පනතේ කටයුතු අවසන් කර නොතිබුණි.

(ඇ) ගුරු වෘත්තිය සංවර්ධන මධ්‍යස්ථානවලට පවතින දුරකථන පහසුකම් හා අන්තර්ජාල පහසුකම් නොමැති වීම, කථිකාචාර්යවරු හා සම්පත්දායකයින් නොමැති වීම, තාක්ෂණික දැනුම නොමැතිවීම, වියදම් ප්‍රතිපූර්ණ ප්‍රමාදවීම් පිළිබඳ නිසි අධ්‍යනයකින් තොරව එම මධ්‍යස්ථානවල පුහුණු වැඩසටහන් මාර්ගගත ක්‍රමයට සිදුකිරීම සඳහා උපදෙස් ලබාදී තිබුණි.ඒ හේතුවෙන් පුහුණු කාර්යයන් අසාර්ථක වී තිබුණද, එම මධ්‍යස්ථානවල පවතින ගැටළු සඳහා විසඳුම් අමාත්‍යාංශය විසින් ලබාදී නොතිබුණි.

(ඈ) ගුරු ශික්ෂණලාභීන් පුහුණු කිරීම සඳහා අධ්‍යාපන විද්‍යාපීඨ 19 ක් පිහිටුවා ඇති අතර, ඒ සඳහා වාර්ෂිකව රු.මිලියන 2,500 කට අධික වියදමක් ඒකාබද්ධ අරමුදලින් වැයකරනු ලබයි. එහෙත් අධ්‍යාපන විද්‍යාපීඨ සඳහා ශික්ෂණලාභීන් වාර්ෂිකව ඇතුලත් කරගැනීමේදී අ.පො.ස උසස් පෙළ විභාගය පවත්වා වර්ෂ 3 කට ආසන්න කාලයක් ගත වන අතර, 2018 හා 2019 වර්ෂවල පැවැත්වූ විභාගවලින් 2021 ජුනි 28 දින වන විටත් ශික්ෂණලාභීන් ඇතුලත් කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) දකුණු පළාත් මුලටියන කලාප අධ්‍යාපන කාර්යාලයේ ගුරුවරුන් දෙදෙනෙකුගේ විනය පරීක්ෂණ හේතුවෙන් විශ්‍රාම පාරිතෝෂික මුදල වන රු. 453,642 ක් හා රු.321,390 ක් 2014 වර්ෂයේ සිට රඳවා තබාගෙන තිබුණු අතර, වසර 06 ක් අවසන් වුවද, විනය පරීක්ෂණ කටයුතු අවසන් කර විසඳුමක් ලබාදීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) බස්නාහිර, උතුරුමැද හා සබරගමුව පළාත්වල ලබාදුන් ශිෂ්‍යාධාර පිළිවෙලින් රු. 80,000 ක්, රු. 248,777 ක් හා රු. 23,500 ලෙස ගිණුම් අංක වැරදීම නිසා හරවා එවා වසර 2 ට වැඩි කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවා තබාගෙන තිබුණ ද ඊට හේතු සොයා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) ඌව ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයෙහි පොදු තැන්පත් කාල විශ්ලේෂණ වාර්තාව අනුව 2012 හා2015 කාල පරිච්ඡේදයට අයත් නිරවුල් නොකළ රු. 128,900 ක තැන්පතු පැවතුණි. ඩිප්ලෝමා ප්‍රදානෝත්සවය පවත්වන තුරු ඇප තැන්පත් නිරවුල් කිරීමට නොහැකිවීම හේතුවෙන් වසර 05 වැඩි කාලයක් තැන්පතු පැවතුණද ශිෂ්‍යයින් කොටසකට තැන්පත් නිරවුල්කර කොටසකට නිරවුල් නොකිරීමට හේතුව විගණනයට පැහැදිලි නොවුණි.

3.8 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව සියළුම පාඩු හා අත්හැරීම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත්, රු. 3,034,778 ක් වටිනා අනතුරු 33 ක් සම්බන්ධයෙන් සිදු වූ පාඩු හා අත්හැරීම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වර්ෂ 8 ක් තුල සිදුවූ රු. 4,742,030 ක් වූ පාඩු හා අත්හැරීම් අවස්ථා 40 ක් ආරම්භක කපා නොහල ශේෂය යටතේ දක්වා නොතිබුණි.

4. තිරසර සංවර්ධනය

4.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනාගැනීම

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් දැනුවත් වී තිබුණු නමුත්, එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවීමේ වැඩ පිළිවෙල සැලසුම්වලට ඇතුළත් කර එම ඉලක්ක කරා ළඟ විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

සමාලෝචිත වර්ෂයේ අනුමත තථ්‍ය පුරප්පාඩු හා අතිරික්ත ,කාර්ය මණ්ඩල පිළිබඳ තොරතුරු පහත සඳහන් පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 2,572 | 1,384 | 1,188 |
| (ii) ද්විතියික මට්ටම | 45,041 | 44,565 | 476 |
| (iii) තෘතියික මට්ටම | 2,354 | 1,114 | 1,240 |
| (iv) ප්‍රාථමික මට්ටම | 10,204 | 8,956 | 1,248 |
| එකතුව | 60,171 | 56,019 | 4,152 |

ජ්‍යෙෂ්ඨ සහ ද්විතියික මට්ටමේ පුරප්පාඩු 1,664 ක් පැවතීම හේතුවෙන් කළමනාකරණ තීරණ ගැනීමේදිද අනෙකුත් පුරප්පාඩු හේතුවෙන් අමාත්‍යාංශ කටයුතු වලදීද අවහිරතා මතුවී තිබුණු බව නිරීක්ෂණය විය.


P. H. Hemamali

එම්.අයි.පුෂ්පා හේමමාලි

සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට


WWW.NEWS.CN


ගුරුගෙදර
හැදෙන අපි හදන තැන
A/LEVEL
සිංහල මාධ්‍ය
රසායන විද්‍යාව
පාඩම - 15



# 04. පරිච්ඡේදය
# කාර්ය සාධන දර්ශක

## 4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරි සැලැස්ම මත පදනම්ව)

| විශේෂිත දර්ශක | ළඟා කර ගත් නිමැවුම (2020 වර්ෂයේ දත්ත නොමැති අවස්ථාවල ආසන්න දත්ත සහිත වසරේ අගයන් දක්වා ඇත) | තත්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|---|
| | | 90% - 100% | 75% - 89% | 50% - 74% |
| **ප්‍රවේශය සහ සහභාගිත්වය ඉහළ නැංවීම** | | | | |
| 11 ශ්‍රේණිය දක්වා ශිෂ්‍ය රැඳී සිටීමේ අනුපාතය ගැහැණු 91% , පිරිමි 90% සහ සමස්තය 90% දක්වා ඉහළ නැංවීම. | ගැහැණු : 95%<br>පිරිමි : 91%<br>සමස්ත : 93%<br>(2019 දත්ත අනුව) | √ | | |
| ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සම සහභාගිත්වය සහතික කිරීම. | ස්ත්‍රී පුරුෂ සමානාත්මතා දර්ශකය (2019)<br>ප්‍රාථමික (1-5) - 1.0<br>කණිෂ්ඨ ද්විතියික (6-9) - 1.0<br>පහළ ජ්‍යෙෂ්ඨ ද්විතියික (10-11) - 1.0<br>ඉහළ ජ්‍යෙෂ්ඨ ද්විතියික (12-13) - 1.3 | | √ | |
| අ.පො.ස.(උ.පෙ.) විද්‍යා හා තාක්ෂණ ශිෂ්‍ය සහභාගිත්වය වැඩි කිරීම. | 2014-2019 කාල පරාසය සැලකීමේ දී අ.පො.ස.(උ.පෙ.) විද්‍යා හා තාක්ෂණ ශිෂ්‍ය අනුපාතය 30% සිට 33% දක්වා වැඩි වී ඇත. | √ | | |
| ඉහළ ද්විතියික අධ්‍යාපනය සඳහා ශාස්ත්‍රීය අධ්‍යාපනය හෝ වෘත්තීය අධ්‍යාපනය තෝරා ගැනීමේ අවස්ථා සලසා දෙමින් සෑම ශිෂ්‍යයෙකුටම 13 වසරක අධ්‍යාපනයක් ලැබීම සහතික කිරීම සඳහා 2020 වසර වන විට පාසල් 584ක වෘත්තීය විෂයය ධාරාව ක්‍රියාත්මක කිරීම. | වෘත්තීය විෂය ධාරාව ක්‍රියාත්මක පාසල් සංඛ්‍යාව<br>2017 - 42<br>2018 - 192<br>2019 - 311<br>2020 - 423 | | | √ |
| **ශිෂ්‍ය සාධනය ඉහළ නැංවීම** | | | | |
| ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනයේ ඉගෙනුම් ඵල ඉහළ නැංවීම.<br>♦ අ.පො.ස (සාපෙළ) ගණිතය සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම<br>♦ අ.පො.ස (සාපෙළ) පළමු බස සමත් ප්‍රතිශතය ඉහළ නැංවීම<br>♦ අ.පො.ස (සාපෙළ) ඉංග්‍රීසි සමත් ප්‍රතිශතය 55% දක්වා ඉහළ නැංවීම | අ.පො.ස (සා.පෙළ) ගණිතය සමත් ප්‍රතිශතය<br>2017 - 67.2%<br>2018 - 68.3%<br>2019 - 71.0%<br>අ.පො.ස (සා.පෙළ) සිංහල භාෂාව සමත් ප්‍රතිශතය<br>2017 - 90.6%<br>2018 - 91.3%<br>2019 - 91.4%<br>අ.පො.ස (සා.පෙළ) දෙමළ භාෂාව සමත් ප්‍රතිශතය<br>2017 - 88.7%<br>2018 - 90.0%<br>2019 - 89.0%<br>අ.පො.ස (සා.පෙළ) ඉංගීසි භාෂාව සමත් ප්‍රතිශතය<br>2017 - 51.1%<br>2018 - 54.9%<br>2019 - 62.3% | | √ | |

| විශේෂිත දර්ශක | ළඟා කර ගත් නිමැවුම (2020 වර්ෂයේ දත්ත නොමැති අවස්ථාවල ආසන්න දත්ත සහිත වසරේ අගයන් දක්වා ඇත) | තත්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස 90% - 100% | 75% - 89% | 50% - 74% |
|---|---|---|---|---|
| **විෂයමාලාව සහ විෂය සමගාමී ක්‍රියාකාරකම් සංවර්ධනය** | | | | |
| සියළුම පාසල්වල සිසුන්ට ගුණාත්මක මට්ටමේ විෂය සමගාමී ක්‍රියාකාරකම් හා ක්‍රීඩා සඳහා අවස්ථා ලබා දීම. | 2020 වර්ෂයේ පැවති කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් විෂය සමගාමී ක්‍රියාකාරකම් හා ක්‍රීඩා තරඟ පැවැත්වීමට නොහැකි විය. | | | |
| **වෘත්තීය සංවර්ධනය** | | | | |
| වෘත්තීය සුදුසුකම් සහිත ගුරු ප්‍රතිශතය ඉහළ නැංවීම. | වෘත්තීය සුදුසුකම් සහිත ගුරු ප්‍රතිශතය (2017) - 85% | | √ | |
| 2020 වන විට ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ 19 උපාධි ප්‍රදාන කරන ආයතන බවට පත් කිරීමට අවශ්‍ය කටයුතු කිරීම. | මේ සඳහා මූලික සාකච්ඡා පවත්වා යෝජනා සකස් කර ඇත. | | | √ |
| අධ්‍යාපන පද්ධතියේ පශ්චාත් උපාධිධාරී වෘත්තිකයින් සංඛ්‍යාව වැඩි කිරීම. | සම්මුඛ පරීක්ෂණ පවත්වා මේ සඳහා නිලධාරීන් 101ක් තෝරා ගැනීම සිදු කරන ලදී. නිලධාරීන් 5 දෙනෙකු මාර්ගගත ක්‍රමවේද ඔස්සේ ලියාපදිංචි වී ඇත. | | | |
| **යටිතල පහසුකම් සංවර්ධනය** | | | | |
| තෝරාගත් පාසල්වල ඉගෙනුම් පරිසරය ආකර්ෂණීය ලෙස වැඩි දියුණු කිරීම. | ව්‍යාපෘති 8ක ක්‍රියාකාරකම්වල අපේක්ෂිත වාර්ෂික ඉලක්කයෙන් 65%ක් ළඟා කර ගන්නා ලදී. | | √ | |
| **අධ්‍යාපන සැලසුම්කරණ හා කළමනාකරණ ක්‍රියාවලිය බලගැන්වීම** | | | | |
| සියලුම පාසල්වල පාසල් නඟා සිටුවීම බලගැන්වීම වැඩසටහන ක්‍රියාත්මක කිරීම. | පාසල් නඟා සිටුවීම බලගැන්වීම වැඩසටහන(EPSI) ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් හා එක්ව සැලසුම් සකස් කිරීම හා පුහුණු කරුවන් පුහුණු කිරීම 80%ක් පමණ අවසන් කරන ලදී. | | √ | |
| මධ්‍ය කාලීන අයවැය රාමුව පාදක කරගනිමින් අධ්‍යාපන ආංශික සංවර්ධන සැලැස්ම හා වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සකස් කිරීම. | අධ්‍යාපන ආංශික සංවර්ධන සැලැස්ම සකස් කිරීම 90% ක් හා වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සකස් කිරීම 100%ක් නිම කරන ලදී. | √ | | |
| සංවර්ධන පාර්ශවකාර සංවිධාන සමඟ සම්බන්ධීකරණය තුළින් පද්ධතියේ භෞතික හා මානව සම්පත් සංවර්ධනය | ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, KOICA, UNICEF ඇතුළු සංවර්ධන ආධාර ලබා දෙන ජාත්‍යන්තර ආයතන හා සම්බන්ධීකරණය තුළින් ව්‍යාපෘති සැලසුම් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී. | √ | | |

| විශේෂිත දර්ශක | ළඟා කර ගත් නිමැවුම (2020 වර්ෂයේ දත්ත නොමැති අවස්ථාවල ආසන්න දත්ත සහිත වසරේ අගයන් දක්වා ඇත) | තත්‍ය නිමැවුම අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස | | |
|---|---|---|---|---|
| | | 100% - 90% | 75% - 89% | 50% - 74% |
| ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය (NEMIS) වැඩි දියුණු කිරීම හා තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා දත්ත භාවිතය වැඩි දියුණු කිරීම. | ජාතික අධ්‍යාපන කළමනාකරණ තොරතුරු පද්ධතිය (NEMIS) යටතේ වන ගුරු තොරතුරු පද්ධතිය (THRM)යාවත්කාලීන කරන ලදී<br><br>ශිෂ්‍ය තොරතුරු පද්ධතිය (SIS) යාවත්කාලීන කිරීම සඳහා පළාත්වලට අවශ්‍ය ප්‍රතිපාදන සැපයීම සහ තාක්ෂණික සහාය ලබා දෙන ලදී. | | √ | |
| අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීම ප්‍රවර්ධනය | අධ්‍යාපන පර්යේෂණ සිදු කිරීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ තෝරා ගත් අධ්‍යාපන පර්යේෂණ යෝජනා සඳහා ප්‍රතිපාදන ලබා දීම සිදු කරන ලදී. | | √ | |


LEESON
MANUSATH DERANA




COVID -19 අලුත් වාරයේ අලුත් පාඩම්
1
2
3
4
5
6
7
8
MINISTRY OF EDUCATION
USAID
FROM THE AMERICAN PEOPLE
Health Promotion Bureau
unicef
for every child

# 05. පරිච්ඡේදය
# තිරසාර සංවර්ධන අරමුණු සපුරා ගැනීමේ කාර්යසාධනය

## 5.1 හඳුනාගන්නා ලද අදාළ තිරසර සංවර්ධන අරමුණු

| අරමුණු | ඉලක්කය | දර්ශක | 2020 දර්ශක අගය | මේ දක්වා ළඟා කර ගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75%-100% |
| සැමට සමසාධාරණ, අන්තර්කරණ, ගුණාත්මක අධ්‍යාපනයක් සහ යාවජීව ඉගෙනුම් අවස්ථා ප්‍රවර්ධනය සහතික කිරීම. | 4.1 වසර 2030 වන විට අධ්‍යාපනයේ ස්ත්‍රී පුරුෂ සමානතාව හා අවාසිදායක පරිසරවල ජීවත්වන දරුවන් කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් සියලුම ගැහැණු හා පිරිමි දරුවන් නිදහස් හා අනිවාර්ය ගුණාත්මක පාසල් අධ්‍යාපනය 13 වසරක් දක්වා සම්පූර්ණ කරමින් අදාළ ඉගෙනුම් ඵල අත්පත් කර ගැනීම සහතික කිරීම. | 4.1.1 ප්‍රාථමික චක්‍රයේ අවසන් ශ්‍රේණියට ඇතුළත් වීමේ දළ අනුපාතය | 94.81% | | | √ |
| | | 4.1.2 1-9 ශ්‍රේණි සඳහා නියමිත වයස් කාණ්ඩයේ සිසුන් ඇතුළත්වීමේ අනුපාතය | 95.40% | | | √ |
| | | 4.1.3 ප්‍රාථමික චක්‍රයට ඇතුළත්වීමේ ශුද්ධ අනුපාතය | 91.90% | | | √ |
| | | 4.1.4 ද්විතීයික චක්‍රයට ඇතුළත්වීමේ ශුද්ධ අනුපාතය | 95.30% | | | √ |
| | | 4.1.5 ශිෂ්‍ය ගුරු අනුපාතය | 17 | | | √ |
| | | 4.1.6 අධ්‍යාපනය සඳහා රජයේ වියදම්, දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස | 1.9 | | | √ |
| | 4.3 වසර 2030 වන විට සියලුම ගැහැණු හා පිරිමි දරුවන්ට විශ්වවිද්‍යාල ද ඇතුළුව දැරිය හැකි මෙන් ම ගුණාත්මක බවින් යුතු තාක්ෂණික, වෘත්තීය හා තෘතීයික අධ්‍යාපනයට ඇතුළත්වීමේ සම අවස්ථා සහතික කිරීම. | 4.3.1 ප්‍රතීතනය ලත් පාඨමාලා සංඛ්‍යාව | 2,691 | | | √ |
| | | 4.3.2 ලියාපදිංචි තාක්ෂණ හා වෘත්තීය අධ්‍යාපන හා පුහුණු ආයතන සංඛ්‍යාව | 1,290 | | | √ |
| | 4.C වසර 2030 වන විට විශේෂයෙන් ඌණ සංවර්ධිත රටවලට සහ කුඩා රාජ්‍යයන්ට ජාත්‍යන්තර සහයෝගීතාවය යටතේ සංවර්ධිත රටවල ගුරු පුහුණු අවස්ථා සලසා දෙමින් සුදුසුකම් ලත් ගුරු ප්‍රතිශතය සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම. | 4.C.1 ප්‍රාථමික ශ්‍රේණිවල ට උගන්වන ගුරුවරුන් අතරින් අවම විධිමත් ගුරු පුහුණුවක් හෝ ලබා ඇති ගුරු ප්‍රතිශතය | 99.22% | | | √ |
| | | 4.C.2 ද්විතීයික ශ්‍රේණිවලට උගන්වන ගුරුවරුන් අතරින් අවම විධිමත් ගුරු පුහුණුවක් හෝ ලබා ඇති ගුරු ප්‍රතිශතය | 100% | | | √ |

| අරමුණු | ඉලක්කය | දර්ශක | 2020 දර්ශක අගය | මේ දක්වා ළඟා කර ගත් ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | | | | 0% - 49% | 50% - 74% | 75%- 100% |
| | | 4.C.5 ජාතික ප්‍රතිමානයන් ට අනුව සුදුසුකම් ලත් ප්‍රාථමික චක්‍රයේ ගුරු ප්‍රතිශතය | 96.35% | | | √ |
| | | 4.C.6 ජාතික ප්‍රතිමානයන් ට අනුව සුදුසුකම් ලත් ද්විතියික චක්‍රයේ ගුරු ප්‍රතිශතය | 94.93% | | | √ |
| | 4.6 වසර 2030 වන විට සියලුම තරුණයන් හා ස්ත්‍රී පුරුෂ යන දෙපිරිසෙන් ම සැලකිය යුතු වැඩිහිටි අනුපාතයක් සාක්ෂරතාව හා සංඛ්‍යා හැකියාව ළඟා කර ගැනීම තහවුරු කිරීම. | 4.6.1 සාමාන්‍ය සාක්ෂරතා අනුපාතය | 92.5% | | | √ |
| | | 4.6.2 පුරුෂ සාක්ෂරතා අනුපාතය | 93.4% | | | √ |
| | | 4.6.3 ස්ත්‍රී සාක්ෂරතා අනුපාතය | 91.6% | | | √ |

## 5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ගෝලීය වශයෙන් තිරසර සංවර්ධන ඉලක්කයන් සපුරා ගැනීමේ ප්‍රගතිය නියාමනය සඳහා ගෝලීය දර්ශක හඳුන්වා දී ඇත. එම දර්ශක ශ්‍රී ලංකාවට ගැලපෙන අයුරින් සකස් කර ශ්‍රී ලංකාවට අනන්‍ය දර්ශක සකස් කර ඇත. වාර්ෂිකව සහ වර්ෂ කිහිපයකට වතාවක් ලෙස සිදු කරන්නා වූ දත්ත රැස් කිරීම් මඟින් එම දර්ශක සඳහා අගයයන් ගණනය කරනු ලැබේ.

ඉහත දක්වා ඇත්තේ ශ්‍රී ලංකාව තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා යොදා ගන්නා දර්ශකයන් හා ඒ සඳහා ලබා ගත් අගයයන් ය. ඒ අනුව බලන විට බොහෝ දර්ශක අගයයන්හි ප්‍රගතිය 75% ත් 100% ත් අගයයක් ගැනීම ජයග්‍රහණයක් ලෙස දැක්විය හැකිය. විශේෂයෙන් ම සම අධ්‍යාපන අවස්ථා සඳහා ප්‍රවේශය, සාක්ෂරතාවය සහ ප්‍රාථමික හා ද්විතීයික ගුරු පුහුණුව ආදී දර්ශකයන් අනුව බලන විට ශ්‍රී ලංකාව තිරසර අධ්‍යාපනයක් කරා ගමන් කරන බව නිරීක්ෂණය වේ.

නමුත් වර්තමානයේ පවතින ගෝලීය කොවිඩ් වසංගත තත්වය හමුවේ මෙම තත්වය ඉදිරියට පවත්වා ගැනීම විශාල අභියෝගයක් වී ඇත. පාසල් පැවැත්වීමේ අවධානම හමුවේ ශිෂ්‍ය ප්‍රජාව වෙත සම අධ්‍යාපන අවස්ථා සැපයීම මෙහි දී ප්‍රධානතම අභියෝගයක් වී ඇත.

කොවිඩ් වසංගත තත්වය වැනි අනපේක්ෂිත ගෝලීය ව්‍යසන හැර ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් පවතින අභියෝගයක් ලෙස තිරසර සංවර්ධනය සඳහා වගකිව යුතු පාර්ශවයන් විසින් සාමූහිකව සකස් කරන ලද සාර්ව සැලැස්මක් නොපැවතීම දැක්විය හැකි ය. එනම්, සියලුම රාජ්‍ය ආයතන තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීමේ අභිලාෂයෙන් යුක්ත වුව ද, සාමූහික ව නිසි සම්බන්ධීකරණයක් සහිතව මෙම අරමුණු ළඟා කර ගැනීමට ඒකීය සැලසුමක් සකස් කර ගැනීම මූලික ම අභියෝගයක් වී ඇත.

ශ්‍රී ලංකාවේ ප්‍රතිපත්ති හා සැලසුම් සකස් කිරීමේ දී දත්ත මත පදනම් නොවීම ද ප්‍රධාන අභියෝගයකි. එමෙන් ම තීරණ ගැනීම සඳහා භාවිත කළ හැකි යාවත්කාලීන වූත් රාජ්‍ය යාන්ත්‍රණයට දායක වන සියලු ආයතනයන් එකිනෙකට සම්බන්ධ වූ ත් දත්ත පද්ධතියක් නොපැවතීම ද අභියෝගයකි. ගුණාත්මක දත්ත රැස් කිරීමේ ක්‍රමවේදයක් නොපැවතීම හේතුවෙන් රටෙහි සත්‍ය අවශ්‍යතාවය හඳුනා ගැනීමට නොහැකිවීම ද තවත් අභියෝගයක් ලෙස දැක්විය හැකි ය.

# 06. පරිච්ඡේදය
# මානව සම්පත් පැතිකඩ

## 6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

| මට්ටම | අනුමත සේවක සංඛ්‍යාව | සිටින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු / අතිරික්ත (-) (+) |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 496 | 452 | - 44 |
| තෘතීයික | 11 | 08 | - 03 |
| ද්විතීයික | 606 | 726 | + 120 |
| ප්‍රාථමික | 265 | 279 | + 14 |
| එකතුව | **1378** | **1465** | **+ 87** |

## 6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයේ බලපෑම

2020 අගෝස්තු 09 වන දින රජයේ ගැසට් නිවේදනයට අනුව පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රයට අයත් විෂයය ක්ෂේත්‍ර කිහිපයක් කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යාංශයට හා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයට පවරණු ලැබිණි.

2020 අගෝස්තු 05 වන දිනැති පීඑස්/සීඑස්ඒ/චක්‍රලේඛ/31/2020 දරණ ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛයට අනුව අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යාංශය හා රාජ්‍ය අමාත්‍යාංශය අතර මානව සම්පත් විධිමත් පරිදි වෙන් කර ගැනීමටත්, අවශ්‍යතාවයන් පැන නැගෙන අවස්ථාවල දී රාජ්‍ය අමාත්‍යාංශ සඳහා කාර්යමණ්ඩල දායකත්වය ලබා දීමටත් සේවා අවශ්‍යතාව අනුව කාර්යභාර්යයන් ප්‍රතිසංවිධානය කර ගනිමින් අනුමත කාර්යමණ්ඩල බඳවා ගැනීම් විධිමත්ව කර ගැනීමටත් උපදෙස් ලබා දී ඇත.

ඒ අනුව රාජ්‍ය අමාත්‍යාංශවලට පැවරී ඇති විෂයයන්ට අනුව කාර්ය මණ්ඩල රාජ්‍ය අමාත්‍යාංශ වෙත අනියුක්ත කරන ලදී. නව අවශ්‍යතා අනුව කාර්ය මණ්ඩල අනුමත කර ගැනීමට ද අවශ්‍ය පියවර ගන්නා ලදී.

# 6.3 මානව සම්පත් සංවර්ධනය

## 6.3.1 දේශීය වැඩසටහන්

| වැඩසටහන | පුහුණු කළ නිලධාරීන් ගණන | වැඩසටහන් කාලය | ආයෝජනය රු.මිලියන | | ළඟාකර ගත් දැනුම / ලබා දුන් පුහුණුව |
|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | |
| **ජාතික පාසල් සංවර්ධනය** | | | | | |
| ජාතික පාසල් කළමනාකරණ හා පරිපාලනය පිළිබඳ ධාරිතා සංවර්ධනය | ජාතික පාසල් විදුහල්පතිවරුන් හා නියෝජ්‍ය විදුහල්පත්වරු 270 | එක් දින වැඩසටහන් | 0.254 | | ජාතික පාසල් කළමනාකරණය හා පරිපාලනය |
| **විශේෂ අධ්‍යාපනය, නොවිධිමත් අධ්‍යාපනය සහ අන්තර්කරණ අධ්‍යාපනය** | | | | | |
| විශේෂ අධ්‍යාපනය පිළිබඳ කලාප නිලධාරීන් පුහුණු කිරීම | විශේෂ අධ්‍යාපන කලාප නිලධාරීන් 88 | දෙදින වැඩසටහන් 1 | 0.207 | | විශේෂ අධ්‍යාපන සංකල්ප, අන්තර්කරණ අධ්‍යාපනය, ඒකීයකරණ අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීම් |
| ප්‍රජා අධ්‍යාපන වැඩසටහන | වැල්ලවාය කලාපයේ හා කොට්ඨාසයේ නොවිධිමත් අධ්‍යාපන නිලධාරීන්, ව්‍යාපෘති නිලධාරීන්, සෞඛ්‍ය, පොලිස් හා ප්‍රජා නිලධාරීන් 49 | දෙදින වැඩසටහන් 1 | 0.221 | | අනිවාර්ය අධ්‍යාපන වයසේ පාසල් නොයන ළමයින් පාසල් ගත කිරීම, පහසුකම් සැපයීම, ළමා අපචාර වැලැක්වීම |
| අන්තර්කරණ අධ්‍යාපන ප්‍රවේශයේ සමීක්ෂණ වාර්තාව එළි දැක්වීම | විශේෂ අධ්‍යාපන නිලධාරීන්, ගුරු උපදේශකවරු හා ගුරුවරු 55 | එක් දින වැඩසටහන් 1 | 0.024 | | සමීක්ෂණ දත්ත ආවරණ කිරීම |
| නොවිධිමත් අධ්‍යාපන නව ප්‍රවණතා හා අනිවාර්ය අධ්‍යාපන රෙගුලාසි ක්‍රියාත්මක කිරීම පිළිබඳ වැඩමුළුව | බස්නාහිර, වයඹ, දකුණ සබරගමුව පළාත් හා එහි කලාපවල නොවිධිමත් අධ්‍යාපන නිලධාරීන් 35ක් | දෙදින වැඩසටහන් 1 | 0.089 | | කලාප මට්ටමින් නොවිධිමත් අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම |
| කුරුණෑගල දිස්ත්‍රික්කයේ තෝරා ගත් පාසල්වල අන්තර්කරණ අධ්‍යාපන ප්‍රවේශ වැඩසටහන | විශේෂ අධ්‍යාපන ගුරුවරු,විදුහල්පතිවරු හා ළමයි 44ක් | එක් දින වැඩසටහන් 1 | - | | අන්තර්කරණ අධ්‍යාපන සංකල්පය |
| සමස්ත ලංකා විශේෂ අධ්‍යාපන කීඩා පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩමුළුව | විශේෂ අධ්‍යාපන නිලධාරීන්, ගුරු උපදේශකවරු හා ගුරුවරු | දෙදින වැඩසටහන් 1 | 0.152 | | විශේෂ අධ්‍යාපන ක්‍රීඩා |
| වයඹ පළාතේ අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ වැඩසටහන | විශේෂ හා ප්‍රාථමික අධ්‍යාපන නිලධාරීන් හා ගුරු උපදේශකවරුන් 40 | එක් දින වැඩසටහන් 1 | - | | අන්තර්කරණ අධ්‍යාපන සංකල්පය |
| කොළඹ දිස්ත්‍රික්කයේ අධ්‍යාපන වෘත්තිකයන් සඳහා අන්තර්කරණ අධ්‍යාපනය පිළිබඳ පුහුණු වැඩමුළුව | විශේෂ හා ප්‍රාථමික අධ්‍යාපන නිලධාරීන් හා ගුරු උපදේශකවරුන් 45 | එක් දින වැඩසටහන් 1 | 0.021 | | අන්තර්කරණ අධ්‍යාපන සංකල්පය |

| වැඩසටහන | පුහුණු කළ නිලධාරීන් ගණන | වැඩසටහන් කාලය | ආයෝජනය රු.මිලියන | | ළඟාකර ගත් දැනුම / ලබා දුන් පුහුණුව |
|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | |
| **දෙමළ පාසල් සංවර්ධනය** | | | | | |
| දෙමළ මාධ්‍ය පාසල්වල නියෝජ්‍ය හා සහකාර විදුහල්පතිවරුන්ගේ ධාරිතා සංවර්ධනය | නියෝජ්‍ය විදුහල්පතිවරු 19 සහකාර විදුහල්පතිවරු 21 | දින 2ක් | 0.132 | | පාසල් මූලා කළමනාකරණය, අභ්‍යන්තර ඇගයීම, පාසල පදනම් කර ගත් ගුරු සංවර්ධනය |
| **මුස්ලිම් පාසල් සංවර්ධනය** | | | | | |
| මුස්ලිම් පාසල් විදුහල්පතිවරුන් හා නියෝජ්‍ය විදුහල්පතිවරුන්ගේ ධාරිතා සංවර්ධනය | විදුහල්පතිවරුන් හා නියෝජ්‍ය විදුහල්පතිවරුන් 216 | එක් දින වැඩසටහන් 4ක් | 0.600 | | පාසල් කළමනාකරණය |
| **ආපදා කළමනාකරණය** | | | | | |
| කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරු සඳහා ආපදා කළමනාකරණය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩමුළුව | නිලධාරීන් 30ක් | දෙදින වැඩසටහන් 1ක් | 0.218 | | ආපදා කළමනාකරණය |
| **පාසල් සෞඛ්‍ය හා පෝෂණ වැඩසටහන** | | | | | |
| 1, 2 ශ්‍රේණිවල දරුවන්ගේ මනෝ සමාජීය අවශ්‍යතා හඳුනා ගැනීම හා පෝෂණ අවශ්‍යතා වැඩිදියුණු කිරීම සඳහා ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩමුළුව | ගුරුවරුන් 145ක් | දෙදින වැඩසටහන් 2ක් | | 0.470 | 1, 2 ශ්‍රේණිවල දරුවන්ගේ මනෝ සමාජීය අවශ්‍යතා හඳුනා ගැනීම හා පෝෂණ අවශ්‍යතා වැඩිදියුණු කිරීම |
| මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන | පුහුණුකරුවන් 214ක් | තෙදින වැඩසටහන් 2ක් හා දෙදින වැඩසටහන් 1ක් | | 0.71 | මානසික සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම |
| කොවිඩ් 19 තත්වය යටතේ සෞඛ්‍ය විෂය සම්බන්ධ අධ්‍යයන ක්‍රියාකාරකම් සකස් කිරීමේ වැඩමුළුව | | දෙදින වැඩසටහන් 3 ක් | 0.30 | | කොවිඩ් 19 තත්වය යටතේ සෞඛ්‍ය විෂය සම්බන්ධ අධ්‍යයන ක්‍රියාකාරකම් |
| **ගණිත අධ්‍යාපනය සංවර්ධනය** | | | | | |
| පර්යේෂණ සංස්කෘතියක් ඇති කිරීම සඳහා ක්‍රියා මූලික පර්යේෂණ කිරීම සම්බන්ධ පුහුණුව | නිලධාරීන් 30 | දෙදින වැඩසටහන් 2ක් | 0.214 | | මූලික පර්යේෂණ සිදු කිරීම |
| සමස්ත ලංකා පාසල් ගණිත තරඟාවලිය පුහුණුකරුවන් පුහුණු කිරීම | නිලධාරීන් 45 | දෙදින වැඩසටහන් 2ක් | 0.631 | | දත්ත ගබඩාවක් සකස් කිරීම |

| වැඩසටහන | පුහුණු කළ නිලධාරීන් ගණන | වැඩසටහන් කාලය | ආයෝජනය රු.මිලියන | | ළඟාකර ගත් දැනුම / ලබා දුන් පුහුණුව |
|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | |
| ගණිත ඔලිම්පියාඩ් වැඩසටහන සඳහා විෂය අන්තර්ගතය සංවර්ධනය කිරීමේ වැඩසටහන | නිලධාරීන් 25 | දෙදින වැඩසටහන් 6ක් | 0.923 | | විෂය අන්තර්ගත දැනුම සංවර්ධනය |
| සාමාන්‍ය අධ්‍යාපන නවීකරණය යටතේ පළාත් මට්ටමේ සම්පත් දායකයින් පුහුණු කිරීම. | නිලධාරීන් 120 | දෙදින වැඩසටහන් 1ක් | 0.378 | | විෂයය දැනුම |
| **ඉංග්‍රීසි හා විදේශ භාෂා අධ්‍යාපනය සංවර්ධනය** | | | | | |
| ඉංග්‍රීසි නාට්‍ය පිළිබඳ පළාත් මට්ටමින් තෝරාගත් ඉංග්‍රීසි ගුරුවරු පුහුණු කිරීම | ගුරුවරු 41 | දින 2 වැඩසටහන් 1 | 0.230 | | ඉංග්‍රීසි නාට්‍ය කුසලතා |
| ඉංග්‍රීසි ගුරුවරුන් සඳහා වූ ඉගෙනුම් සංවර්ධන අඛණ්ඩ වෘත්තීය පුහුණු වැඩසටහන(CPLDT) | ඉංග්‍රීසි ගුරු උපදේශනයක්, විද්‍යාපීඨ කතිකාචාර්යවරු හා සම්පත්දායකයින් 418 | තෙදින හා පස් දින වැඩසටහන් 15 | 2.348 | | ඉංග්‍රීසි ඉගෙනුම් ක්‍රමවේද |
| **තාක්ෂණ අධ්‍යාපන සංවර්ධනය** | | | | | |
| තාක්ෂණ පීඨවල අනධ්‍යන කාර්ය මණ්ඩල පුහුණුව | අනධ්‍යන කාර්ය මණ්ඩල 44ක් | වැඩසටහන් 4 | 0.400 | | තාක්ෂණ පීඨ නඩත්තුව, භාණ්ඩ නඩත්තු පිළිබඳ තක්ෂණික දැනුම හා මෘදු කුසලතා |
| ඉංජිනේරු තාක්ෂණවේදය විෂයයට අදාළ විෂයය සංවර්ධන පුහුණුව | සම්පත් දායකයින් 73 | වැඩසටහන් 6 | 0.200 | | විෂයය දැනුම හා දුරස්ථ අධ්‍යාපන ක්‍රම |
| තාක්ෂණය සඳහා විද්‍යාව විෂයයට අදාළ විෂයය සංවර්ධන පුහුණුව | සම්පත් දායකයින් 11 | වැඩසටහන් 1 | 0.100 | | විෂයය දැනුම හා දුරස්ථ අධ්‍යාපන ක්‍රම |
| **ගෘහ ආර්ථික විද්‍යාව** | | | | | |
| ගුරු සංවර්ධනවැඩසටහන් | සම්පත්දායකයින් 46ක් හා ගුරුවරු 112ක් | වැඩසටහන් 4 | 0.660 | | ප්‍රායෝගික පරීක්ෂණ පැවැත්වීම හා පරිගණක භාවිතය |
| **ප්‍රාථමික අධ්‍යාපනය සංවර්ධනය** | | | | | |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී ප්‍රාථමික ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානයේ කියවීම් කාමරය භාවිතය පිළිබඳ පුහුණුව | සම්පත් දායකයින් 93ක් පුහුණු කිරීම | වැඩසටහන් 2 | 0.328 | | ඉගැන්වීම් සඳහා කියවීම් කාමර ඵලදායීව භාවිත කිරීම |

| වැඩසටහන | පුහුණු කළ නිලධාරීන් ගණන | වැඩසටහන් කාලය | ආයෝජනය රු.මිලියන | | ළඟාකර ගත් දැනුම / ලබා දුන් පුහුණුව |
|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | |
| **ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර අධ්‍යාපනය සංවර්ධනය** | | | | | |
| අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් යටතේ වයඹ පළාත් දෙමළ භාෂා ගුරුවරු පුහුණු වැඩසටහන | දෙමළ භාෂා ගුරුවරු 80 | දින දෙකක නේවාසික වැඩසටහන් | 0.206 | | විෂය දැනුම |
| සමාජ විද්‍යා විෂය, ගුරු උපදේශකවරු හා ගුරුවරුන්ගේ වයඹ පළාත්ධාරිතා සංවර්ධන වැඩසටහන | ගුරුවරු හා ගුරු උපදේශකවරු 95ක් | දින දෙකක නේවාසික වැඩසටහනක් | 0.300 | | විෂය දැනුම |
| **ද්වි භාෂා අධ්‍යාපන පහසුකම්** | | | | | |
| විවෘත විශ්ව විද්‍යාලයේ ද්වීභාෂා අධ්‍යාපනය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාව සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීමේ වැඩසටහන් | ද්වීභාෂා විෂය නිලධාරීන් හා ගුරුවරු 40 | වසර 1 | 3.74 | | ද්විභාෂා අධ්‍යාපන හා පන්ති කාමර භාවිතය |
| **ක්‍රීඩා හා ශාරීරික අධ්‍යාපනය ප්‍රවර්ධනය** | | | | | |
| රග්බි පුහුණුකරුවන් පුහුණු කිරීම | රග්බි පුහුණුකරුවන් | දෙදින වැඩසටහනක් | 0.073 | | ප්‍රායෝගික පුහුණුව |
| ශාරීරික අධ්‍යාපන ගුරුවරු සඳහා පාපන්දු පුහුණුව | ශාරීරික අධ්‍යාපන ගුරුවරු | තෙදින වැඩසටහනක් | 0.497 | | ප්‍රායෝගික පුහුණුව |
| **සෞන්දර්ය අධ්‍යාපන සංවර්ධනය** | | | | | |
| සති අන්ත ජාතික තරුණ වාදක මණ්ඩල පුහුණු කිරීමේ වැඩසටහන | සිසුන් 150 | වසර පුරා සති අන්තය | 0.44 | | ප්‍රායෝගික පුහුණුව |
| අ.පො.ස (උ/පෙළ) බටහිර සංගීත ගුරුවරුන්ගේ විෂයය සංවර්ධනය කිරීමේ වැඩසටහන | ගුරුවරු | වැඩසටහන් 1 | 0.025 | | විෂය දැනුම |
| නාට්‍ය හා රංග කලා විෂය ගුණාත්මක සංවර්ධන වැඩසටහන | නාට්‍ය හා රංග කලා විෂය ගුරුවරු | වැඩසටහන් 5 | 0.81 | | විෂය දැනුම |
| පෙරදිග සංගීත නිලධාරීන් හා ගුරු උපදේශකවරු බලාත්මක කිරීමේ වැඩසටහන | ගුරුවරු හා ගුරු උපදේශකවරු | වැඩසටහන් 2 | 0.529 | | විෂය දැනුම |
| චිත්‍ර විෂය සඳහා e – learning වැඩමුළුව | | | 0.083 | | විෂය දැනුම |
| චිත්‍ර විෂයභාර නිලධාරීන් හා ගුරු උපදේශකවරුන් සඳහා අ.පො.ස (සා/පෙළ) විෂයානුබද්ධ වැඩමුළුව | ගුරුවරු හා ගුරු උපදේශකවරු | වැඩසටහන් 1 | 0.110 | | විෂය දැනුම |
| නර්තන විෂය අ.පො.ස (සා/පෙළ) ප්‍රායෝගික පරීක්ෂණ හා සම්බන්ධ වැඩමුළුව | නර්තන ගුරුවරු | වැඩසටහන් 1 | 0.317 | | විෂය දැනුම |

| වැඩසටහන | පුහුණු කළ නිලධාරීන් ගණන | වැඩසටහන් කාලය | ආයෝජනය රු.මිලියන | | ලබාකර ගත් දැනුම / ලබා දුන් පුහුණුව |
|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | |
| **ආගමික හා සාරධර්ම අධ්‍යාපනය** | | | | | |
| බෞද්ධ සංස්කෘතිය විෂයය ගුරුවරු පුහුණු කිරීමේ වැඩසටහන | ගුරුවරු 65 | වැඩසටහන් 1 | 0.246 | | පළමු පාසල් වාරයට අදාළ පාඩම් ඒකක ආවරණය |
| 6-11 ශ්‍රේණිවල කතෝලික ගුරුවරු පුහුණු කිරීමේ වැඩසටහන | ගුරුවරු 36 | වැඩසටහන් 1 | 0.034 | | |
| බුද්ධ ධර්මය ගුරුවරු පුහුණු පුහුණු කිරීමේ වැඩසටහන | ගුරුවරු 70 | | | | |
| **කෘෂිකර්ම හා පරිසර අධ්‍යයනය සහ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂයය සංවර්ධනය** | | | | | |
| ජෛව පද්ධති තාක්ෂණවේදය පිළිබඳව විද්‍යාගාර පරිහරණය සඳහා විද්‍යාගාර සේවකයින් ප්‍රායෝගිකව පුහුණු කිරීමේ වැඩසටහන | විද්‍යාගාර සේවකයින් 40 | සිව්දින වැඩසටහන් 1 | 0.332 | | විද්‍යාගාර පරිහරණය හා විද්‍යාගාර උපකරණ භාවිතය |
| GLOBE පරිසර වැඩසටහන යටතේ පස් අධ්‍යයනය පිළිබඳ කෘෂිකර්ම ගුරුවරු පුහුණු කිරීමේ වැඩසටහන | ගුරුවරු 25 | දෙදින වැඩසටහන් 1 | 0.145 | | පාංශු අධ්‍යයනය |
| අ.පො.ස. (උ.පෙළ) ජෛව පද්ධති තාක්ෂණ වේදය විෂයය ගුරු පුහුණුව. | ගුරුවරු 45 | දෙදින වැඩසටහන් 1 | 0.177 | | විෂයය නිර්දේශයේ අන්තර්ගත ප්‍රායෝගික කොටස් පිළිබඳ දැනුම |
| **වාණිජ, ව්‍යාපාර අධ්‍යයනය හා ගිණුම්කරණය** | | | | | |
| වයඹ පළාතේ අ.පො.ස (සා/පෙළ) වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ගුරු පුහුණු වැඩසටහන | ගුරුවරු 64 | දින 2 | 0.240 | | විෂයය දැනුම |
| බස්නාහිර පළාතේ අ.පො.ස (උ/පෙළ) ගණකාධිකාරී ගුරුවරු පුහුණු වැඩසටහන | ගුරුවරු 50 | දින 2 | 0.132 | | විෂයය දැනුම |
| **විෂය සමගාමී ක්‍රියාකාරකම් සහ විෂයය බාහිර ක්‍රියාකාරකම්** | | | | | |
| වෘත්තීය මාර්ගෝපදේශ වැඩමුළු | නිලධාරීන් 30 | එක් දින වැඩසටහනක් | 0.013 | | ඉදිරි වැඩසටහන් පිළිබඳ දැනුම |
| සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ වැඩසටහන් යටතේ ක්‍රියාත්මක පාසල් 250ක් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ ධාරිතා සංවර්ධන වැඩසටහන | නිලධාරීන් 35 | දෙදින වැඩසටහනක් | 0.218 | | වෘත්තීය මාර්ගෝපදේශය ක්‍රියාත්මක කිරීම |
| මනෝ සාමාජීය මෘදු කුසලතා ගුරු අත්පොත පිළිබඳ වැඩමුළුව | නිලධාරීන් 97 | දෙදින වැඩසටහන් 2ක් | 0.36 | | මනෝ සාමාජීය මෘදු කුසලතා අත්පත් කර ලීම |

| වැඩසටහන | පුහුණු කළ නිලධාරීන් ගණන | වැඩසටහන් කාලය | ආයෝජනය රු.මිලියන | | ළඟාකර ගත් දැනුම / ලබා දුන් පුහුණුව |
|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | |
| **පාසල් අධ්‍යාපනය බලගැන්වීම** | | | | | |
| පාසල් නගාසිටුවීමේ වැඩසටහනේ (EPSI) නිලධාරීන් පුහුණු කිරීම | නිලධාරීන් 158ක් | එක් දින වැඩසටහන් 8 | | 0.579 | සිසුන්ගේ මනෝසමාජීය කුසලතා සංවර්ධනය කිරීම පිළිබඳ දැනුම |
| මාර්ගගත 5 ශ්‍රේණි ශිෂ්‍යාධාර ගෙවීම් පුහුණු වැඩසටහන | නිලධාරීන් 40 ක් | වැඩසටහන් 1ක් | 0.120 | | මාර්ගගතව ශිෂ්‍යාධාර ගෙවීම පිළිබඳ පුහුණුව |
| **කළමනාකරණ හා ප්‍රමිති** | | | | | |
| ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳ ව විදුහල්පතිවරු දැනුම්වත් කිරීම | පළාත් 9 හා තෝරාගත් පාසල් 1000ක් විදුහල්පතිවරු | එක් දින වැඩසටහන් 9ක් | | 1.100 | අභ්‍යන්තර හා බාහිර ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳ පාසල් මට්ටමේ කාර්යයභාර්ය |
| අධ්‍යාපන ගුණාත්මක දර්ශකය 50% ට අඩු පාසල් සඳහා විශේෂ පුහුණුව | විදුහල්පතිවරු 35 | දින3 නේවාසික වැඩසටහනක් | | 0.174 | පාසලේ ගුණාත්මක බව ඉහළ නැංවීම |
| **අධ්‍යාපන විද්‍යාපීඨ කාර්ය මණ්ඩල බලගැන්වීම** | | | | | |
| විද්‍යාපීඨ පීඨාධිපතිවරුන්ගේ ධාරිතා සංවර්ධනය | පීඨාධිපතිවරු 20 දෙනෙකු | වැඩසටහන් 1 | 0.180 | | විද්‍යාපීඨ කළමනාකරණය |
| විද්‍යාපීඨ අධ්‍යයන කාර්ය මණ්ඩල තොරතුරු තාක්ෂණ පුහුණුව | කථිකාචාර්යවරු 40 | වැඩසටහන් 1 | 0.264 | | තොරතුරු තාක්ෂණ භාවිතය |
| සියලුම පීඨාධිපතිවරු හා උප පීඨාධිපතිවරුන්ගේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණය පිළිබඳ දැනුම්වත් කිරීම. | නිලධාරීන් 40 | වැඩසටහන් 1 | 0.089 | | අධ්‍යාපන ප්‍රතිසංස්කරණය |
| **ඩිජිටල් මාධ්‍ය භාවිතයෙන් ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආකර්ෂණීය ලෙස සංවර්ධනය** | | | | | |
| තොරතුරු සංනිවේදන තාක්ෂණ විෂයය නිලධාරීන් පුහුණු කිරීම. | නිලධාරීන් 46 | තෙදින වැඩසටහන් 1ක් | 0.46 | | අන්තර්ජාල සුරක්ෂිතතාව පිළිබඳ දැනුම |
| උතුරු මැද පළාතේ අ.පො.ස.(උ.පෙළ) තොරතුරු සංනිවේදන තාක්ෂණ විෂයය පිළිබඳ ගුරුවරුන් පුහුණුව | ගුරුවරු 74 | සිව් දින වැඩසටහන් 1ක් | 0.825 | | නව විෂයය නිර්දේශයට ඉගැන්වීම පුහුණු වීම. |
| පරිගණක දෘඩාංග ජාල කරණ විසඳුම් කණ්ඩායමේ නව සාමාජිකයන් පුහුණු කිරීම. | සම්පත් දායකයින් 77ක් | පස් දින වැඩසටහන් 2ක් | 0.784 | | පරිගණක දෘඩාංග ජාලකරණ පුහුණුව |

| වැඩසටහන | පුහුණු කළ නිලධාරීන් ගණන | වැඩසටහන් කාලය | ආයෝජනය රු.මිලියන | | ළඟාකර ගත් දැනුම / ලබා දුන් පුහුණුව |
|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | |
| **පාසල් හා අධ්‍යාපන ආයතන ඇගයීම් තුළින් ප්‍රමිතීන් හා ගුණාත්මකභාවය තහවුරු කිරීම** | | | | | |
| සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතියට තෝරා ගත් පාසල් 1000 විදුහල්පතිවරු ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳ දැනුම්වත් කිරීම. | විදුහල්පතිවරු 1000 | පළාත් 9හි එක් දින වැඩසටහන් 9ක් | 1.071 | | පාසල් අභ්‍යන්තර සහ බාහිර ඇගයීම් ක්‍රියාවලිය සඳහා පාසල් මට්ටමේ කාර්යභාර්ය පිළිබඳ දැනුම්වත් වීම. |
| අධ්‍යාපන ගුණාත්මක දර්ශකය 50% ට අඩු පාසල් 35ක විදුහල්පතිවරුන්ගේ ධාරිතා සංවර්ධනය | විදුහල්පතිවර් 35 | තෙදින නේවාසික වැඩසටහන් 1ක් | 0.174 | | අධ්‍යාපන ගුණාත්මක දර්ශකය ඉහළ නංවා ගැනීම සඳහා විවිධ ක්‍රමවේද හා උපායමාර්ග පිළිබඳ ව දැනුම්වත් කිරීම හා ප්‍රායෝගික අත්දැකීම් ලබා දීම. |
| **පාසල්, කලාප, පළාත් හා ජාතික මට්ටමේ අධ්‍යාපන පරිපාලන හා කළමනාකරණ ක්‍රියාවලිය** | | | | | |
| GEMP ව්‍යාපෘතියේ - විදේශ පශ්චාත් උපාධි ශිෂ්‍යත්ව පිරිනැමීම | නිලධාරීන් 06 | වසර 1 1/2 | | 14.342 | ශාස්ත්‍රපති,අධ්‍යාපනපති |
| පිරිවෙන් මාණ්ඩලික නිලධාරී ස්වාමීන් වහන්සේලා හා නිලධාරීන් සඳහා ධාරිතා සංවර්ධන | නිලධාරීන් 72 | වැඩසටහන් 1ක් | | 1.223 | මූල්‍ය කළමණාකරණය, භෞතික සම්පත් කළමණාකරණය |
| 2018/2019 වර්ෂවල පැවති BPP පාඨමාලාවේ විදුහල්පතිවරුන්ගේ පැවරුම්පත් පරීක්ෂා කිරීම සහ සම්පත් පුද්ගලයින් පුහුණු කිරීම සඳහා සැලසුම් කිරීම හා APP අන්තර්ගතය සාකච්ඡාව | | පැවරුම්පත් 3,480ක් පරීක්ෂාව | 2.413 | 1.653 | ශිෂ්‍ය හා ගුරු නායකත්වය. උපාය මාර්ගික නායකත්වය. අධ්‍යාපන නායකත්වය. සහභාගිත්ව තීරණ ගැනීම. |
| ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය හා අනධ්‍යයන සේවයේ නිලධාරීන් සඳහා වූ පුහුණුව | නිලධාරීන් 340 | දින 5ක වැඩසටහන් 3ක්<br>දින 3 වැඩසටහන් 1ක් | 0.040 | 1.242 | අධ්‍යාපන කළමණාකරනය හා පරිපාලනය,ප්‍රතිපත්ති විශ්ලේශණය,අධ්‍යාපන පර්යේෂන,උසස් තොරතුරු තාක්ෂණය. |
| **දත්ත කළමනාකරණ** | | | | | |
| ශිෂ්‍ය තොරතුරු පද්ධති පිළිබඳ කලාප පුහුණුකරුවන් හා සම්බන්ධීකරණ නිලධාරීන් පුහුණු කිරීමේ වැඩමුළුව | නිලධාරීන් 214 | පළාත් 7ක් එක්දින වැඩමුළු 7ක් | 0.334 | | ශිෂ්‍ය තොරතුරු පද්ධතියේ නව අයිතමයන් හා නව භාවිතයන් පිළිබඳ දැනුම හා කුසලතාව |
| **අධ්‍යාපන පර්යේෂණ තුළින් අධ්‍යාපන සංවර්ධනය** | | | | | |
| **අධ්‍යාපන පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව** | නිලධාරීන් 40ක් | මාස තුනක වැඩසටහන් 1ක් (පැය 108 ) | 1.120 | | අධ්‍යාපන පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ දැනුම |

# 07. පරිච්ඡේදය
# අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ / ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| **1.** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම) | අදාල නොවේ | | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම | අදාල නොවේ | | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම | අදාල නොවේ | | |
| 1.6 | වෙනත් | | | |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත් කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙනයාම. | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වා ගෙනයාම | අනුකූල වේ | | |
| **03.** | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම. | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම. | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරදි බලතල පවරා දී තිබීම. | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ / ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම. | අනුකූල වේ | | |
| **4.** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **5.** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල නොවේ | අමාත්‍යාංශයේ විෂය පථය විශාල බැවින් අදාළ තොරතුරු ලබා ගැනීමේ දී ඇතිවන ප්‍රමාදයන් මත නියමිත දිනට පිළිතුරු ඉදිරිපත් කිරීමට නොහැකි වන අවස්ථා ද ඇත. | |
| **6.** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2)DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම. | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම. | අනුකූල නොවේ | අමාත්‍යාංශයේ විෂය පථය පුළුල් බැවින් නියමිත කාලය තුළ පිළිතුරු නොසපයන අවස්ථා ද ඇත. ඒ සම්බන්ධයෙන් අදාළ අංශ දැනුවත් කර ඇත. | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණ වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **7.** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කලමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා ගෙන තිබීම. | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ / ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| **8.** | වත්කම් කළමනාකරණ කමිටු | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරන සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම. | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම. | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම. | අනුකූල වේ | | |
| **9** | වාහන කළමනාකරණය | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම. | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම. | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම. | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම. | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම. | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ / ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගනණය සඳහා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනිවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම. | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. (1)94 ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම් වලට එළඹීම. | අනුකූල නොවේ | | |
| **12** | **රජයේ නිළධාරින්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්වලට අනුකූල වීම. | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම. | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම. | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචන වර්ෂ අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම. | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම. | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ / ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම. | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම. | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම. | අදාළ නොවේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම. | අදාළ නොවේ | | |
| 15.3 | මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම. | අදාළ නොවේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම. | අනුකූල නොවේ | ප්‍රාථමික හා ද්විතියික මට්ටම්වල අතිරික්තයක් ඇත. | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලයිස්තු ලිඛිතව ලබා දී තිබීම. | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017ප්‍රකාරව සියලු වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම.** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙක් පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීක කර පවත්වා ගෙන යාම. | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම. | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම. | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් එ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍යා තීරණ / ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභි ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම. | අනුකූල නොවේ | සියලුම ශාඛා දැනුවත් කර ඇත.පාලන ශාඛාවේ සකස් කර ඇත.අනෙකුත් ශාඛා ද සකස් කරමින් ඇත. | |
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදයේ පරිදි, පුරවැසි/ සේවාලාභි ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම. | අනුකූල වේ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක0 2/2018 ඇමුණුම් 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම. | අනුකූල නොවේ | සකස් කරමින් පවතී. | |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | | |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කර ගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම. | අනුකූල නොවේ | 02/2018 චක්‍රලේඛයට අනුවසැකසිය යුතුය. දැනට වෙනත් කාර්ය සාධන පත්‍රිකා භාවිතා කරයි. | |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම. | අනුකූල වේ | | |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම. | අනුකූල වේ | | |

**කේ.එච්.එම්.කේ. දයානන්ද**
ගණකාධිකාරි (අභ්‍යන්තර විගණන)
අධ්‍යාපන ලේකම් වෙනුවට